

# සංවර සීල දීපනිය.

ශ්‍රී ලං: වි: ග්‍රන්ථමාලා අඞ්ක V

# සංවර සීල දීපනිය.

අලව්වේ
ශ්‍රී රාහුල පරිවෙණාධිපති ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ නිකායෙහි
විංශති වර්ගික කාරක සංඝ සභාශාසනගත
රාජකීය පණ්ඩිත
පල්ලේගම ශ්‍රී රතනාලඞ්කාර මහාස්ථවිර
පාදයන් වහන්සේ විසින්
සම්පාදිතයි.

පාණදුරේ
වලපොල ශ්‍රී සද්ධර්මෝදය පරිවෙණාධිපති
"ශාසන වංශ ධ්වජ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය"
අතිගෞරවාහී
කෝදාගොඩ උපසේනාභිධාන මහානායක
මාහිමියන් වහන්සේ විසින්
ප්‍රතිගෘහිතයි.

කොළඹ
විමුක්ති දේශනා සමිතියෙහි
ආර්. ඩබ්ලිව්. පෙරේරා සහ
එච්. එස්. පෙරේරා යන මහතුන්
විසින් ප්‍රකාශිතයි.

2482.

1938.

2481
—— අප්‍රියෙල් මස 23 දින
1938 ශ්‍රී සද්ධර්මොදය පිරිවෙණෙදී ය.

## මෙත් කුළුණු පෙරදැරිව ලියමි.

---

කොළඹ "විමුක්ති දේශක" සමිතියෙහි ආරාධනය පරිදි අපගේ ශිෂ්‍ය තැනක් වූ අලව්වේ ශ්‍රී රාහුල පාරිවේණාචාර්ය්‍ය **පල්ලේගම රතනාලඞ්කාර පණ්ඩිත** ස්ථවිර නම විසින් ලියන ලද **"සංවර සීල දීපනිය"** නම්වූ මෙම බණපොත මා වෙත සමර්පණය කරණ ලදුව සමාදර පූර්වකව පිළිගෙණ යථාවකාශ පරිදි කියවා බැලීමෙන්; ධර්මවිනයානුකූල කරුණු ඇතුලත් වූ යහපත් ග්‍රන්ථයක් බව වැටහීගිය හෙයින්; ඒබව මෙහි ප්‍රීතියෙන් සඳහන් කරණවත් හැර සැදැහැති ගිහි පැවිදි තැන් විසින් ආදරයෙන් පරිශීලනීය ග්‍රන්ථයක් බවද කියමි! තවද මෙම බණපොත මුද්‍රණය කරවා අප බෞද්ධයන් අතට පත්කිරීම ගැන මුදල් වියදම් කළාවූ ශ්‍රී සද්ධර්මප්‍රචාරක "විමුක්ති දේශක" සමිතිය කෙරෙහි ද අපගේ ඉමහත් සතුට මෙයින් ප්‍රකාශ කරමි.

මෙහිවගට, ශාසනස්ථිතිකාමී,

ආචාර්ය්‍ය. කො: උපසෙන ස්ථවිරයෙමි.

(අත්සන) උපසෙන.

# සංඥාපනය.

සංවර සීල දීපනිය නම් වූ මෙම ධර්ම පුස්තකය වනාහි කොළඹ **"විමුක්ති දේශක"** සමිතියෙහි ආරාධනයෙන් විනය ධර්මය නොදන සිටින ගෘහස්ථයන් අතර එය ප්‍රකට කිරීමෙන් ඔවුන් තුළ ශාසනධර්මය ගැන ගැඹුරු ප්‍රසාදයක් ඇතිකරවී ම පිණිස සැපයුණෙකි.

**"විනය ධර්මය ගෘහස්ථයනට ආවරණය වියයුතුය,,** යන ඇතැම් අයගේ ප්‍රකාශයෝ ධර්මවිනයට හාත්පසින් විරුඩ ව කියන හිස් ප්‍රලාපයෝය. සඳහිරු දෙදෙන ලොකයෙහි අනාවරණය වැ බබලන්නාක් මෙන් ම ධර්මවිනයදෙක ද අවිශෙෂයෙන් සා අතරත් ප්‍රකට ව පැවතිය යුතුබව බුදුන් වහන්සේ විසින් ම වදාළ හෙයිනි,

ඇතැම් දුසිල් මහණහු තමතමන්ගේ අශාසනික දුස්ප්‍රතිපත්ති ගෘහස්ථයන් අතර ප්‍රකටවුව හොත් එයින් ඔවුහු තමතමන් කෙරෙහි පිළිකුල් කෙරෙත් ය යි සිතා **"විනයධර්මය ගෘහස්ථයනට නොකිව යුතුය"** යි ප්‍රකාශ කෙරෙති! මෙයින් සිල්වත් භික්ෂූහු බොහෝ කරදරයට පැමිණෙති! ශාසන හානියක් සිදුවනු මිස එයින් ශාසනයට කිසිසේත් ම යහපතෙක් සිදු නොවෙ යි. එහෙයින් ගෘහස්ථයන් විසිනු දු හැකිනාක් විනය ධර්මය භාවිත කළයුතු යි. එයින් භික්ෂූහු ද බෙහෙවින් සංවරයට පැමිණෙති. ශාසනය ද බොහෝකලක් නිර්මල ව පැවැත්මට හේතුවන්නේය.

මේ කාලයෙහි ඇතැම් ගිහි පැවිදි පින්වත්හු බොහෝ ප්‍රයෝජනවත්වූ ද, කාලොචිතවූ ද, ධර්මශාස්ත්‍රිය පොත් පත් හා ප්‍රවෘත්ති පත්‍ර සඟරාදියෙහි සාරවත් වූ ලිපි ද සපයන අතර ඔවුනොවුනට ඇණුම් බැණුම් ද කියමින් ගරහති. නින්දා අපහාස මුඛයෙන් ද ලියති. බෙදයකි! හේ නොමැනවි! යම් යම් අයට ඇණුම් බැණුම් සහිත ව ලියන කියන ධර්මානුශාසනයෝ වැඩදායක නොවෙති.

කවරෙකුට නමුදු මින් දොෂාරොපණ මුඛයෙන් කරනු ලබන අනුශාසනයෙන් ඇතිවනුයේ අනෙකක් මිස එයින් රටට කිසිදු ප්‍රයෝජනයක් සිදු නොවන්නේ ය. පොෂ්‍යදායක මධුරාහාර පානාදියක් වුවද, ආමකාජවරාදියෙන් යුක්තාවූවෙක්හට එය විෂමවනු මිස ජීවිත වෘ[illegible]ට හේතු නොවන්නාක් මෙනි.

යමෙක් තමන් කරන අනුශාසනයෙහි පළමුකොටම තෙමේ පිහිටා තිශ්ශරණාධ්‍යාසයෙන් ඒ අනුශාසනය කෙරේ නම් එයින් තමන් නොකෙලසන බවත්, රටට ප්‍රයෝජන වන බවත්, ප්‍රාණවත් වූ ඒ වචන ඔවුනොවුන්ගේ සිත්වල කාවැදී අර්ථසාධක වන බවත් කාවිසිනු ත් සැලකිය යුතුය. තම අනුශාසනයෙහි තෙමේ නොපිහිටියේ නම් තදනුශාසනය ප්‍රාණවත් නොවන බැවින් ඔවුනොවුන්ගේ සිත්වල කාවැදීමෙහි අපොහොසත් වෙයි! එයින් සිදුවන ප්‍රයෝජනයෙක් ද නැත. තෙමේ ද අපහාස ලැබීමෙහි සුදුස්සෙක් වන්නේ ය. තමා කියන කරන දෙයෙහි පළමු කොට තමන් ම පිහිටී ම උත්තමයන්ගේ සිරිතෙකි.

බුඬාදී උත්තමයෝ කිසිවකුට ගරහන අදහසින් දෝෂාරොපන මුඛයෙන් කිසි දු ධර්මානුශාසනයක් නොකළෝ ය. තමන්වහන්සේලා නොකළ නොකරන දෙයෙහි මෙරමා පිහිටු වීමෙහි යත්න ද නොකළෝ ය. එහෙයින් ඒ ධර්මානුශාසනයෝ ලෝකාර්ථ සිද්ධියෙහි ලා අතිශයින් ප්‍රබලවූ හ.

"මේ කාලයෙහි කවුරුත් පාහේ ගිහිපැවිදි පින්වත් හු කියමින් ලියමින් බෙහෙවින් රටට අනුශාසනා කරන නමුදු තදනුශාසනයන් හි පිහිටා එය ක්‍රියාවෙහි යොදවන්නෝ ඉතා දුර්ලභයහ,,යි රටේ ඝොෂාවක් පැනනැගී තිබේ! එය එසේ ම බව කාරුණ්‍ය සැලකීමේ දී කාටත් වැටහෙනවා ඇත.

පිළිපැදියයුතු ධර්මප්‍රතිපත්ති විස්තර කොට රටට අනුශාසනා කළ යුතු ය. එයින් රටට ප්‍රයොජනයක් වනු ඒකාන්තය. එහෙත් එම ධර්මප්‍රතිපත්ති ක්‍රියාවෙහි යොදවන ගිහි පැවිදි උතුමන් දක්නට ලැබෙතොත් එය ම රටේ ගුණ ධර්මයන් වැඩි දියුණු වීමට හේතුවක් වන බවස්ථිර ව කියමු.

ශ්‍රව්‍යකාව්‍යය ට වඩා දෘශ්‍යකාව්‍යය අවලොකනය කරන මහජනයාගේ සිත්වල එය ස්ථිර ලෙස ඇදී පවත්නාක් මෙන් කනට ඇසෙන ධර්මානුශාසනයට වඩා තමතමන් කෙරෙහි ස්ථිර ව පෙනෙන්ට තිබෙන ප්‍රතිපත්තිධර්මයක් ඇතිවූව හොත් එය අසන දකින සියල්ලන්ගේ ම සිත්වල කාවැදී පවත්නා බව සත්‍යයෙකි. එහෙයින් මේ කාලයෙහි ශ්‍රව්‍යධර්ම සමායොගයට වඩා දෘශ්‍යධර්ම සමායොගය ම රටට අර්ථසිද්ධියක් ඇතිකරලීමෙහි සමර්ථවන බව කා අතරත් ප්‍රත්‍යක්ෂවිය යුතුය.

මෙහි අප විසින් ගිහි පැවිදි කිසි ම පින්වතෙකුට ඇණුම් බැණුම් ගැරහුම් සහිත එක වචනයකු දු නොයොදන ලදී. එසේ ම විවාද මූඛයෙහි පවත්නා කරුණු ගැන ද කිසිවක් නොලියන ලදී. අපේ සබ්‍රම්සරුන් වහන්සේලා විසින් නිතර පාලනය කරනු ලබන පිළිපදිනු ලබන ධර්මප්‍රතිපත්ති වැඩිවශයෙන් ඇතුළත් කොට නොගැඹුරු සිලුටු සියබසින් මෙය සපයන ලදී.

මෙම ධර්මපුස්තකය සම්පාදනය කිරීමෙහිදී අපට ඉතාප්‍රයෝජ-නවත් උපදෙශ රාශියක් ලබාදීමෙන් හිත වත් ව ක්‍රියාකළ ශ්‍රී සද්ධ-ර්මෝදය පරිවෙණාධිවාසී අපගේ ධර්මාචාර්ය ශ්‍රී ලඞ්කාරාමඤ්ඤනි-කායෙහි විංශති වර්ගික කාරකසංඝසභාශාසනගින අතිගරු පමුණුවේ බුද්ධදත්ත මහාස්ථවිර පාදයන් වහන්සේගේ විශෙෂ නියමය පරිදි සමන්තපාසාදිකා නම්වූ විනය අටුවාව, විශුද්ධි-මාර්ගය, ප්‍රපඤ්චසූදනී නම්වූ මැදුම්සඟි අටුවාව, සිඛවලඳ සහ සිඛවලඳ විනිස, භික්ෂු ශීලය යන මේ පොත්පත් ඇසුරු කොට මෙය සම්පාදනය කරනලදුවත් හැර එතුමන් වහන්සේ විසින් මාතර කිරින්දේ අරණ්‍ය සෙනාසනයෙහි වැඩවිසූ කාලයක ලියනලද "කර්මස්ථාන භාවනා සංග්‍රහය" නමැති මා ඇගි ධර්ම-සංග්‍රහයකු දු මෙහි පරිශිෂ්ට සංග්‍රහයක් වශයෙන් පොතේ අගට යොදා ඇත.

**මෙහි ඇතුළත්වූ ධර්ම නම්:—**

1. ද්විවිධ විනය,
2. එහි ප්‍රභෙද,
3. ප්‍රාතිමොක්ෂයෙහි ඇතුළත් ශික්ෂාපදයන්ගේ සංක්ෂෙප සිංහලානුවාදය,
4. සප්තාපත්තිස්කන්ධය,
5. සතරසංවර සීලය,
6. ආභිසමාචාරික භික්ෂු ප්‍රතිපත්තිය,
7. සාමණෙර ප්‍රතිපත්තිය,
8. ගෘහස්ථ ප්‍රතිපත්තිය,
9. දාන විභාගය හා එහි ආනිසංස,
10. දුශ්ශීල සෙවනයෙහි ආදීනව,
11. කර්මස්ථාන භාවනා සංග්‍රහය,
12. කායගතා සති භාවනාව යන මේ විසිතුරු ධර්ම මෙහි අන්තර්ගතවී තිබෙත්.

මෙම ධර්මපුස්තකය සියලු සැදැහැවත් ශාසනමාමක බෞද්ධ ස්ත්‍රී පුරුෂයන් විසින් එක්වන් පරිශීලනය කිරීමෙන් නියම ශාසනධර්මය මේය[illegible]ත්රුම් ගෙන යහපත් ගුණධර්මයනට

අවනත ව තමනුත් යථාධර්‍මයෙහි පිහිටීමෙන් ස්වර්‍ගාපවර්‍ග සම්පත් ප්‍රතිලාභයෙහි උත්සාහ දැරියයුතු සි.

මෙය මුද්‍රණාවස්ථාවෙහි මුද්‍රණීයපත්‍ර සමාලෝචනය කරදීම් ආදිය සඳහා වලපොළ ශ්‍රී සද්ධර්මෝදය පාරිවෙණික දම්පැල්ලේ ගුණසිරි භික්ෂු නමගෙන් ලැබුනු සහාය අපගේ පරිශ්‍රමලාඝවයට හේතු වූ බව කෘතඥතා පූර්‍වක ව සඳහන් කරම්හ.

කලක පටන් වර්‍ෂයක් පාසා කාලෝචිත ධර්‍මපුස්තකයන් මුද්‍රණය කරවා ලාංකික ගිහිපැවිදි භවතුන් අතර නොමිලයේ විසුරුවා හරිමින් රට ජාතිය ආගමය වෙනුවෙන් අගනා සේවයක් කරන්නාවූ ද මෙම ධර්‍මපුස්තකය සම්පාදනය කිරීමෙහි ලා අපව මෙහෙයවනලද්දාවූ ද ශ්‍රී ලංකා විමුක්ති දේශක සමිතියෙහි ශාසනමාමක උද්‍යොගවත් සකල සාමාජිකයන් වෙත ද අප අදහස් අයුරු කලට වේලාවට මෙය මුද්‍රණය කරදුන් පාණදුරේ ශිල්පාලංකාර යන්ත්‍රාලයෙහි සේවක මණ්ඩලය වෙත ද අපගේ සතුති පූර්‍වක කෘතඥතාවය දයාවෙන් පිරිනමම් හ.

තවද මෙම ධර්‍මපුස්තකය සැපයුණේ නොයෙක් අනවකාශ කර්‍මමධ්‍යයෙහිය. පොත ප්‍රසිද්ධ කළ යුතු කාලය ද ආසන්නවූයෙන් මුද්‍රණකාර්‍යය ද කැරුණේ ඉතා ඉක්මනින් ය. මේ හේතුකොටගෙන වර්‍ණ වින්‍යාසාදී යම් යම් ඛලිතස්ථාන මෙහි ඇතිවිය හැකි වුව ද එයින් යථාර්‍ථාවබොධයට බාධාවක් නොවන්නේය.

එහෙත් මෙහි වර්‍ණයෝජකයන්ගේ බලවත් ප්‍රමාදයකින් 40 වන පිටුවේ අග "රාත්‍රියෙහි =පෙ= නොසැලී"- යන පේළි පසකින් යුත් වාක්‍යය වැරදී වැටී තිබේ. එය එතනට අනවශ්‍ය බවත් 42 වන පිටුවෙහි එය සඳහන්වන බවත් කරුණාවෙන් සැලකිය යුතුයි.

මා ලාභ සක්කාර සිලොක කාමා
භවන්තු! සබ්බ යතයො ජිනත්‍රජා
සුපෙසලා සන්ත නිවාත වුත්තිනො
සික්ඛාරතා හොන්තු! සදා සගාරවා.

පල්ලේගම සිරි රතනාලංකාර ස්ථවිර.

2482/1938 මැයි මස 13 දින
අලව්වේ
ශ්‍රී රාහුල පිරිවෙණ දී ය.

# සංවර සීල දීපනිය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!**

සබ්බාසවා සෙස කිලෙසනාස නිං
නත්වා සසද්ධම්මගණං මහා මු නිං
සභාසයා සාධු හිතප්පසාධ නිං
තනෝම ‘හං සංවර සීල දීප නිං

ශ්‍රී ශාක්‍ය මුනීන්ද්‍ර භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් සතවෙත පතළ මහකුළුණු සිතින් විනෙදනන් මන කුමුදු පොබයමින් දෙසන ලද ආඥා සම්මුති පරමාර්ථ දෙශනා ත්‍රය අතුරෙන් ආඥා දෙශනා සංඛ්‍යාත විනය පිටකය ශාසන ධර්මයාගේ චිරස්ථිතිය (=බොහෝ කලක් පැවැත්ම) පිණිස හේතුවන්නේය.

‘‘**විනයෙ ඛො පන ඨිතෙ සාසනං ඨිතං හොති**’’ යන්නෙන් ඒ බව පැහැදිලි වෙයි. විනය ධර්මය භික්ෂු භික්ෂුණීන්ගේ ප්‍රතිපත්ති වර්ධනයට ඉවහල් වතු දු උපාසක උපාසිකා දෙපිරිසගේ සහයොග යෙක් නැති වැ එය නගා සිටු විය නො හැකි ය. භික්ෂූන් අතර ප්‍රතිපත්ති වර්ධනය ඇති වන්නේ යටකී දෙපිරිසගේ සහයොගය ලැබීමෙන් යැ.

භික්ෂූන්ට කැප සරුප් පිරිදි ප්‍රත්‍යය පහසුව සැලසීම ප්‍රති පත්ති පාලනයෙහි මහොපකාරී වෙයි. ගෘහස්ථයන්ගේ එවැනි කාරුණික සම්බන්ධ කමක් ඇතිවීමට හේතුවනුයේ ඔවුන් විසින් සැදැහැයෙන් ශාසනාලය උපදවා නිස්සරණාධ්‍යාශයෙන් විනය ධර්මය ප්‍රගුණ කර ගෙන සිටීම යැ. මෙසේ සලකා බලන විට භික්ෂු ප්‍රති පත්තිය නගා විදහා දක්වන විනය ධර්මය උපාසක උපාසිකාවන් විසිනු දු ශාසනික දයාවෙන් උගත යුතු බව වැට හෙනු නො අනුමාන ය.

‘‘**විනය**’’ යන්නෙන් අදහස් කරනුයේ ශික්ෂණය (=හික්මීම) යන අර්ථය යි. කවද– ’ නම් ිසතාර විසින් මෙසේ දක්වා තිබේ:

"විවිධ විසෙස නයත්තා- විනයතො චෙවකාය වාචානං
විනයත්ථ විදූහි අයං- විනයො විනයොති අක්ඛාතො" යි

මෙහි අදහස මෙසේයි :-

පස් වැදෑරුම් පාමොක් උදෙස්, පරිජි ඈ සත් ඇවැත් කඳු, මාතෘකා විභඞ්ග මේ ඈ නන් වැදෑරුම් ක්‍රම ඇති බැවින් හා දැඩි කරනු ලිහිල් කරනු වස් පසුව පණවන ලද අනුප්‍රඥප්ති සංඛ්‍යාත විශේෂ ක්‍රම ඇති බැවින් ද, කය වචන දෙකින් කෙරෙන දෝෂාපරාධයන් වළක්වා ඒදෙක හික්මවන හෙයින්ද මේ "විනය" නමැයි කියන ලදී යනුයි.

මෙයින් විවිධවූ ද, විශෙෂවූ ද, නොයෙක් ක්‍රම ඇති කය වචන දෙක මනාකොට හික්ම වන්නා වූ "නීති ධර්ම සමූහය" තෙමේ විනය ධර්මයැයි හඳුන්වනු ලැබේ.

මෙහි ලා ග්‍රන්ථනාමයෙන් දක්වෙන සංවරය ද, ශීලය ද කය වචන දෙක හික්මවීමෙහි උපකාරවූ ධර්මයෝ යැ එහෙයින් ඔවුහු විනය නම් වෙත්. ඒ විනය එක් ක්‍රමයෙකින්

1 සංවර විනය,
2 පහාණ විනයැයි ද්විප්‍රකාර වේ. එයින්

සංවර විනය තෙමේ

1 සීලසංවරය,
2 සති සංවරය,
3 ඤාණ සංවරය,
4 ඛන්ති සංවරය,
5 විරිය සංවරය යි පස් වැදෑරුම් වේ.

එහි සීල සංවරය නම් ප්‍රාතිමොක්ෂ සංවර ශීලය යි මෙහිදු:-

1 ප්‍රාතිමොක්ෂය,
2 සංවරය,
3 ශීලයයි වචන තුනෙකි.

1. ප්‍රාතිමොක්ෂය වනුයේ ශික්ෂාපද ශීලය යි, යමෙක් ඒ සිකපද ශීලය රකින්නේ නම්, ඔහු සතර අපායාදී දුකින් ද ආත්මානුවාදදී භයින්ද මුදවයි. එහෙයින් ප්‍රාතිමොක්ෂ නම් වේ.

2. කය වචන දෙක හික්මවීම පිණිස පණවා වදාළ සිකපද නො ඉක්මවීම සංවරය යි.

කාය වාක් මනො කර්‍මයන්ගේ එකඟ බව හෙවත් එකම ධර්‍මයෙකැ ඔවුන් නොවිසිර පවත්නා බව හෝ කුශල ධර්‍මයන්ගේ පිහිටීමට ආධාරවූ ධර්‍මය හෝ ශීල නම්වේ, ප්‍රාතිමොක්ෂය මැ අවිශෙෂයෙන් සංවරයයි ගැනිණි.

මෙසේ ගැනීමෙන් ප්‍රාතිමොක්ෂ සංවරය පිළිබඳ ශීලය, ප්‍රාතිමොක්ෂ සංවර ශීලය,යි දක්නා ලැබේ. මෙය භික්ෂූන් පිළිබඳවැ පවත්නා බැවින් භික්ෂු ප්‍රාතිමොක්ෂ සංවර ශීලයැයි ද, භික්ෂු ප්‍රතිපත්ති ශීලයයිද කිව යුතුයැ. හේ

1 චාරිත්‍ර ,

2 වාරිත්‍ර ශීල විසින් දවි ප්‍රකාර වේ.

1. බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ මේ දෙය කටයුතුයයි පැණවූ සිකපද පිළිගෙන ඊට පිළිපැදීම චාරිත්‍ර ශීලයයි.

2. වාරිත්‍ර ශීලය නම්:- මේ මේ දෙය නොකට යුතුය යි පැණවූ සිකපද නො ඉක්මවා ආරක්ෂා කෙරෙමින් පිළිපැදීමයි.

1 ආභිසමාචාරික,

2 ආදි බ්‍රහ්මචරියකසීල වශයෙනු දු ප්‍රාතිමොක්ෂ සංවර ශීලය දෙවැදෑරුම් වේ.

1 අභිසමාචාරය-ශ්‍රෙෂ්ඨ හැසිරීම අරහයා පණවන ලද කුඩුවත් අයත් කුඩානු කුඩා සිකපද සපුරා පැවැත්ම ආභිසමාචාරික සීලයයි ආජීවට්ඨමක ශීලයෙන් අවශෙෂවූ ශීලයට මේ නමෙකි.

2 භික්ෂු-භික්ෂුණී යන උභතො විභඞ්ග පරියාපන්නවූ සිකපද සපුරා පැවැත්ම, මාර්‍ග බ්‍රහ්මචර්‍ය්‍යාවට ආදියෙහි වූ හෙයින් ආදි බ්‍රහ්මචරියක ශීලය නම් වේ. සුපරිශුද්ධ කාය කර්‍ම - වාක් කර්‍මයන්ගේ සම්බන්ධයෙන් සම්‍යගාජීවය අට වැනි කොට යෙදුණු ශීලයකි මේ. හෙවත් ආජීවට්ඨමක ශීලයයි.

ශික්ෂාපද ශීලය ප්‍රාතිමොක්ෂ සංවරයාගේ ම නාමාන්තරයෙකැයි යට කියැවුණු බැවින් සිකපද දැක්වීමෙන්ද, ප්‍රාතිමොක්ෂ-සංවර ශීලය විස්තර කරනු ලැබේ.

ඔව්හු (සිකපද) ස්කන්ධ වශයෙන් (සමූහ) රාශි වශයෙන් සත් කොටසෙකි.

එනම් :- 1 පාරාජිකා පත්ති සකන්ධය,
2 සංඝාදිශෙෂා පත්ති සකන්ධය,
3 ථුල්ලච්චයා පත්ති සකන්ධය,
4 පාචිත්තියා පත්ති සකන්ධය,
5 පාටිදෙශනීයා පත්ති සකන්ධය,
6 දුෂ්කෘතා පත්ති සකන්ධය,
7 දුබ්භාෂිතා පත්ති සකන්ධය කියාසි.

මෙයට සප්තා පත්ති සකන්ධය යි කියනු ලැබේ. එහි

(1) පාරාජිකා පත්ති සකන්ධය කවරේදයත්:-

1 මිනිස් අමිනිස් තිරිසනුන්ගේ තුන් මගෙහි සෙවුනා කැමැති හිතින් තමා නිමිත්ත මෙහෙයීමෙන් සිදුවන මෙවුන්දම් පරිජි ඇවතද,

2 අන් මිනිසක්හු අයත් පාදයක් (ශත 75 ක්) අගනා වස්තුවක් සොරසිතින්ගැනීමෙන් සිදුවන අයිනාදන් පරිජි ඇවතද,

3. මව් කුසැ පටන් මිනිස් සතකු මරණු කැමැති සිතින් දිවිතොර කිරීමෙන් සිදුවන මිනිස් විගහ පරජි ඇවතද.

4. තමා කෙරෙහි නැති උතුරු මිනිස් දහමක් අන් මිනිසක් හට බුහුමන් කැමැති හිතින් සෘජුව කීමෙන් (හා ඔහු එකෙණෙහි දැනීමෙන්ද) සිදුවන උතුරු මිනිස්දම් පරිජි ඇවතද යන මේ සතර **පාරාජිකා පත්ති සකන්ධය යි.**

(2) සඞ්ඝාදිශෙෂා පත්ති සකන්ධය කවරේදයත්:

1. සුක්‍ර මොචනය කරනු කැමති සිතින් සවප්නයෙන් හැර ආධ්‍යාත්මික බාහිර වස්තුවෙක්හි තමා පුරුෂව්‍යඤ්ජනය සටා සුකුරු මිදවීමෙන් සිදුවන (සුක්ක විසට්ඨි) සඞ්ඝාදිසෙසය ද,

2. කාය සංසර්ග රාගයෙන් මනුෂ්‍ය ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රියක යන සංඥ ඇතිවැ සිරුරු පහස විඳි යටි සිතින් සිරුරෙන් සිරුර හැපීමෙන් සිදුවන (කාය සංසග්ග) සඞ්ඝාදිසෙසය ද,

3. නො සරුප් බස් කියනු කැමැති රාගයෙන් මනුෂ්‍ය ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රියක යන සංඥා ඇතිවැ අධො මාර්ග-මූත්‍ර මාර්ග මෛථුන ධර්මයන් අරභයා දුටුල් වදන් කීමෙන් සිදුවන (දුට්ඨුල්ල වාචා) සඞ්ඝාදි සෙසයද,

4. මෛථුන රාගයෙන් මනුෂ්‍ය ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රියක යන සංඥා ඇතිවැ තමහට මෛථුන ධර්මයෙන් මෙහෙකිරීමෙහි ගුණ කීමෙන් සිදුවන (අත්තකාම පාරිචරියා) සංඝාදිසෙසය ද,

5. මිනිස් ලියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ කෙලෙස් ඇසුරු කොට කියන ලද හසුන් පිළිගෙන පරහට දන්වා යළිත් ගෙනවුත් දන්වාලීමෙන් සිදුවන (සංචරිත්ත) සංඝාදිසෙසය ද.

6. කාරවාදෙන දායකයකු නැතිවැ සුගත් වියතින් දිග දොළොස් වියතකටද, පළල සත් වියතකටද අධිකවූ විහාරයක්, තමන්ගේ විසීමට කුටි වස්තු නොදෙසා කිරීමෙන් සිදුවන (කුටිකාර) සඞ්ඝාදිසෙසය ද,

7. කරවා දෙන දායකයකු ඇති කල යථොක්ත ප්‍රමාණයට වඩා මහත්කොට ගත හැකි වුව ද, විහාර වස්තු නොදෙසා කර වීමෙන් සිදුවන (මහල්ලක විහාර කාරාපන) සංඝාදිසෙසය ද,

8 දූකීම්, ඇසීම්, සැක කිරීම් රහිතවැ උපසපන් මහණකු සස්නෙන් පහ කරවනු කැමැති සිතින් අ මූලිකවූ පරිජි ඇවතකින් ඔහු හමුවෙහි චොදනා කිරීමෙන් සිදුවන (අමූලික චොදනා) සංඝාදිසෙසය ද.

9 උපසපන් මහණකු සස්නෙන් පහ කරවනු කැමැති සිත් ඇතිවැ එළු-බැටලු ආදී අනෙකෙකුගේ මෛථුන සංසර්ගයක් දැක ඒ ලෙසය ගෙන පරිජි ඇවතකින් ඔහු හමුවෙහි චොදනා කිරීමෙන් සිදුවන (කිඤ්චිදෙස ලෙස) සංඝාදිසෙසය ද, යන මේ විකුම් කොණෙහි හෙවත් එම බුඩ ප්‍රඥපතිය ඉක්මවාලූ කොණෙහි සිදුවන සඟ වෙසෙස් ඇවැත් නවය ද.

10. සමගි සඞ්ඝයාගේ බිඳීමට උත්සාහ කරන භික්ෂුහට එය අත් හරවනු පිණිස සෙසු භික්ෂූන් විසින් තුන්වර දක්වා අවවාද කරත්මැ එය නොහරී නම්, තුන්වර දක්වා සමනුභාෂණ කර්මය කළ යුතුය. එය කරනතාක් (භෙදොත්සාහය) නොහැර සිටීමෙන් සිදුවන (සඞ්ඝභෙද) සංඝාදිසෙසය ද,

11. එම භික්ෂුවට අනුවර්තක භික්ෂු ගණයාට එසේම සංඝයා විසින් අවවාද කරත්මැ නොහරනේ නම් තුන් වර දක්වා සමනුභාෂණ කර්මය කළ යුතුය. එය කරනතාක් (භෙදානුවර්තිත්වය) නොහැර සිටීමෙන් සිදුවන (සංඝභෙදානුවත්තක) සංඝාදිසෙසය ද,

12 යම් භික්ෂුවක් දුර්වච ස්වභාව ඇතියේ භික්ෂූන් විසින් ප්‍රස් වැදූරුම් පාමො[illegible] උ[illegible] ඇතුළත් කිසියම් සිකපදයෙකින්

අවවාද කරනු ලබනුයේ තමනට අවවාද දීම ප්‍රතික්‍ෂෙප කෙරෙයිද? ඒ භික්‍ෂුහට සෙසු භික්‍ෂූන් විසින් ඒ දුවච බැව් දුරලනු පිණිස තුන්වර දක්වා අවවාද දෙත්මැ එය නොහරනේ නම් ඉන්පසු තුන්වර දක්වා සමනුභාෂණ කර්‍මය කළයුතුය. එය කරනතාක් (අවචනීයභාවය) නොහැර සිටීමෙන් සිදුවන (දුබ්බච) සංඝාදීසෙසයද,

13 දායකාදීනට මල් පල ඈ දීමෙන් කුලදූෂණය කරන පවිටු හැසුරුම් ඇති මහණහු සෙසු මහණුන් විසින් වෙහෙරින් බැහැර කරනු පිණිස කරුණු කීයත් මැ භික්‍ෂූහු (ඡන්‍දාදියෙන් අගතියට යෙති යි) කියාතම් ඒ දෙස් කීම බැහැර කරවනු පිණිස තුන්වර දක්වා අවවාද කරත් මැ (ඒ කීම) නොහර නේ නම් ඉන් පසු තුන්වර දක්වා සමනුභාෂණ කර්‍මය කටයුතු යැ. එය කරන තාක් ඒ කීම නොහැර සිටීමෙන් සිදුවන (කුලදූසක) සංඝාදිසෙසය ද,

යන මේ තුන්වන සමනුභාෂණ කර්‍මයාගේ අවසානයෙහි සිදුවන සඞ්ඝාදි සෙසාපත්ති සතර ද, (රට දැක්වුණු නවයද) යන තෙළෙස **සඞ්ඝාදි සෙසාපත්ති ස්කන්ධයයි.**

(3.) ථුල්ලච්චයාපත්ති ස්කන්ධය කවරේද යත්:

1. අදත්තාදානාදි පාරාජිකාපත්තීන්ගේ ද, සුක්ක විස්සට්ඨි ආදී සංඝාදි සෙසාපත්තීන්ගේ ද සමීපාපත්ති වශයෙන් සිදුවන ථුලසි ඇවැත් ද,

2. ප්‍රථම පාරාජිකාපත්ති සහිත එකී ආපත්තීන්ගේම අඞ්ග අසම්පූර්ණ වීමෙන් සිදුවන්නාවූ ථුලසි ඇවැත්ද,

3. **“ඉති පඤ්චහි රාසීහි– පඤ්ච නිම්මල ලොචනො**
**පඤ්චවීස විධං නාථො– ගරු භණ්ඩං පකාසයි”, යි**

දක්වන ලද 1. ප්‍රථම රාශියවූ වෙහෙර හා වෙහෙර වතු ද 2. දෙවන රැසවූ අරම් හා අරම් වතු ද, 3. තුන්වන රැසවූ ඇඳ, පුටු කොට්ට, මෙට්ටද, 4. සතර වන රැසවූ ලොහොසැළි, ලොහො කටාරම්, මහලොහොසැළි, ලොහො කළගෙඩි, කෙවේරි මහවෑ, පොරෝ, උදලු තියත් යන මේ දෑය ද, 5. පස්වන රැසවූ වේවැල් ආදි වැල් ද, හුණ, බට ආදිය ද, ඉළුප් ආදි ගෙවල් සෙවිලි කරන තණද, තල්කොළ, තල කොළ ආදි කොළ වර්ග ද, මුදුතණ බබුස්තණද, මැටි ද, ලී බඩු හා මැටි බඩුද, යන මේ පස් රැසින් දැක්වුණු පස්විසිවැදෑරුම් වූ සඟ සතුකොට දෙන ලද්දාවූ හෝ සඟසතු බිම උපන්නාවූ හෝ ගරු භාණ්ඩයන් බෙදාගන්නාවූ හෝ මෙර මාහට දෙන්නාවූ හෝ මහණහුට සිදුවන ථුලසි ඇවැත් ද,

4. මිනීමස් බුදීමෙන් සිදුවන ථුලසි ඇවත ද,

5. ලිඬ්ගච්ඡෙදනයෙන් සිදුවන ථුලසි ඇවත ද,

6. නීතණ, තියඳ, වැහැරි පුවරු යන මෙයින් ගොතා කළ සිවුරු ද, මහ මූහුණු පියාපත් ගොතා කළ සිවුරු ද මිනිස් කෙස් වලින් හා අස් රෝම වලින් කළ සිවුරුද, අඳුන් දිවිසම්ද, යන මෙකී සිවුරු හැඳීමෙන් හා පෙරවීමෙන් සිදුවන ථුලසි ඇවැත් ද,

7. එක සීමාව තුළ භෙද අදහසින් පෝය පවාරණාදිය කිරීමෙන් සිදුවන ථුලසි ඇවැත් ද යනාදී ආපත්තීහු, **ථුල්ලච්චයා පත්තිස්කන්ධයයි.**

4. පාචිත්තියා පත්තිස්කන්ධය කවරේද? යත්:

— සමතිස් නිසඟි පචිති. —

1. අධිෂ්ඨාන විකල්පනය නොකොට අකාලචීවරය දස දවසකට වැඩි කලක් තබාගැනීමෙන් සිදුවන (අතිරේක චීවර-ධාරණ) නිසඟි පචිතිය ද,

2. භික්ෂු සම්මුතියක් නැතිවැ කඨිනොද්ධාරය කළ කල්හි සංඝාටි ආදි නාමයෙන් ඉටනලද තුන් සිවුරෙන් එක් අරුණ-කුදු වෙන්වැ විසීමෙන් සිදුවන (චීවරවිප්පවාස) නිසඟි පචිතිය ද,

3. කඨින නො අතුලේ නම් ඉල්මාසය හැර සෙසු මාසයන්හිද, හේ අතුලේ නම් ඉල් උඳුවප් දුරුතු නවම් මැදින් යන පස් මස හැර අනෙක් මාසයෙක්හි ද, උපන් බොමා කොසෙයාාදි කැප සිවුරු පිළියක් පිළිගෙන ප්‍රත්‍යාශාව ඇතිව ද මසකට වඩා කලක් තබාගැනීමෙන් සිදුවන (අකාලචීවරගහණ) නිසඟි පචිතියද,

4. නොනෑ මෙහෙණක ලවා පැරණි සිවුරක් සේදවීම හෝ පඬුපෙවීම හෝ ඇපිල්ලවීම හෝ කරවීමෙන් සිදුවන (පුරාණ චීවර ධොවාපන) නිසඟි පචිතිය ද,

5. හුවමාරු කිරීමක් හැර නොනෑ මෙහෙණක අතින් සිවු-රක් පිළිගැනීමෙන් සිදුවන (පාරිවට්ටක) නිසඟි පචිතිය ද,

6. සොරුන් විසින් සිවුරු පැහැරගත් කාලය ද, ගිනි ආදිය-කින් සිවුරු විනාශ වූ කාලය ද යන මේ සිවුරක් ඉල්වා ගැනීමට යොග්‍ය වූ කාලය හැර නොනෑ නොපැවරූ ගිහියකු අයත් සිවුරු ඉල්වා ගැනීමෙන් සිදුවන (චීවර විඤ්ඤත්ති) නිසඟි පචිතිය ද,

7. එබඳු සුදුසු කාලයෙක ඉල්වීමෙන් නොනෑ නොපැවරූ ගිහියන් විසින් බොහෝ සිවුරු දෙනු ලබන්නාහු නම් එයින්

අඥාතයකට පොරෝණයකට වඩා ගැනීමෙන් (සිදුවන තතුත්තරි සාදියන) නිසගි පචිතියද,

8. නොනෑ නොපැවරූ ගෘහපතියකු විසින් තමන්ට දීමට සූදානම් කරන ලද සිවුරුමිලය පිළිබඳ සිවුරෙහි සොඳුරුබැව්, මාහැඟි බැව් සලකා (මෙපමණ දිග පළල ඇත්තක් වේවා යනාදීන්) අධික විධානයට පැමිණ සිවුර ලැබීමෙන් සිදුවන (අප්පවාරිත) නිසඟි පචිතිය ද,

9. ගැහැවි ගිහිණි දෙදෙනකු විසින් එසේ සැපැයුණු සිවුරු මිලයෙහි අධික විධානයට පැමිණ, එක් සිවුරක් ලැබීමෙන් සිදුවන (දුතිය අප්පවාරිත) නිසගි පචිතිය ද,

10. රජ ඇමති ආදි කෙනෙකුන් විසින් භික්ෂුවක්හට යවන ලද සිවුරු මිලයෙන් භික්ෂුවගේ දැක්වීමෙන් මිල ලැබූ ආරාමිකාදි වතාවත් කරුවකු විසින් නිපදවන ලද චීවරය තුන් වාරයකින් මතු "ඇවැත්නි! මට සිවුරෙන් ප්‍රයෝජනය"යි සිහිකරවා හෝ සවරෙකින් මතු උදෙසා සිට හෝ ලබා ගැනීමෙන් සිදුවන (රාජ) නිසගි පචිතිය ද,

11. කොසෙය්‍යනූල් මිශ්‍රකොට හිඳීම සැතපීම පිණිස ඇතිරියක් කරවීමෙන් සිදුවන (සන්ථත) නිසගි පචිතිය ද,

12. අන්‍යවර්ණයකින් අමිශ්‍ර කළු එළුලොම්වලින් එබඳු ඇතිරියක් කරවීමෙන් සිදුවන (සුද්ධසන්ථත) නිසගි පචිතිය ද,

13 අමිශ්‍ර කළුඑළුලොම් දෙභාගයක් හා සුදු එළුලොම් භාගයක්ද, කිඹුල්වන් එළුලොම් භාගයක්ද, නොගෙන අන්‍යවර්ණ මිශ්‍ර කළු එළුලොම් ඇතිරියක් කරවීමෙන් සිදුවන (තවසන්ථත) නිසගි පචිතිය ද,

14. ඇතිරිය ක් කළ තැන් පටන් සාවුරුද්දකින් මෙපිට සඞ්ඝසම්මුතියක් නැතිවැ අනෙක් ඇතිරියක් කරවීමෙන් සිදුවන (අනුවස්සික සන්ථත) නිසගි පචිතිය ද,

15. අලුත් හිඳින ඇතිරියක් කරවන මහණහු විසින් පැරණි ඇතිරියෙන් සුගත් වියතක් පමණ කොටසක් නොගෙන අලුත් හිඳිනා ඇතිරියක් කරවීමෙන් සිදුවන (පුරාණ සන්ථත) නිසගි පචිතිය ද,

16 ගෙනයන්නකු නැතිකල්හි ද තුන් යොදුනකින් මත්තෙහි එළු ලොම් ගෙනයාමෙන් සිදුවන එළක ලොම හරණ නිසගි පචිතිය ද,

17 නොනෑ මෙහෙණක ලවා එළු ලොම් සේදවීමෙන් ද, රැඳවීමෙන් ද, අවුල් හැරවීමෙන් ද, සිදුවන (එළක ලොම ධොවන) නිසගි පචිතිය ද,

18 රන් රිදී මසු කහවනු පිළිගැනීමෙන්ද, අනුන් ලවා ගැන්වීමෙන් ද, තමාවෙත එළවා තබන ලද්ද පිළිකෙව් නොකොට සිතින් ඉවසීමෙන්ද, සිදුවන (රූපිය පටිග්ගහණ) නිසගි පචිතිය ද,

19. නන් වැදෑරුම්වූ රන් රිදී මසු කහවණු ගනුදෙනුවට පැමිණීමෙන් සිදුවන (රූපිය සංවොහාර) නිසගි පචිතිය ද,

20 පස් සඟ දූමියන් සමග මිස (මව්පියන් සමග වුවද) කැප වස්තූන් පිළිබඳවැ පවා නන්අයුරු හුවමාරුවට පැමිණීමෙන් සිදුවන (කය වික්කය) නිසගි පචිතිය ද;

21. නො ඉටූ නොවිකපූ පමණින් යුත් පාත්‍රයක් දස දවස කට වඩා කල් තබාගැනීමෙන් සිදුවන (පත්ත නිදහන) නිසගි පචිතිය ද,

22 පිළියම් පසකට අඩුවූ පාත්‍රයක් ඇතිවැ අනෙක් අලුත් පාත්‍රයක් ඉල්වා ගැනීමෙන් සිදුවන (ඌන පඤ්ච බන්ධන) නිසගි පචිතිය ද,

23 වැළඳිය යුතු ගිතෙල් වෙඬරු තලතෙල් මීපැණි උක්-සකුරු යන පඤ්චවිධ බෙහෙත් පසය පිළිගෙන සත් දවසකට වඩා තබා ගැනීමෙන් සිදුවන (භෙසජ්ජ නිදහන නිසගි) පචිතිය ද,

24 ග්‍රීෂ්ම ඍතුව පිළිබඳ අන්තිම මාසයෙන් මෙපිට වැසි-සළු සෙවීමෙන් අඩමසෙකින් මෙපිට ඉටා හැඳගැනීමෙන් සිදුවන (වස්සික සාටික) නිසගි පචිතිය ද,

25. උපසපන් මහණකුහට සිවුරක් දී නැවත කිපී සිත් ඇතියේ නොසතුටු වැ තමන් අයත්සේ දැන එය කඩා ගැන්මෙන් හෝ කඩවා ගැන්මෙන් හෝ සිදුවන (අච්ඡින්දන) නිසගි පචිතියද,

26. නොනෑ නොපැවරූ ගිහියන් අයත් නූල් ඉල්වා පෙහෙ-රන් ලවා විකපුන් පොහෝනා සිවුරක් වියවා ගැනීමෙන් සිදුවන (සුත්ත විඤ්ඤත්ති) නිසගි පචිතිය ද,

27. තමා උදෙසා නොනෑ නොපැවරූ ගැහැවියකු විසින් සිවුරක් වියවත් මැ පෙහෙරන් කරා එළඹැ (දිග පුලුල ඇතියක් හා ඝනකම් ආදිය ඇතියක්ද කරව්)අපිදූ එයට කිසිවක් දෙන්නෙමූ යි

අධික විධානයෙන් නූල් වැඹිකොට කරවන ලද සිවුර ලැබීමෙන් සිදුවන (තන්තවාය) නිසඟි පචිතිය ද,

28. පෙරවස් වැස පවාරණයට දස දවසක් තිබියදී දෙනලද ඉක්මන් සිවුර පිළිගෙන නොඉටා නොවිකපා චීවර කාලය ඉක්ම වීමෙන් සිදුවන (අච්චේක චීවර) නිසඟි පචිතිය ද,

29. පෙරවස් වැස පවාරණය කොට ඉල්මස තුළ ඉටු තුන් සිවුරෙන් එකක් ඇතුළු ගම තබා සැක සහිත ප්‍රතිභය සහිත අරණ්‍යසෙනාසනයෙහි වසන භික්ෂුහට දසදිනකට වඩා ඒ සිවුරෙන් වෙන් වැ විසීමෙන් සිදුවන (ඡාරත්ත විප්පවාස) නිසඟි පචිතිය ද,

30. සංඝයාට පිරිනමනලද චීවරාදී ලාභයක් දැනදැන තමන් වෙත පිරිනැමීමෙන් සිදුවන (අත්තුපරිණාමන) නිසඟි පචිතිය ද, යන මෙකී සමතිස් ඇවැත්හු (වස්තු නිස්සර්ජන සඞ්ඛ්‍යාත නිස්සග්ගිය විනය කර්‍ම සහිත හෙයින්) නිසඟි පචිති නම් වෙති.

---

## දෙ අනූ සුද්ධ පචිති.

1. වංචා කරනු කැමති වැ දැනදැන බොරුකීමෙන් උපසපන් භික්ෂුවක් හට සිදුවන (මුසාවාද) සුද්ධ පචිතිය ද,

2. හීනොත්කෘෂ්ට වශයෙන් දක්වුණු ජාති නාම ගොත්‍ර කර්‍ම ශිල්ප ව්‍යාධි සණ්ඨාන ක්ලෙශ ආපත්ති අක්‍රොශ යන දස පදයෙන් යම් කිසිවකින් උපසපන් භික්ෂුවක් හට සම්මුඛයෙහි ගටාබිණීමෙන් සිදුවන (ඕමසවාද) සුද්ධ පචිතිය ද,

3. උපසම්පන්නයකු විසින් උපසම්පන්නයකුට අසම්මුඛයෙහි කියනලද ජාත්‍යාදි දසපදයන් පිළිබඳ වචන; භෙද අදහසින් කීමෙන් සිදුවන (පෙසුඤ්ඤහරණ) සුද්ධ පචිතිය ද,

4. සාමණේරාදී අනුපසම්පන්නකුයට උපසපන් භික්ෂුවක් බුද්ධභාෂිත ශ්‍රාවකභාෂිත දෙවභාෂිත ඍෂිභාෂිත ධර්‍මයක් පදවශයෙන් (හෙවත් අකුරු පද ආදිය එකවිට උච්චාරණය වනසේ) කියවීමෙන් සිදුවන (පදසොධම්ම) සුද්ධ පචිතිය ද,

5. සබ්බ පටිච්ඡන්නාදී කිළියෙක්හි අනුපසම්පන්නයකු සමග තුන් අරුණක් ඉක්ම වා සිවුවන රැයැ නැවතත් එසේ ම එක්වැ සයනය කිරීමෙන් සිදුවන (සහසෙය්‍ය) සුද්ධ පචිතිය ද,

6. මිනිස් මාගමක් සමග සබ්බපටිච්ඡන්නාදී අට වැදෑරුම් කිළියෙහි එක්වැ සයනය කිරීමෙන් සිදුවන (මාතුගාම සහසෙය්‍ය) සුඛ පචිත්තිය ද,

7. සරුප් නොසරුප් තෙපුල් දන්නා නුවණැති පුරුෂයකු නැතිවැ මිනිස් මාගමකට වචන සයකින් මතු, බණ කීමෙන් සිදුවන (උත්තරි ඡප්පඤ්චවාචා) සුඛ පචිත්තිය ද,

8. අනුපසම්පන්නයකුට තමා කෙරෙහි විද්‍යමාන ධ්‍යානාදී ප්‍රභෙද ඇති උතුරු මිනිස් දහමක් ප්‍රකාශ කිරීමෙන් සිදුවන (භූතාරොචන) සුඛ පචිත්තිය ද,

9. සඞ්ඝ සම්මුතියක් නැති වැ උපසපන් මහණකු පිළිබඳ සඟවෙසෙස් ඇවතක් අනුපසම්පන්නයකුට කීමෙන් සිදුවන (දුට්ඨුල්ලාරොචන) සුඛ පචිත්තිය ද,

10. උදුන් බැඳීම් ආ විසින් නොදැවුණු හුදුමැටි හුදුපස්-පොළොව හෝ බෙහෙවින් මැටි හා බෙහෙවින් පස් ඇති පොළොව හෝ හාරමසක් වැස්සෙන් තෙමුණු පස්ගොඩ මැටිගොඩ හෝ යටත් පිරිසයින් සමකරනු පිණිස මුසුන් ආදියකිනු දූ ගට-මින් කැණීමෙන් කැණවීමෙන් සිදුවන (පඨවි ඛණන) සුඛ පචිත්තිය ද,

11. භූතගාමය යි කියනලද තෘණ වෘක්ෂ ලතාදීන්ගේ සිඳීම් බිඳීම් ආදිය කිරීමෙන් සිදුවන (භූත ගාම) සුඛ පචිත්තිය ද,

12. ඇවැත්ති, තෙපි මෙනම් ඇවතකට පැමිණියෝද යි විචාරත්මැ දියයුතු පිළිතුරු නොදී අනිකක් කීමෙහි ද, එසේ විචාළ දෙය නොකියා සඟ වෙහෙසීමෙහි ද, සංඝයා විසින් අඤ්ඤ-වාදක විහෙසක කර්මය කරත් මැ යළිත් එසේ කිරීමෙන් සිදුවන (අඤ්ඤවාදක විහෙසක) සුඛ පචිත්තිය ද,

13. සම්මුති ලද භික්ෂුවක් සෙසු භික්ෂූන් විසින් ලාමක කොට සිතනු ලබනසේ කියන වචනයෙන් ද; ඒ භික්ෂුවගේ නුගුණ සෙසු භික්ෂූන් කෙරෙහි ප්‍රකට වනසේ කිණීමෙන්ද සිදුවන (උජ්ඣාපනකඛීයනක) සුඛ පචිත්තිය ද,

14. සඟ සතු ඇඳ පුටු ආදියක් අභ්‍යවකාශයෙහි තෙමේ අතුට හෝ මෙරමා ලවා අතුරුවා හෝ බැහැර යත්මැ නඟා නො-තබා හෝ නො තබ්බවා හෝ යාමෙන් සිදුවන (අජ්ඣොකාසසන්ථරණක) සුඛ පචිත්තිය ද,

15. කොට්ට මෙට්ට ආදි සඟසතු සෙයයාවක් සියල්ල පිළි-සන් සඟසතු වෙහෙරෙක්හි තෙමේ අතුට හෝ මෙරමාලවා අතුරවා දිසා ගමන් අරභයත්මැ නඟා නොතබවා හෝ නොපිළි-විස හෝ වෙහෙරුවසර ඉක්මවා යාමෙන් සිදුවන (විහාරසඤ්ඤර-ණක) සුඛ පචිතිය ද,

16. සඟසතු වෙහෙරකැ වාසය පිණිස පළමුකොට පැමිණ-සිටි මහණක්හට පීඩාවනසේ දූන දූන එහි වැද හිඳීමෙන් හා සැතපීමෙන් සිදුවන (අනුපඛජ්ජනිසජ්ජ) සුඛ පචිතිය ද,

17 කිපිසිත් ඇතියේ සඟසතු වෙහෙරින් උපසපන් මහණකු නෙරපීමෙන් හෝ එසේ කරවීමෙන් සිදුවන (නිකඩ්ඪාපනක) සුඛ පචිතිය ද,

18. සඟසතු වෙහෙරකැ මධ්‍යම පුරුෂයකුගේ හිස නොවදින තරම් උඩුමහලෙක්හි තළාද පිට තබනලද ආහච්චපාදකාය යි කියන ලද පාවිද වියල ගසා ඇණ නොගසන ලද ඇඳ පුටු-වෙකැ වහා හිඳගැනීමෙන් හා සැතපීමෙන් සිදුවන (වෙහාසකුටි) සුඛ පචිතිය ද,

19. කරවා දෙන හිමියකු ඇති මහල්ලක විහාරයෙහි දොර-බාවේ නිසල බැව් පිණිස දොරබාවට හාත් පසැ දෙරියන් වියත් පමණ පෙදෙස හා ජනෙල් කවුළු පිරියම් පිණිස වටින් කවුළුදොර පළල පමණ පෙදෙසද ඉක්මවා තුන්මැටියෙකින් මත්තෙහි ගැසී මෙන් හා ගැමෙන් ද ඡදනයෙහි දෙතුන් පරික්‍ෂෙපයකින් හෝ දෙතුන් පේළියකින් මතුයෙහි සෙවිලි කරවීමෙන් ද සිදුවන (කුටිලෙන) සුඛ පචිතිය ද,

20. පණුවන් ඇති දිය බව දූන දූන තණමැටි ආදියට ඉසී මෙන් හා එසේ කරවීමෙන් සිදුවන (උදක සිඤ්චන) සුඛ පචිතිය ද,

21. මෙහෙණියකට අවවාද දීමෙහි සඞ්ඝ සම්මුතියක් නො-ලැබ අෂ්ටවාචික උපසම්පදව ලත් මෙහෙණියකට අෂ්ටගරු ධර්මයෙන් අවවාද කිරීමෙන් සිදුවන (අසම්මතොවාදක) සුඛ පචිතිය ද,

22. මෙහෙණියකට අවවාද දීමෙහි සම්මුතිය ලැබද හිරු අවරට ගිය කල අෂ්ට ගරුධර්මයෙන් හෝ අන්‍ය ධර්මයෙකින් අවවාද කිරීමෙන් සිදුවන (අත්ථඞ්ගත) සුඛ පචිතිය ද,

23. මෙහෙණවරකට ගොස් නොගිලන් මෙහෙණියකට අෂ්ට ගුරුධර්මයෙන් අවවාදකිරීමෙන් සිදුවන (උපස්සය) සුඛ පචිතිය ද,

24. මෙහෙණියනට අවවාද දීමෙහි සම්මුතිලද මහණුන්ට "ආමිසය හේතුකොට ගෙන භික්ෂූහු භික්ෂුණීන්ට අවවාද කෙරෙත්" යයි කීමෙන් සිදුවන (ආමිසහෙතු) සුඛ පචිතිය ද,

25. නොනෑ මෙහෙණියක් හට කිසිවක් නොගෙන සිවුරක් දීමෙන් සිදුවන (චීවරදාන) සුඛ පචිතියද,

26. නොනෑ මෙහෙණින්ගේ සිවුරු මැසීමෙන් හා මැස්ස වීමෙන් සිදුවන (සිබ්බන) සුඛ පචිතිය ද,

27. ගැල්කාරයන් හෝ තවලම්කාරයන් සමග යායුතු සැකබිය සහිත මාර්ගය හැර මෙහෙණන හා ගිවිස ගෙන දිගමගකට හෝ යටත් පිරිසයින් තමන් හුන් ගමින් අන් ගමකට හෝ පැමිණීමෙන් සිදුවන (සංවිධානගමන) සුඛ පචිතිය ද,

28. මෙහෙණක හා ගිවිස ගෙන සරස එතර වීමක් හැර උඩු ගඟට හෝ යටිගඟට යන්නාවූ නැව් පාරු ආදියකට නැගීමෙන් සිදුවන (නාවාභිරූහන) සුඛ පචිතිය ද,

29. පළමුකොට ගිහියන්ගේ සැපයීමක් නැතිවැ "භික්ෂුවකගේ ශීල ශ්‍රැතාදී ගුණධර්මයන් නොනෑ නොපැවරුවනට කීමෙන්" මෙහෙනක විසින් නිපදවනලද පිණ්ඩපාතය දැනැ දැනැ වැළඳීමෙන් සිදුවන (භික්ඛුණී පරිපාචිත) සුඵ්ධ පචිතියද,

30. තනිව හිඳින මෙහෙණක හා හුදකලාව රහසිගත වැ හිඳීමෙන් සිදුවන (රහොනිසීදන) සුඛ පචිතිය ද,

31. පින් කැමතියන් විසින් නියමකොට පණවනලද ආවසථ පිණ්ඩ භොජනයක් නොගිලන් වැ එක දවසකට වඩා පිළිගැනීමෙන් සිදුවන (ආවසථ පිණ්ඩ) සුඵ්ධ පචිතිය ද,

32. ගිලාන සමයාදී සත් වැඳූරුම් සමයයන් හැර "බතින් පවරම් බත ගනුව" යනාදී අකැප වචනයකින් පවරණ ලදුව හෝ විනවීමෙකින් හෝ උපන් පස් වැඳූරුම් බොජුන් යටත් පිරිසයින් සතර නමක් එක්ව පිළිගෙන වැළඳීමෙන් සිදුවන (ගණභොජන) සුඵ්ධ පචිතිය ද,

33. ගිලන් කාලය, සිවුරු දෙන කාලය හැර බොහෝ දෙනෙකුන් විසින් යටකී අකැප වචනයකින් පවරත් මැ පැවරූ පිළිවෙල ඉක්මවා හෝ සියල්ලගේ බත් එකට ලැබෙත් මැ, ලද පිළිවෙල ඉක්මවා හෝ වැළඳීමෙන් සිදුවන (පරම්පර භොජන) සුඵ්ධ පචිතිය ද,

34. පඬුරු පිණිස හෝ මාගෝපකාරක පිණිස සැපැයුණු කෑවුම් අග්ගලා ආදියෙන් කුලයට පැමිණි භික්ෂුවක් ගට රිසිසේ ගැනීමට පවරත් මැ පිරූ දෙතුන් පයකට වඩා ගැන්මෙන් සිදුවන (චතනිපතන පටිගගහණ) සුද්ධ පචිතිය ද,

35. වළඳත් මැ බෙදනුවස් අත්පසට ගෙනා පස් වැදෑරුම් බොජුනකට අයත් ආමිෂයක් කා විසි දෙකින් පිළිකෙවු කොට නැගී සිට යළිත් (කැපවදන් බැණ) ඉතිරි නොකළ කැයුතු බුදිය යුතුදෑ වැළඳීමෙන් සිදුවන (පවාරණ) සුද්ධ පචිතිය ද,

36. පිළිකෙවු පැවරුමට පත් මහණෙක්හට චෝදනා කරන අදහසින් දැන දැන (යට කී සේ කැපවදන් බැණ) ඉතිරි නොකළ බොජුනක්; වෙත එළවා වැළඳවීමෙන් සිදුවන (අභිහ-ට්ඨු පවාරණ) සුද්ධ පචිතිය ද,

37. පෙරවරු කල් ඉක්මවත් මැ බොජුන් වැළඳීමෙන් සිදු වන (විකාලභොජන) සුද්ධ පචිතිය ද,

38. තමන් පිළිගෙන එක රැයකුදු ඉකුත්වූ බාද්‍ය භොජ්‍ය-දියක් වැළඳීමෙන් සිදුවන (සන්නිධිකාර) සුද්ධ පචිතිය ද,

39. නොගිලන් වැ ගිතෙල් වෙඬරු තලතෙල් ආදී තෙල් වගී හා මීපැණි උක්සකුරු දියමස් ගොඬමස් කිරි දීද යන ප්‍රණීත භොජනයක් තමන් පිණිස ඉල්වා ගෙන වැළඳීමෙන් සිදු වන (පණීත භොජන විඤ්ඤත්ති) සුද්ධ පචිතිය ද,

40. දැහැටි පැන් හැර වැළඳිය යුතු නොපිළිගැනුණු යම් කිසි ආහාරයක් වැළඳීමෙන් සිදුවන (අපටිග්ගහණ) සුද්ධ පචි-තිය ද,

41. තිර්ථකයකුහට සියතින් කැයුතු බුදිය යුතුදෑ දීමෙන් සිදුවන (අචෙලකදාන) සුද්ධ පචිතිය ද,

42. "ඇවැත්නි, එව! "ගම කට හෝ නියම් ගම කට පිඬු පිණිස යන්නෙමු යි" ගිවිසගෙන (මාගමක් සමග සයනාදියක් කරනු රිසියෙන්) ඒ භික්ෂුවට කිසියම් ආමිෂයක් දී හෝ නොදී පිටත් කොට හැරීමෙන් සිදුවන (උය්‍යොජන) සුද්ධ පචිතිය ද,

43. මෛථුන රාගයෙන් යුත් ස්ත්‍රී පුරුෂ දෙදෙනකු ඇති සයනි ඝරයෙහි (=සැතපෙන කාමරයෙහි) දොරබා දෙරියන් බියත් අත්පස ඉක්මවා ඉඳීමෙන් සිදුවන (සභොජනකුල) සුද්ධ පචිතිය ද,

44. මිනිස් මාගමක් සමග රහසිව මුවහ වූ අස්නෙක්හි හිඳී ඉමෙන් සිදුවන (රහොනිසජ්ජ) සුද්ධ පචිතිය ද,

45. හුදු කලාව හුදකලා වූ මිනිස් මාගමක් සමග ඇස් කන් රහස් තන්හි හිඳීමෙන් සිදුවන(දුතියරහොනිසජ්ජ) සුද්ධ පචිත්තිය ද,

46. සිවුරු දෙන සිවුරු කරන කාලය හැර පස් වැදෑරුම් බොජුනෙන් යම් කිසිවකින් නිමතුන් ලදුවැ, කුලයන්හි හැසිරීමට සිත් උපන්කල දෙළොස් රියන් අත්පස ඇති මහණක්හු "මම අසුවල් නමැත්තහුගේ ගෙට යන්නෙමි"යි යනාදීන්) නො පිළිවිස නිමතුන් ලද බත වැලදීමට පළමුව හෝ වළඳා ඉක්බිති වැ හෝ (නිමතුන් ලද කුලයෙන්) අන් කුලයන්හි හිරමුදුනෙන් පහ නොවන තෙක් හැසිරීමෙන් සිදුවන (චාරිත්ත) සුද්ධ පචිත්තිය ද,

47. "වහන්ස, මෙතුවක් කාලක් මුළුල්ලෙහි මේනම් මෙනම් බෙහෙදින් වුවමනා ඇතහොත් මේ පමණින් මට දන්වුව මැනවැ" යි කිසිවකු විසින් පස පැවැරුමින් පවරත් මැ නැවත පැවැරීමක් හෝ නිති පැවරීමක් නැතිවැ ඒ පැවරු කාලය හෝ බෙහෙත් හෝ බෙහෙත් ප්‍රමාණය හෝ ඉක්මවා නොගිලන් වැ විනවීමෙන් සිදුවන (භෙසජ්ජ විඤ්ඤත්ති) සුද්ධ පචිත්තිය ද,

48. යාමට සුදුසු කරුණක් නැතිවැ යුද පිණිස ගමින් නික්මුණු සිවුරගසෙන් දැකීමට යා මෙන් සිදුවන (උය්‍යුත්ත-දස්සන සුද්ධ පචිත්තිය ද,

49 සෙන් කරායතු පිණිස සුදුසු කරුණක් ඇතිවත් මැ එහි ගොස් දෙතුන් රැයකට වඩා විසීමෙන් සිදුවන (සෙනාවාස) සුද්ධ පචිත්තිය ද,

50. දෙතුන් රැයක් එහි වසමින් යුදගතට හෝ සෙන් ගණින තැනට හෝ සෙන් රැස්ව සිටින තැනට හෝ ඇත් ඇණී ඈ දැකීමට හෝ යාමෙන් සිදුවන (උය්‍යොධික) සුද්ධ පචිත්තිය ද,

51. රහමෙර බීමෙන් සිදුවන (සුරාපාන) සුද්ධ පචිත්තිය ද,

52. කොළිරිසියෙන් ඇඟිල්ලෙන් ගිරිකිතැවීමෙහි (=කිති-කැවීමෙන් සිදුවන (අඞ්ගුලි පතොදක) සුද්ධ පචිත්තිය ද,

53. දිය කෙළිමෙන් සිදුවන (උදක හස්ස ධම්ම) සුද්ධ පචිත්තිය ද,

54. උපසපන් මහණකු විසින් ප්‍රඥප්ති ශික්ෂාවෙකින් අව-වාද කරත් මැ ඕහට හෝ සිකපදයට හෝ අනාදර කිරීමෙන් සිදුවන (අනාදර) සුද්ධ පචිත්තියද,

55. උපසපන් භික්ෂුවක් භයගැන්වී මෙන් සිදුවන (භිංසා-පනක සුද්ධ පචිත්තියද,

56. පහන් දැල්වීමාදී කිසක් නිසා මුත් නොගිලන් ව තමිනු රිසින් ගිනි දැල්වීමෙන් හා දැල්ලවීමෙන් සිදුවන (ජොතිසමාදහන) සුද්ධ පචිතියද,

57. නෑමට නියමවූ කාලය හැර අඩ මසෙකින් මෙපිට නෑ-මෙන් මැදමඬුලු වැසිමහණුන්ට සිදුවන (නහාන) සුද්ධ පචිතිය ද,

58. හැඳීමට පෙරවීමට සුදුසු අලුත් සිවුරක් නිල් ඈ පැහැ-යෙකින් මකුණු පිටක් පමණ හෝ මොනර ඇසක් පමණ කප්-බින්දුවක් නොතබා පරිභොග කිරීමෙන් සිදුවන (දුබ්බණ්ණ අනාදන) සුඬ පචිතිය ද,

59. උපසපන් මහණකු සමීපයෙහි මහණ මෙහෙණින්ට හෝ සිඛ මෙනෙවි හෙරණ හෙරණින්ට හෝ විකාපූ ඉතිරි සිවුරක් නොපසුදුරා පරිභොග කිරීමෙන් සිදුවන (විකප්පන) සුද්ධ පචිතිය ද,

60. මහණකු සතු පාසිවුරු ඈ පිරිකරක් කෙළිරිසිනු දු සඟ වා තැබීමෙන් හා තැබ්බ වී මෙන් සිදුවන (අපනිධාන) සුඞ පචිතිය ද,

61. දැන දැන තිරිසන්ගිය සතක්හු දිවි ගැලවී මෙන් සිදුවන (පාණ ජීවිතා වොරොපන) සුද්ධ පචිතිය ද,

62. දැන දැන පණුවන් සහිත දිය පානය කිරීමෙන් සිදු වන (සප්පානක) සුඞ පචිතිය ද,

63. දහම් වූ පරිදි සංසිඳුවුණු අධිකරණයක් (නැවත විනිශ්චය කටයුතු යයි) දැන දැන උක්කොටනය කිරීමෙන් සිදුවන (උක්කොටන) සුද්ධ පචිතිය ද,

64. මහණකුගේ සඟ වෙසෙස් ඇවතක් දැන දැන වැසිමෙන් සිදුවන (දුට්ඨුල්ල පටිචඡාදන) සුඞ පචිතිය ද,

65. උනු විසි වයස් ඇති පුඟුලෙක් දැන දැන උපසම්පදා කිරීමෙන් උපාධ්‍යායවරයනට සිදුවන (ඌණවීසති) සුද්ධ පචිතිය ද,

66. දැන දැන සොර යාත්තුවක් සමග ගිවිස ගෙන එක්දිග මගකට පැමිණීමෙන් සිදුවන (ථෙය්‍ය සත්‍ථ) සුඞ පචිතිය ද,

67 මිනිස් මාගමක් සමග ගිවිස ගෙන එක් දිග මගකට බැසී මෙන් සිදුවන (සංවිධාන ගමන) සුඞ පචිතිය ද,

68. "භගවත්හු විසින් සක් ඇවැත් කළුය යි පනවනලද යම් මේ දහම් කොනෙක් සඟ මොක් දෙකට අනතරාය කරන්නාහ යි

වදූරත ලද්දාහු ඒ ධර්මයන් සෙවුනාහට (ඔවුහු) අන්තරාය පිණිස සමර්ථ නොවෙත්ය,,යි යම් මහණෙක් කියාද එය ඇසූ දුටු සෙසු භික්‍ෂූන් විසින් දිටු විපත් එම මහණහුට "ඇවැත්නි, එසේ නොකියවයි යනාදීන් තුන් යළක් අවවාද දෙනලදුව එම දෘෂ්ටිය නොහරිනම් එය බැහැර කරවනු පිණිස "දිට්ඨියා අප්පටි නිස්සග්ග" උක්ෂේපනීය කර්මය කළයුතු ය. එසේ කරනු ලබන්නහුට එම දෘෂ්ටිය නොහැරීමෙන් කර්මවාක්‍යයාගේ අවසානයෙහි සිදුවන (දිඨී අප්පටි නිස්ස ජන) සුඛ පචිතිය ද,

69, එසේ කියන සුළු ඔසාරණ කර්මයෙන් ඇතුළත් නොක-රන ලද ඒ දෘෂ්ටිය බැහැර නොකළ භික්‍ෂුව හා සමග පොහෝ පවුරුණු ආදී විනයකර්ම කිරීමෙන් ද, ආමිෂ සම්භොග කිරීමෙන් හා එක් සෙවිණි ඇති ගෙයක සයනය කිරීමෙන් ද සිදුවන (උක්ඛිත්තානුවත්තක) සුඛ පචිතිය ද,

70. හෙරණ පැවිදියෙක් තමුදු එසේ කියා නම් තුන් යළක් අවවාද කොට ද නොපිළිගන්නහු දණ්ඩකර්මනාසනායෙන් නැ-සිය යුතු. එසේ නසන ලද හෙරණකු හට දූන දූන පාසිවුරු ආදිය දෙමින් සංග්‍රහ කිරීමෙන් ද, තමන්ට උපස්ථාන කරවා ගැනීමෙන් ද, සම්භොග කිරීමෙන් හා එක් සෙවෙණිය තුළ සහ-සෙය්‍යාව කිරීමෙන් ද. සිදුවන (උපලාලන) සුඛ පචිතිය ද,

71. "ඇවැත්නි, මේ වැරද්ද නොකරව" යනාදීන් භික්‍ෂූන් විසින් ප්‍රඥප්ති ශික්‍ෂාපදයෙකින් අවවාද කරනු ලබන්නහු විසින් "ඇවැත්නි ,අනෙක් ව්‍යක්ත් විනය ධරයකු විචාරා දැන ගන්නතුරු තොප කී මේ සික්ෂාපදයෙහි නොහික්මෙමි"යි කියා එය නො පිළිගැනීමෙන් සිදුවන (සහ ධම්ම) සුඛ පචිතිය ද,

72. පාමොක් උදෙසන කල මේ කුඩානුකුඩා සික්ෂාපද උදෙ-සීමෙන් ප්‍රයෝජන කිම්ද හුදෙක් (කැපද්‍රේ නොකැපද්‍රේ හෝ යි උපදනා) කුකුස් ආදිය පිණිස පවත්නේය යි මෙසේ සික්ෂාපද-යනට තිගා බිණීමෙහි සිදුවන (සික්ඛාපද විවණ්ණක) සුද්ධ පචිතිය ද.

73. අඩමසක් පාසා පාමොක් උදෙසත් මැ යම් භික්‍ෂුවක් "ඇවැත්නි, මේ ධර්මය විනයාගතය, විනයාන්තගීතය, අඩමසක් පාසා උදෙසීමට එයි, යනු මම දූන්ම දතිමි! මින් පෙර දූන නොසිටියෙමි"යි මෙසේ කියා නම් ඉන් පෙර ඒ භික්‍ෂුව දෙතුන් වරක් පාමොක් උදෙසන තැන උන් බව දත් සෙසු භික්‍ෂූන් විසින් ඒ භික්‍ෂුවට සිදුවූ ඇවැත යථාධර්මයෙන් සමර්ථය කරවා "ඇවැත්නි, යම් හෙයකින් තෙපි පාමොක් උදෙසන කල මිනාසේ මෙනෙහි නොකළහුද? එහෙයින් තෙපිට සිදුවූයේ අලාභයෙක

අනිෂ්ට ලාභයෙකැ"යි කියා ඕහට මොහාරොපන කර්මය කළ යුතුයැ; එසේ කළ ඉක්බිති ඔහට මූලාවීමෙන් සිදුවන (මොහ-නක) සුද්ධ පචිතිය ද,

74. උපසපන් මහණකුහට කිපි සිතින් පහරක් දිමෙන් සිදුවන (පහාරදාන) සුද්ධ පචිතිය ද,

75. උපසපන් මහණකුහට පහරදෙන පිණිස අත් සැත් නැඟීමෙන් සිදුවන (තලසත්තික උග්ගිරණ) සුඬ පචිතිය ද,

76 උපසපන් මහණකුහට දශීනාදී මූල් රහිත සඟ වෙසෙස් ඇවතකින් චොදනා කිරීමන් සිදුවන (අමූලක) සුඩ පචිතිය ද,

77. අපහසුවක් කරණු කැමැත්තෙන් උපසපන් මහණකු-හට (නොපිරුණු විසිවයස් ඇතිව උපසපන්වීය යි යනාදීන්) දන දන කුකුස් ඉපදවීමෙන් සිදුවන (කුක්කුච්චුප්පාදන) සුද්ධ පචිතිය ද,

78. කලහ කරනු රිසින් උපන් කලහ ඇති භික්ෂූන් සමීප-යෙහි නොපෙනී සිට රහස් බස් ඇසීමෙන් සිදුවන (උපස්සුති) සුඬ පචිතිය ද,

79. යථා ධර්මයෙන් කැරුණ අප ලොකනාදී සිවු වැදෑරුම් කර්මයනට ඡන්දය දී පසුව දෙස් කීමෙන් සිදුවන (කම්ම පටිබා-හන) සුද්ධ පචියති ද,

80. සංඝයා අතර විනිශ්චය කථාවක් පවත්නා කල ඡන්දය නොදී නැගිට යාමෙන් සිදුවන (ඡන්ද අදාන) සුද්ධ පචිතිය ද,

81. සමගි සංඝයා එක්වැ භික්ෂුවක් හට සිවුරක් දී "භික්ෂූහු සඟසතු ලාභය යහලුකම් සලකා පිරිණමත්ය"යි පසුව දෙස් කීමෙන් සිදුවන (ඛීයනක) සුඬ පචිතිය ද,

82. සඟනට පිරිණැමූ ලාභයක් දන දන පුද්ගලයකුට පිරි ණැමීමෙන් සිදුවන (ලාභපරිණාම) සුද්ධ පචිතිය ද,

83, බැහැරට නොගිය අභිෂෙකලත් ක්ෂත්‍රිය රජකු හා මෙහෙසිය ඇති අන්තඃපුරයට පළමුකොට තමා ආ බව නො දන්වා ඉන්ද්‍රඛීලය ඉක්මයාමෙන් සිදුවන (අන්තෙපුරප්පවෙසන) සුඩ පචිතිය ද,

84. හිමියකු ඒ මූලාව තුබූ මුතු මැණික් ආදී රතනයක් හෝ වස්ත්‍රාදි රතන සම්මත වස්තුවක් ආරාමය තුළ හෝ ආවාසය තුළ "යමෙක් සතු නම් හේ ගෙනයන්නේය,, යි තගා තැබීම හැර

සෙසු තැනකදී එය ගැනීමෙන් හා ගැන්වීමෙන් ද ආරාම ආවාස තුල නමුදු "මෙය ප්‍රවේශම් කොට දෙව,, යි දෙන ලද කණ පලඳින තාලපත්‍රාදියක් හෝ ප්‍රවේශම් කොට තැබීමෙන් ද සිදුවන (පටිසාමන) සුද්ධ පචිතිය ද,

85. දෙළොස් රියනක් ඇතුලත සිටි භික්‍ෂුවක්හු "විකාලෙ ගාමප්පවෙසනං ආපුච්ඡාමි" යනාදීන් නොවිචාරා ඉක්මන් කට යුත්තක් නැතිව විකල්හි ගම් වැදීමෙන් සිදුවන (විකාලගාමප්පවෙසන) සුද්ධ පචිතිය ද,

86. ඇට, දත්, අං යන මෙයින් හිඳි ගුලාවක් කරවීමෙන් එය බිඳ දමා දෙසිය යුතුවූ (සූචිඝර) සුද්ධ පචිතිය ද,

87. වියළ හැර සුගත් අඟුලෙන් අටඟුලකට වඩා පා ඇති කොට ඇඳක් හෝ පුටුවක් කරවීමෙන් එය කපා දමා දෙසිය යුතුවූ (මඤ්චකාරාපන) සුද්ධ පචිතිය ද,

88. පුලුන් පුරවා ඇඳක් හෝ පුටුවක් කරවීමෙන් එය කඩා දමා දෙසිය යුතුවූ (තූලොනද්ධමඤ්ච) සුද්ධ පචිතිය ද,

89 දිගින් සුගත් වියතින් දෙ වියතකට ද පළලින් එක් වියත් හමාරකට ද දැවලුව වියතකට ද වඩා රැගෙන හිඳිනා සිවුරක් කරවීමෙන් වැඩි කොටස කපා දමා දෙසිය යුතුවූ (නිසීදන කාරාපන) සුද්ධ පචිතිය ද,

90. දිගින් සුගත් වියතින් සතර වියතකට ද පළලින් දෙ වියතකට ද වඩා රැගෙන කණ්ඩුපටිච්ඡාදන සිවුරක්(වණ වැස්මක්) කිරීමෙන් වැඩි කොටස සිඳ දෙසිය යුතුවූ (කණ්ඩු පටිච්ඡාදන) සුද්ධ පචිතිය ද,

91. දිගින් සුගත් වියතින් ස වියතකට ද පළලින් දෙවියත් හමාරකට ද වඩා රැගෙන වැසි සළු සිවුරක් කරවීමෙන් සිදුවන (වස්සිකසාටික) සුඬ පචිතිය ද,

92. සුගත් වියතින් දිගින් නව වියතක් හා සරසින් සවියතක් ද ඇති සුගත් සිවුර තරම් හෝ එයට අධිකව හෝ සිවුරක් කරවීමෙන් සිදුවන (සුගත චීවර) සුඬ පචිතිය ද, යන දෙ අනූවක් ඇවැත්හු **පාචිත්ති යාපත්තිස්කන්ධය යි.**

**(5) පාටිදෙශනීයා පත්ති ස්කන්ධය** කවරේද යත්:—

1. ඇතුළු ගමට පිවිසි නොනෑමෙහෙණකගේ අතින් යවිකැලි කන බොන දෙයක් සියතින් පිළිගෙන වැළඳීමෙන් සිදුවන (අඤ්ඤාතකපටිග්ගහණ) පිළිදෙසිය යුතු ඇවත ද,

2. භික්‍ෂූන් කුලයන්හි නිමතුන් ලැබ වළඳත් මැ "මෙහි ව්‍යඤ්ජන දෙව, මෙහි බත් දෙව" යි අණ කරමින් සිටි මෙහෙණකට "නැඟණියෙනි, භික්‍ෂූන් වළඳන තෙක් ඉවත්වෙව"යි නොකීමෙන් වළඳන භික්‍ෂුගණයාහට සිදුවන (වොසාසමාන) පිළිදෙසිය යුතු ඇවත ද,

3. ශෛක්‍ෂකුලයකට ඇතුල්වීමට පළමු නිමතුන් නොලද නොගිලන් මහණකුට සෙඛසම්මත ලැබූ කුලයෙහි කෑ යුතු බුදිය යුතු දැයක් සියතින් පිළිගෙන වැළඳීමෙන් සිදුවන (සෙඛ සම්මත) පිළිදෙසිය යුතු ඇවත ද,

4. අනතුරු උවදුරු සහිත අරණ සෙනසුනෙකැ වසන නොගිලන් මහණ හට ආරාමයට හෝ ආරාමෝපචාරයට පැමිණ "මෙනම් කෙනෙකුගෙන් කෑයුතු බුදියයුතු දෙයක් ගෙනෙනු ලැබේය"යි පළමුකොට නො දක්වන ලද කෑයුතු බුදියයුතු දෙයක් ආරාමයතුළදී සියතින් පිළිගෙන වැළඳීමෙන් සිදුවන (ආරඤ්ඤක) පිළිදෙසිය යුතු ඇවත ද, යන මේ සතර ඇවැත්හු **පාටිදෙසනීයාපත්තිස්කන්ධය** යි.

(6) **දුෂ්කෘතාපත්ති ස්කන්ධය** තවරේදයත් :-

1. 2. උපසපන් මහණ හට නැබ මඩල, දෙදන මඩල යන තෙම්ඬුලු වසා හාත් පසින් වට නොකොට හඳනය හැඳීමෙන් ද, හාත් පසින් වට නොකොට සිවුරු පෙරවීමෙන් ද සිදුවන (අපරිමණ්ඩල නිවාසන පාරුපන) දුකුළා දෙ ඇවැත් ද,

3. 4. ගණ්ඨිය පාසයෙහිලා නුවා කෙළවරින් ග්‍රීවය වසා දෙකොන සමකොට හකුලා සුපිළිසන් නොව ඇතුළු ගමට යාමෙන් හා සුපිළිසන් නොව හිඳීමෙන් ද සිදුවන (සුපටිච්ඡන්න අගමන අනිසීදන) දුකුළා දෙ ඇවැත් ද,

5. 6. අත්පාය සොලවමින් සුවිනීත නොවැ ඇතුළු ගමැ යාමෙන් ද, සුවිනීත නොවැ හිඳීමෙන් ද, සිදුවන (සුසංවුත අගමන අනිසීදන) දුකුළා දෙ ඇවත ද,

7. 8. යට බලා හෙළනලද ඇස් නැතිවැ වියදඬු පමණ දුර ඉක්මවා බලමින් ඇතුළුගමැ යාමෙන් ද, එසේ හිඳීමෙන් ද සිදුවන (ඔක්ඛිත්ත චක්ඛු අගමන අනිසීදන) දුකුළා දෙ ඇවත ද,

9. 10. එක් අංශයකින් හෝ දෙ අංශයෙන් මැ ඔසවනලද සිවුරු ඇතිවැ ඇතුළු ගමැ යාමෙන් ද, හිඳීමෙන් ද සිදුවන (උක්ඛිත්තකායගමන නිසීදන) දුකුළා දෙ ඇවත ද,

11. 12 තොල විවෘතකොට මහසිනා ඇතිවැ ඇතුළුගමැ යාමෙන් ද හිඳීමෙන් ද සිදුවන (උජ්ජග්ඝිකාය ගමන නිසීදන) දුකුළා දෙ ඇවත ද,

13. 14 දෙළොස් රියනකින් මත්තෙහි ඇසෙන හඬ ඇතිවැ ඇතුළු ගමැ යාමෙන් ද, හිඳීමෙන්ද සිදුවන (මහාසද්ද ගමන නිසීදන) දුකුළා දෙ ඇවත ද,

15. 20 කය, අත, හිස සල සලා ඇතුළු ගමැ යාමෙන් ද, හිඳීමෙන් ද වෙන වෙනම සිදුවන (කාය බාහු සීසප්පචාලන) දුකුළා ඇවැත් සය ද,

21. 22 උකුලෙහි අත තබා ඇතුළුගමැ යාමෙන් හා හිඳී—මෙන් සිදුවන (ඛම්භකතගමන නිසීදන) දුකුළා දෙ ඇවත ද,

23. 24 හිස වසා පෙරවා ඇතුළුගමැ යාමෙන් හා හිඳීමෙන් සිදුවන (ඔගුණ්ඨිත සිස ගමන නිසීදන) දුකුළා දෙ ඇවත ද,

25. ඇඟිලි අග ඔසවා විලුඹ ඔසවා අගිලි අගින් හෝ ඇතුළු ගමැ යාමෙන් සිදුවන (උක්කුටික ගමන) දුකුළා ඇවත ද,

26. පල්ලත්ථිකාවෙන් යුක්තවැ හෙවත් අකවටු අවුලුවා ඇතුළු ගමැ හිඳීමෙන් සිදුවන(පල්ලත්ථික නිසීදන) දුකුළා ඇවත ද, යන මේ සාරුප්‍යය පිණිස පැණවූ සවිසි දුකුළා ඇවැත් ද,

27. "පිඬු පිළිගනිමි"යි සිහිය නො එලවා පිඬු පිළිගැනීමෙන් සිදුවන (සක්කච්ච අපටිග්ගහණ) දුකුළා ඇවත ද,

28. තමාගේ අධිෂ්ඨාන පාත්‍රයෙහි පාත්‍ර සංඥ නැතිවැ පිඬු පිළිගැනීමෙන් සිදුවන (පත්තසඤ්ඤී අපටිග්ගහණ) දුකුළා ඇවත ද,

29. ලැබූ බතින් සතරෙන් කොටසකට වඩා මුං මෑ කොල්ලු ආදියෙන් කළ අතින් ගෙන ගිය හැකි සූපය තමන් පිණිස පිළිගැනීමෙන් සිදුවන (සමසූපක අපටිග්ගහණ) දුකුළා ඇවත ද,

30. පාමුව විටෙහි යට රේඛාව ඉක්මූවා පිඬු පිළිගැනීමෙන් සිදුවන (සමතිත්තික අපටිග්ගහණ) දුකුළා ඇවත ද,

31. "පිඬු වළඳමි" යි සිහිය නොඑලවා වැළඳීමෙන් සිදුවන (අසක්කච්ච භුඤ්ජන) දුකුළා ඇවත ද,

32. පාත්‍රගත සංඥවෙන් තොරවැ වැළඳීමෙන් සිදුවන (පත්තසඤ්ඤී අභුඤ්ජන) දුකුළා ඇවත ද,

33. තමන් අභිමුඛයෙහි පටන් පිළිවෙළින් පිඬු නොවැළ-දීමෙන් සිදුවන (සපදාන අභුඤ්ජන) දුකුළා ඇවත ද,

34 බතින් සතරවන කොටස පමණවූ සමසූපක පිණ්ඩය නොවැළඳීමෙන් සිදුවන (සමසූපක අභුඤ්ජන) දුකුළා ඇවත ද,

35. මුදුන මැඩ (පාත්‍රය මැදින් ගෙන) පිඬු වැළඳීමෙන් සිදුවන (ථූපතොමද්දන) දුකුළා ඇවත ද,

36. වැඩිය ලබනු කැමති බව නිසා සූප ව්‍යඤ්ජන බතින් වැසීමෙන් සිදුවන (පටිච්ඡාදන) දුකුළා ඇවත ද,

37. නොගිලන් වූ තමා පිණිස නොනෑ නොපැවරුවන් ගෙන් බත් හෝ ව්‍යඤ්ජන විනවා අනුභව කිරීමෙන් සිදුවන (සූපොදනවිඤ්ඤත්ති) දුකුළා ඇවත ද,

38. කිපි සිත් ඇතිවැ දෙස් කියනු කැමැත්තෙන් මෙරමා වළඳන පාත්‍රය බැලීමෙන් සිදුවන (උජ්ඣාන සඤ්ඤි) දුකුළා ඇවත ද,

39. මොනර බිජුවට සේ ඉමහත් කොට පිඬු අනුභව කිරී-මෙන් සිදුවන (අතිමහන්ත කබල කරණ) දුකුළා ඇවත ද,

40. හාත්පසින් වට වූවක් නොකොට අහර පිඬු අනුභව කිරීමෙන් සිදුවන (පරිමණ්ඩල ආලොප අකරණ) දුකුළා ඇවත ද,

41. අහර පිඩ මුවදොරට නො එළවත් මැ මුඛය හැරීමෙන් සිදුවන (මුඛවාර විවරණ) දුකුළා ඇවත ද,

42. වළඳමින් ඇඟිලි මුවතුළට ප්‍රවේශ කොට අනුභව කිරීමෙන් සිදුවන (හත්ථ මුඛපපවෙසන) දුකුළා ඇවත ද,

43. පිඬු සහිත මුඛයෙන් කථා කිරීමෙන් සිදුවන දුකුළා ඇවතද ,

44. ආලොපය මුඛයට දම දමා අනුභව කිරීමෙන් සිදුවන (පිණ්ඩුක්ඛෙපක) දුකුළා ඇවත ද,

45. අහර පිඩ කඩු කඩා අනුභව කිරීමෙන් සිදුවන (කබලා-වච්ඡෙදක) දුකුළා ඇවත ද,

46. වඳුරන්සේ හකු පුරව පුරවා අනුභව කිරීමෙන් සිදු-වන (අවගණ්ඩකාරක) දුකුළා ඇවත ද,

47. අත සලසලා අනුභව කිරීමෙන් සිදුවන (හත්ථනිද්ධුනක) දුකුළා ඇවතද,

48. බත්හුලු ඉස ඉස අනුභව කිරීමෙන් සිදුවන (සිත්ථාවකා-රක) දුකුළා ඇවතද,

49. දිව තෙරව තෙරවා අනුභව කිරීමෙන් සිදුවන (ජිවහානිච්ඡාරක) දුකුළා ඇවත ද,

50. චපු චපු යන හඬ ඇති කොට අනුභව කිරීමෙන් සිදුවන (චපු චපු කාරක) දුකුළා ඇවත ද,

51. සුරු සුරු යන හඬ ඇති කොට අනුභව කිරීමෙන් සිදුවන (සුරු සුරු කාරක) දුකුළා ඇවත ද,

52. 53. 54. අතලෙව ලෙවා එක ඇඟිල්ලකිනු දූ පාත්‍රය ලෙව ලෙවා, දිවින් පිට තොල ලෙව ලෙවා අනුභව කිරීමෙන් සිදුවන (හත්‍ථ, පත්‍ත, ඔට්‍ඨ නිල්ලෙහක) තුන් දුකුළා ඇවැත් ද,

55. ආමිස සහිත අතින් පැන් බඳුන ගැණීමෙන් සිදුවන (ථාල පටිග්ගහණ) දුකුළා ඇවත ද,

56. බත් හුලු සහිත පාදෙවූ දිය ඇතුළු ගමෙහි දැමීමෙන් සිදුවන (සසිත්‍ථ ඡඩ්ඩනක) දුකුළා ඇවත ද,

57. 58. 59. 60. කුඩයක්ගත් අත් ඇති, සතර රියන් පමණ දඬුගත් අත් ඇති, කඩු ඇසැත්ගත් අත් ඇති, දුනු ඈ ආයුධගත් අත් ඇති නොගිලනකුට බණ කීමෙන් සිදුවන (ඡත්‍ත, දණ්ඩ, සත්‍ථ, ආයුධපාණී ධම්මදෙසන) සිවු දුකුළා ඇවත් ද,

61. 62. මිරිවැඩිපයලා සිටියාවූ ද, වහන් පයලා සිටියාවූ ද අගිලනාහට දහම් දෙසීමෙන් සිදුවන(පාදුකා, උපාහනාරූළ්හ) දෙ දුකුළා ඇවැත් ද,

63, 64. රථාදී යානාවකට පැමිණියාවූ ද, සයන ඉරියව්වට පැමිණියාවූ ද, අගිලනාහට දහම් දෙසීමෙන් සිදුවන (යානගත සයනගත) දෙ දුකුළා ඇවැත් ද,

65. අතින් හෝ වස්ත්‍රාදියකින් දෙදන මඬුලු බැඳ (අතවටු අවුලා) සිටින අගිලනෙක්හට දහම් දෙසීමෙන් සිදුවන (පල්ලත්‍ථික) දුකුළා ඇවත ද,

66. 67. කෙශාන්තය වසා හිස බැඳ සිටින්නාවූ ද, හිසවසා පෙරව සිටින්නාවූ ද, නොගිලනෙක්හට දහම් දෙසීමෙන් සිදුවන (වෙඨිත ඔගුණ්ඨිත සීස) දෙ දුකුළා ඇවැත් ද,

68. බිම ඉඳ පැදුරු කලාලආදී මිටි අස්නෙක වුවද හුන්නාවූ අගිලනෙක් හට දහම් දෙසීමෙන් සිදුවන (ඡමාය නිසීදන) දුකුළා ඇවත ද,

69. මිටි අස්නෙක හිඳ උස් අස්නෙකැ හුන් අගිලනෙක්හට දහම් දෙසීමෙන් සිදුවන (නීචාසන නිසීදන) දුකුළා ඇවත ද,

70. හුන්නාවූ නොගිලනාහට සිටගෙන දහම් දෙසීමෙන් සිදුවන (ඨාන) දුකුලා ඇවත ද,

71. පිටිපස යමින් පෙරටුව යන අගිලනෙක් හට දහම් දෙසීමෙන් සිදුවන (පච්ඡතො ගමන) දුකුලා ඇවත ද,

72. නොමගින් යමින් මගින් යන නොගිලනෙක්හට දහම් දෙසීමෙන් සිදුවන (උප්පථ ගමන) දුකුලා ඇවත ද,

73. සිට ගෙන නොගිලන් වැ මල මූත්‍ර කිරීමෙන් සිදුවන (ඨිතක) දුකුලා ඇවත ද,

74. නොගිලන් වැ තිල් තණ ආදියෙහි මලමූත්‍ර කිරීමෙන් හා කෙලගැසීමෙන් සිදුවන (හරිත) දුකුලා ඇවත ද,

75. නොගිලන් වැ පරිභොග ජලයෙහි මල මූත්‍ර කිරීමෙන් හා කෙල සොටු ආදිය දැමීමෙන් සිදුවන (උදක) දුකුලා ඇවත ද, යන

**එකුන් විසි දුකුලා** ඇවැත් ද, යන මේ **උපදෙසාගත පන්සැත්තෑවක් දුකුලා** ඇවැත් ද,

තවද කොසෙල් වැහිරියෙන් කළ පිළි ද, එරුපත් හුයින් කළ පිළිද, වරාහුයින් කළ පිළිද "කැතිරිකඩ" යයි කියන ලද නියඳින් කළ පිළිද, සබ්බනීලපී ත, ලොහිත, ඔදාත; මඤ්ජෙට්ඨාදි පිළි ද, දැරීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

ඇත්, අස්, වලස්, කරබානාවලස්, සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, සුනඛ, දීඝ ජාතික යන මොවුන්ගේ ඇට ද, සම් ද, ලේ ද, පස් සහදැමියන් අතුරෙන් යම්කිසිවකු උදෙසා මැරූ ගොඩමස් දියමස් ද, "කවර මසෙක්දැ"යි නො පිළිවිසූ මස් ද වැළඳීමෙන් සිදුවන දුකුලා ඇවත ද,

නහන තොටෙහි ද, වස පස කිස කරන තැන්හි ද, අවසර නැති වැ, ආපිළිවෙළ ඉක්මවීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

කෙසකිළි වැසිකිළි දෙකට නොකාරා වැදීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

පාදුකාවෙන් බැහැර සිවුරු නැඟීමෙන් හා බැගීමෙන් වන දුකුලා ඇවැත් ද,

වස කිස කරත් මැ නැටවීමෙන් හා දැහැටි කෑමෙන් වන දුකුලා ඇවැත් ද,

වැසිකිළි වළෙහි පූසන් කුරු දැමීමෙන් සිදුවන දුකුලා ඇවත් ද,

කැකුලු පුසන්දඹුයෙන් පිසදැම්මෙන් වන දුලකුා ඇවත ද, පසදෙණෙහි කෙල ගැසීමෙන් සිදුවන දුකුලා ඇවත ද, පිටත අපිරිසුදු වූ තැන පිරිසුදු නොකිරීමෙන් හා නොකරවීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, එහි කසල දැක නොහැරීමෙන් හා නොහැර වීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, ඉක්මන්වැ එහි ඇතුල් වීමෙන් හා නික්මීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, හඬ ඇසෙන සේ ජල-කිස කිරීමෙන් සිදුවන දුකුලා ඇවත ද,

වැඩිමහල්ලන් නොවිචාරා පාමොක් උදෙසීමෙන් හා බණ කීමෙන් ද, පැන පිළිවිසීමෙන් හා විසඳීමෙන් ද, කීමෙන් හා කියවීමෙන් ද, පහන් දැල්වීමෙන් හා නිවීමෙන් ද, දොර කවුළු හැරීමෙන් හා වැසීමෙන් ද, සිදුවන දුකුලා ඇවැත් ද,

නග්න ව වැඳීමෙන් හා වැඳුම් ලැබීමෙන් ද, ගමන් යාමෙන් හා බොජුන් කිස ඇ කිරීමෙන් ද, සිදුවන දුකුලා ඇවැත් ද,

නහන කල භිත්තියෙහි ද, ටැඹෙහි ද, රුක්හි ද, නහන තැන හිඳ වූ කොරෙස් පුවරුයෙහි ද, ඇඟ ඉලීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

වඳුරන්ගේ අත් වැනි දඬු අතින් ද කුරුඳු ගල් සුණු ලාකඩ හා මිශ්‍ර කොට කරන ලද ගුලික කලාපයෙන් ද, ඔවුනොවුන් සිරුරු එකට ඉලීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

නොගිලන් වැ ආරාමයෙන් පිටත වහන් පයලා යාමෙන් ද, සබ්බනීල පීත ලොහිතාදී වහන් පයලා යාමෙන් ද, රාග සිතින් මිනිස් අමිනිස් තිරිසන් මාගමුන් නිමිති බැලීමෙන් ද, භික්‍ෂාව දෙන මාගමගේ මුහුණ බැලීමෙන් ද, කැඩපත් හා දියබඳුන් ආදියෙන් සිය මුහුණ බැලීමෙන් ද, උසසුන් මහස්නෙහි හිඳීමෙන් හා සැතපීමෙන් ද සිදුවන දුකුලා ඇවැත් ද,

උක්‍ෂෙපනීය කර්‍මය ලැබුවහු ද, නානා සංවාසකයා ද, අනුප-සම්පන්නයා ද, භික්‍ෂුණීය හා මාගම ද, වැඳීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

පණ්ඩක, ස්ත්‍රී, උභතොබ්‍යඤ්ජනකයන් හා එක් ආසනයෙහි හිඳීමෙන් හා සයනය කිරීමෙන් වන දුකුලා ඇවැත් ද, අසමානා-සනිකයන් හා අදීඝාසනයෙහි හිඳීමෙන් හා සයනය කිරීමෙන් ද, සිදුවන දුකුලා ඇවැත් ද,

කුලසංග්‍රහය පිණිස මල්ගෙඩි ආදිය දීමෙන් වන දුකුළා ඇවත ද, මල් ගෙතීම් ගෙතවීම් ආදියෙන් සිදුවන දුකුළා ඇවැත් ද, තිස ගැනීමට සුදුසු වූයෙක් වැ තිස නොගෙන විසීමෙන් වන දුකුළා ඇවත ද,

අනුදත්තවුන්ට හැර සෙස්සනට වෙදකම් කිරීමෙන් හා කරවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද,

සාපත්තික වැ පොහොය පවාරණ කිරීමෙන් සිදුවන දුකුළා ඇවත ද, වසාලිය හැකි දොර ඇති සෙනස්නෙහි දොර නොවසා "දොර ආරක්‍ෂාකරගනුව" යි යන නියමයක් හෝ ආභොග හෝ නො කොට දහවල් නිදීමෙන් සිදුවන දුකුළා ඇවත ද,

සියලු රතන වර්‍ග ද, දැරූලොහමයාදි ස්ත්‍රීරූප ද, ස්ත්‍රී පළඳනා ද, තූර්‍ය්‍යභාණ්ඩ හා ආයුධ භාණ්ඩ ද ගස්හි තුබූ සැ ඵුත ඵලාඵල ද, හැල් ආදි පූර්‍වාපර්ණය ද, මුං උඳු ආදි අපර්ණය ද, ඇල්ලීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද,

දන්තමයාදි පණවෙකින් හෝ අත්පණවය යි කියන ලද ඇඟිලිවලින් හෝ ඉටි මුසු තෙලින් හා දිය මුසු තෙලින් ද අලංකාර පිණිස කෙස් මට කිරීමෙන් හා කරවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද,

බොහෝ භික්‍ෂූන් එකක් ඇඳ හෝ එකක් පෙරවා සයනය කිරීමෙන් සිදුවන දුකුළා ඇවත ද, එක බඳුනක දෙනමක් වැළඳීමෙන් සිදුවන දුකුළා ඇවත ද, වඩු අගලකට වඩා මහත් වූ අට අඟලකට ඔඩා දික් වූ දැහැටි වැළඳීමෙන් සිදුවන දුකුළා ඇවත ද,

නටනු, ගනු, වයනු බැලීමෙන් හා ඇසීමෙන් ද සෙදැවීමෙන් ද සිදුවන දුකුළා ඇවැත් ද, පවුරු හා බිත්ති පිටිපස නොබලා මල මූත්‍රාදිය දැමීමෙන් හා දැම්මවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද, ගොයම් ආදිය තිබෙන තන්හි ද මල මූත්‍රාදිය දැමීමෙන් හා දැම්මවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද, දික්වූ කෙස් නිය නාසිකා ලෝම නොකැපීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද,

නොගිලන් වැ කිසිලි හා නිම්තිපෙදෙස්හි ලෝම සිඳීමෙන් හා සිඳුවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද, නිය මට කිරීමෙන් හා කරවීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද; පිරියම් කළ බිම තෙත් පයින් හෝ වහන් සුත් පයින් පෑගීමෙන් සිදුවන දුකුළා ඇවැත් ද,

සඟ සතු ඇඳ පුටුද පිරියම් කළ බිත්ති ද සිරුරු පහස ගෑන්වී-මෙන් සිදුවන දුකුලා ඇවැත් ද; සිවුරු දුෂපරිභොගයට පැමිණ වීමෙන් සිදුවන දුකුලා ඇවත ද; පටිය නොබැඳ ගම් වැදීමෙන් සිදුවන දුකුලා ඇවත ද,

සිරුර කිස කොට ජලය තිබියදී දිය කිස නොකිරීමෙන් සිදු වන දුකුලා ඇවත ද, පස්සහදූමියන් අකැප විධියෙහි යෙදවීමෙන් සිදුවන දුකුලා ඇවත ද, සභාගාපත්ති දෙසීමෙන් හා පිළිගැනී මෙන් ද, ආරොචනය කිරීමෙන් ද සිදුවන දුකුලා ඇවැත් ද, වස් නොවිසීමෙන් සිදුවන දුකුලා ඇවත ද, තිකරුණේ සතිකරණ යෙන් යාමෙන් සිදුවන දුකුලා ඇවත ද,

උවදුරක් නොමැතිව බඹයකට වඩා ගසකට නැගීමෙන් සිදුවන දුකුලා ඇවත ද, පෙරහන්කඩ නැතිව දිගමගට පැමිණී මෙන් සිදුවන දුකුලා ඇවත ද, මාගීයෙහි පෙරහන්කඩ නැති භික්‍ෂුවක් එය ඉල්ලත් මැ නොදීමෙන් සිදුවන දුකුලා ඇවත ද; තමා මැරීමෙන් හා මැරවීමෙන් සිදුවන දුකුලා ඇවත ද; සිතුයම් පෙනෙලි රූ කිරීමෙන් හා කරවීමෙන් සිදුවන දුකුලා ඇවත ද වළඳන භික්‍ෂුවක් හුනස්නෙන් නගා සිටුවීමෙන් සිදුවන දුකුලා ඇවත ද, බොජුන්හල වැඩිමහලු මහණුන්ට අවකාශ නොතබා හිඳීමෙන් සිදුවන දුකුලා ඇවත ද, තෙරුවන් අරභයා කෙළිවදන් කීමෙන් සිදුවන දුකුලා ඇවත ද;

මෙරමා පිරිස් උපලාලනයෙන් (=තමහට උවටැන් කරවනු පිණිස "තොපට සිවුරුආදිය දෙමි!,, යනාදීන් නැලවීමෙන්) සිදු වන දුකුලා ඇවත ද, ලොකායත ශාස්ත්‍ර ඉගෙණීමෙන් හා ඉගැන් වීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, නරකෙස් හැරීමෙන් හා හැර වීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද,

තඹ ලොහො ආදියෙන් කළ පාතටු මත පය තබා වැළඳීමෙන් සිදුවන දුකුලා ඇවතද, ඉටීමට පමණ ඇති පාත්‍රය අතීන්ගෙන දොර කවුළු හැරීමෙන් හා වැසීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, තෙත් පාත්‍රය තැන්පත් කොට තැබීමෙන් හා නොවියලීමෙන් ද සිදුවන දුකුලා ඇවැත් ද, අව්වේ තබා පාත්‍රය නොඋණුසුම් කිරිමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, ආධාරණයක් නොමැතිව පාත්‍රය බිම තැබීමෙන් සිදුවන දුකුලා ඇවත ද, ඇඳ පුටුවල හා ඇකයෙහි ද, පිටිපත්ලෙහි හා ඡත්‍රයෙහි ද, නිසවත්තෙහි (=පිටිපස කළ තුනී පිලෙහි) හා මීඪනතයෙහි (=පිල් කෙළවරෙහි) ද පාත්‍රය තැබීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, සපන ලද කටු ඇට ආදිය

පාත්‍රයෙහි දැමීමෙන් සිදුවන දුකුලා ඇවත ද, පාත්‍රයෙහි අත දෙවීමෙන් සිදුවන දුකුලා ඇවත ද, ඉඳුල් දිය පාත්‍රයෙන් ගෙන යාමෙන් වන දුකුලා ඇවත ද, අකැප පාත්‍ර පරිභොගයෙන් සිදුවන දුකුලා ඇවත ද,

මෙරමා කිබිසු කල ආවැඩිමෙන් සිදුවන දුකුලා ඇවත ද, අනාදරිය පිණිස සෙඛියාවෙහි නොහික්මීමෙන් සිදුවන දුකුලා ඇවත ද, ඇදුරුවත්, තෙරවත්, ආගන්තුකවත්, ගමිකවත්, සෙනසුන්වත්, ගිලන්වත් නොපිරීමෙන් සිදුවන දුකුලා ඇවැත් ද, යනාදී උදෙස මුත්තක දුක්කටාපත්තීහු ද, යන මේ හැම දුෂ්කෘතාපත්තිස්කන්ධය යි.

(7) දුබ්භාෂිතාපත්ති ස්කන්ධය කවරේද යත් :–

"හීනුක්කට්ඨෙහි උක්කට්ඨං—හීනං වා ජාති ආදිහි
උජුංවාඤ්ඤපදෙසෙන—වදෙ දුබ්භාසිතං ද්වා" යි

දක්වුණු හෙයින්:–

1. හීන ජාතික උපසම්පන්නයෙක් හට කෙළිරිසියෙන් සෘජුව හෝ පය්‍යාය වචනයෙන් හෝ හීන ජාතියෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීනජාත්‍යාමසවාද) දුබ්භාසිතාපත්තිය ද,

2. හීන ජාතික උපසම්පන්නයෙක් හට ක්‍රීඩා අදහසින් සෘජුව හෝ පය්‍යාය වචනයෙන් හෝ උත්කෘෂ්ට ජාතියෙන් ගටා බිණීමෙන් සිදුවන (හීනපණීත ජාත්‍යාමසවාද) දුබ්භාසිතාපත්තිය ද,

3. උත්කෘෂ්ට ජාතික උපසම්පන්නයෙක් හට එසේ ම හීන ජාතියෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීන ජාත්‍යාමසවාද) දුබ්භාසිතා පත්තිය ද,

4. උත්කෘෂ්ට ජාතික උපසම්පන්නයෙක් හට එසේම උත්කෘෂ්ට ජාතියෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීත ජාත්‍යාමසවාද) දුබ්භාසිතා පත්තිය ද;

5. හීන නාමික උපසම්පන්නයෙක් හට එසේ ම හීන නාමයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීන නාම ඔමසවාද) දුබ්භාසිතා පත්තියද,

6. හීන නාමික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට නාමයෙන් ගටා බිණීමෙන්ම සිදුවන (හීන පණීත නාම ඔමසවාද,) දුබ්භාසිතා පත්තිය ද,

7. උත්කෘෂ්ට නාමික උපසම්පන්නයෙක්හට එසේ ම හීන නාමයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීන නාම ඔමසවාද) දුබ්භාසිතා පත්තිය ද,

8. උත්කෘෂ්ට නාමික උපසම්පන්නයෙක්හට එසේ ම උත්කෘෂ්ටනාමයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීතනාම ඔමසවාද) දුබ්භාසිතාපත්තිය ද,

9. හීන ගොත්‍ර ඇති උපසම්පන්නයෙක් හට එසේම හීන ගොත්‍රයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීන ගොත්ත ඔමසවාද) දුබ්භාසිතා පත්තිය ද,

10. හීන ගොත්‍ර ඇති උපසම්පන්නයෙක් හට එසේම උත්කෘෂ්ට ගොත්‍රයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීනපණීතගොත්ත ඔමසවාද) දුබ්භාසිතාපත්තිය ද,

11. උත්කෘෂ්ට ගොත්‍ර ඇති උපසම්පන්නයෙක් හට එසේ ම හීන ශ්‍රොත්‍රයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීන ගොත්ත ඔමසවාද) දුබ්භාසිතාපත්තිය ද,

12. උත්කෘෂ්ට ගොත්‍ර ඇති උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට ගොත්‍රයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීත ගොත්ත ඔමවාද) දුබ්භාසිතා පත්තිය ද,

13. හීන කර්ම්මික උපසම්පන්නයෙක් හට එසේ ම හීන කර්මයෙන් ගටා බිණීමෙන් සිදුවන ( හීන හීනකම්ම ) දුබ්භාසිතා පත්තිය ද,

14 හීන කර්ම්මික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට කර්මයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන පණීත කම්ම)දුබ්භාසිතා-පත්තිය ද,

15. උත්කෘෂ්ට කර්ම්මික උපසම්පන්නයෙක් හට එසේ ම හීන කර්ම්මයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීන කම්ම) දුබ්භාසිතා පත්තිය ද,

16 උත්කෘෂ්ට කර්ම්මික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට කර්ම්මයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීත කම්ම) දුබ්භාසිතා පත්තිය ද,

17. හීන ශිල්පික උපසම්පන්නයෙක් හට එසේ ම හීන ශිල්පයෙන් ගටා කිණීමෙන් සිදුවන (හීන හීනසිප්ප) දුබ්භාසිතා පත්තිය ද;

18. හීන ශිල්පික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට ශිල්පයෙන් ගටා කිණීමෙන් සිදුවන (හීනපණීතසිප්ප) දුබ්භාසිතාපත්තිය ද,

16. උත්කෘෂ්ට ශිල්පික උපසම්පන්නයෙක් හට එසේම හීන ශිල්පයෙන් ගටා කිණීමෙන් සිදුවන (පණීත හීන සිප්ප) දුබ්භාසිතා පත්තිය ද,

20. උත්කෘෂ්ට ශිල්පික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට ශිල්පයෙන් ගටා කිණීමෙන් සිදුවන (පණීත පණීත සිප්ප) දුබ්භාසිතා පත්තිය ද,

21. හීනාබාධික උපසම්පන්නයෙක් හට එසේ ම හීනාබාධයෙන් ගටාකිණීමෙන් සිදුවන(හීන හීනාබාධ)දුබ්භාසිතා පත්තිය ද,

22. හීනාබාධික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ටාබාධයෙන් ගටා කිණීමෙන් සිදුවන (හීන පණීතාබාධ) දුබ්භාසිතාපත්තිය ද,

23. උත්කෘෂ්ටාබාධික උපසම්පන්නයෙක් හට එසේ ම හීනාබාධයෙන් ගටා කිණීමෙන් සිදුවන (පණීතහීනාබාධ) දුබ්භාසිතා පත්තිය ද,

94. උත්කෘෂ්ටාබාධික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ටාබාධයෙන් ගටා කිණීමෙන් සිදුවන(පණීත පණීතාබාධ) දුබ්භාසිතා පත්තිය ද,

25. හීන සණ්ඨානික උපමපපන්නයෙක් හට එසේ ම හීන සණ්ඨානයෙන් ගටා කිණීමෙන් සිදුවන (හීන හීන සණ්ඨාන) දුබ්භාසිතා පත්තිය ද,

26. හීන සණ්ඨානික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට සණ්ඨානයෙන් ගටා කිණීමෙන් සිදුවන (හීන පණීත සණ්ඨාන) දුබ්භාසිතා පත්තිය ද,

27. උත්කෘෂ්ට සණ්ඨානික උපසම්පන්නයෙක් හට එසේ ම හීන සණ්ඨානයෙන් ගටා කිණීමෙන් සිදුවන (පණීත හීන සණ්ඨාන) දුබ්භාසිතා පත්තිය ද,

28. උත්කෘෂ්ට සණ්ඨානික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ට සණ්ඨානයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීත සණ්ඨාන) දුබ්භාසිතා පත්තිය ද,

29. සකෙලශික උපමපපන්නයෙක් හට එසේ ම සකෙලශභාවයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීන කිලෙස) දුබ්භාසිතා පත්තිය ද,

30. සකෙලශික උපසම්පන්නයෙක් හට එසේ ම නිෂ්කෙලශභාවයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන පණීත කිලෙස) දුබ්භාසිතා පත්තිය ද,

31. නිෂ්කෙලශික උපසම්පන්නයෙක් හට එසේ ම සකෙලශික භාවයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීන කිලෙස) දුබ්භාසිතා පත්තිය ද,

32. නිෂ්කෙලශික උපසම්පන්නයෙක් හට එසේ ම නිෂ්කෙලශික භාවයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීත කිලෙස) දුබ්භාසිතා පත්තිය ද,

33. හීනාපත්තික උපසම්පන්නයෙක් හට එසේ ම හීනාපත්තියෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීනාපත්ති) දුබ්භාසිතා පත්තිය ද,

34. හීනාපත්තික උපසම්පන්නයෙක් හට එසේ ම ප්‍රණීතාපත්තියෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන පණීතාපත්ති) දුබ්භාසිතා පත්තිය ද,

35. උත්කෘෂ්ටාපත්තික උපසම්පන්නයෙක් හට එසේ ම හීනාපත්තියෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත හීනා පත්ති) දුබ්භාසිතා පත්තිය ද,

36. උත්කෘෂ්ටාපත්තික උපසම්පන්නයෙක් හට උත්කෘෂ්ටාපත්තියෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීත පණීතාපත්ති) දුබ්භාසිතා පත්තිය ද,

37. හීනාක්‍රොශික උපසම්පන්නයෙක්හට එසේ ම හීනාක්‍රොශයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන හීනාක්කොස) දුබ්භාසිතා පත්තිය ද,

38. හීනාක්‍රොශික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගටා බිණීමෙන් සිදුවන (හීන පණීතාකොකාස) දුබ්භාසිතාපත්තිය ද,

39. උත්කෘෂ්ටාක්‍රොශික උපසම්පන්නයෙක්හට එසේ ම හීනාක්‍රොශයෙන් ගටාබිණීමෙන් සිදුවන (පණීත හීනාකොකාස) දුබ්භාසිතා පත්තිය ද,

40. උත්කෘෂ්ටාක්‍රොශික උපසම්පන්නයෙක් හට එසේ ම උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගටා බිණීමෙන් සිදුවන (පණීතාකොකාස) දුබ්භාසිතාපත්තිය ද යන මේ සමසතළිස් ඇවැත්හු දුබ්භාෂිතා පත්තිස්කන්ධය යි.

මෙසේ සප්තාපත්තිස්කන්ධ වශයෙන් ප්‍රභෙදයට පැමිණියා වූ ශික්ෂාපදශීලය යි කියන ලද ප්‍රාතිමොක්ෂ සංවර ශීලයට ඇතුළත් ශික්ෂාපදයෝ සැදැහැයෙන් සසුන්වත් කුල පුත්‍රයන් විසින් නිරවශෙෂයෙන් සමාදන් වැ ජීවිතයෙහි දු අපෙක්ෂා රහිත වැ මනාව අරක්ෂා කටයුත්තෝය, මේ ශිලසංවරය යි කියනලද, ප්‍රාතිමොක්ෂ සංවරශීලය යි.

(2) සතිසංවරය නම් ඉන්ද්‍රිය සංවර ශීලය යි, හේ කෙසේද යත්:-

'සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති. නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, සොතෙන සද්දං සුත්වා=පෙ=ඝාණෙන ගන්ධං ඝායිත්වා=පෙ=ජිව්හාය රසං සායිත්වා=පෙ=කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී =පෙ= මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති,,

(=ඒ ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙහි පිහිටි මහණ තෙමේ චක්ඛු විඤ්ඤාණයෙන් වර්ණායතන සංඛ්‍යාත රූපය දැක ස්ත්‍රී සන්තාන ගත රාගොත්පත්තියට හේතු වූ ඉෂ්ටාරම්මණය යි කියන ලද ශුභ නිමිත්තාදියක් හෝ නොගන්නේ වේද, මතු මතු මෙහි කෙලෙසුන් පහළ කරණ බැවින් අනුව්‍යඤ්ජන නම් වූ අත්, පා, මදසිනා මහසිනා, කථා, බැලීම් ආදී භෙද ඇති ආකාරය නොගන්නේ වේද, (ඒ ශරීරයෙහි විද්‍යමානවූ කෙශ ලොමාදියක් හෝ භූතොපාදාය රූපමාත්‍රයක් හෝ ගනී ද,) චක්ෂුරින්ද්‍රියයා ගේ අසංවරය හේතුකොට ගෙන නොවසන ලද සිහි නමැති දොර ඇතිව වාසය

හේතු කොටගෙන නොවසන ලද සිහි නමැති දොර ඇතිව වාස ය කරන්නාවූ ඒ භික්ෂුවකරා අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත පවිටු අකුශලධර්මයෝ අනුවදනාහු වෙත් ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ ආරක්ෂාවට හා සංවරයට පැමිණෙයි ද,

කණින් ශබ්දයක් අසා, නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට දිවින් රසයක් විඳනය කොට කයින් පහසක් ඵුසනය කොට සිතින් අරමුණක් දැන නිමිත්තග්‍රහණය නොකෙරෙයි ද, අනුව්‍යඤ්ජන ග්‍රහණය නොකෙරෙයි ද, =පෙ= මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි ද,, ) මේ ඉන්ද්‍රිය සංවර ශීල නම් වේ.

මෙහි, ඉන්ද්‍රියයන් පිළිබඳ සංවරය හා අසංවරය කෙසේ වේද යත්:- යම් විටෙක රූප අරමුණක් ඇසට හමු වේ ද, එකල්හි භවාඞ්ගචිත්ත දෙවරක්. ඉපිද නිරුද්ධ වූවාට පසු කිරිය මනොධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජන චිත්තය ආවර්ජන කෘත්‍යය සිදුකෙරෙමින් එක් වරක් ඉපිද නිරුඬ වේ. අනතුරුව චක්ෂුර්විඥානය දර්ශන කෘත්‍යය කෙරෙමින් එක් වරක් ද, ඉන්මතු විපාක මනොධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තය අරමුණු පිළිගැනීම සිදුකෙරෙමින් එක් වරක් ද, ඉක්බිති විපාකාහෙතුක මනොවිඥානධාතු නම් වූ සන්තීරණ චිත්තය අරමුණ තීරණය කෙරෙමින් එක් වරක් ද, එයට පසු කිරියාහේතුක මනොවිඥානධාතු නම් වූ වොත්ථපන චිත්තය අරමුණ නිශ්චය කෙරෙමින් එක් වරක් ද, ඉපිද නිරුඬ වේ. එයට අනතුරුව සත්වරක් ජවනය ඉපිද නිරුඬවේ

මෙපමණ චිත්තයන් අතුරෙන් භවාඞ්ග සිත් උපදනා කල්හිද, ආවර්ජනාදී එක්තරා සිතක් උපදනා කල්හිද සංවරයක් හෝ අසංවරයක් නැත්තේ ය.

ඉදින් ජවන් සිත් උපදනාකල්හි අමනසිකාරය හේතුකොට ගෙන අහිරික අනොත්තප්පාදී අකුශල පක්ෂයෙහි වූ චෛතසික ධර්මයන් ඒ ජවනයන් හා යෙදීමෙන් දුස්සීල බවක් හෝ සිහි මුළාවක් හෝ නොදැනීමක් හෝ නොඉවසීමක් හෝ කුසීත බවක් හෝ උපදීද? එකල ඉන්ද්‍රියයන් පිළිබඳ අසංවරය ලැබෙයි.

මෙසේ ජවනක්ෂණයෙහි පවත්නා අසංවරයට චක්ෂුරින්ද්‍රියයෙහි අසංවරය යි කියනු ලැබේ. කුමක් හෙයින්ද? යත්: යම් හෙයකින් ජවනක්ෂණයෙහි අසංවරය ඇතිවීමෙන් චක්ෂුරාදී ද්වාරයෝ ද, භවාඞ්ගයෝ ද, ආවර්ජනාදී වීථි චිත්තයෝ ද, නොරක්නා ලද්දාහු ම වෙද්ද? එහෙයිනි. එයට උපමා කවරේද? යත්:-

නුවර දොර නොවැසූ කල්හි කිසිසේත් ඇතුළු නුවර ගෘහවාර කොෂ්ඨක ගර්භාදිහු වසන ලද්දාහු නමුදු එහි සියලු භාණ්ඩ නොරක්නා ලද්දාහු ම වෙති. එය එසේමැයි. සොරු නුවර දොරින් ඇතුල් වැ රිසි රිසි දෙය පැහැර ගෙනයන්නාහුය. එසේම ජවනක්ෂණයෙහි දුශ්ශීල භාවාදිය ඇතිවීමෙන් ජවන චිත්තයන්ගේ සංවරය නැතිවත් මැ චක්ෂුරාදී ද්වාරයෝද, ආවර්ජනාදි සෙසු චිත්තයෝ ද, නොරක්නා ලද්දාහුම වෙති. ඒ ජවන චිත්තයෙහි යොනිසොමනස්කාර හේතුවෙන් කුශලපක්ෂයෙහි වූ සමෘති ප්‍රඥ ක්ෂාන්ති වීර්‍ය්‍ය සංඛ්‍යාත චෛතසික ධර්මයන් හා යෙදුණු ශීලාදි ගුණ උපන් කල්හි චක්ෂුද්වාරය ද රක්නාලද්දේමය. භවාඞ්ගයන් හා ආවර්ජනාදී වීථිචිත්තයෝ ද රක්නාලද්දාහුම වෙති. නුවර දොර වැසූ කල්හි ඇතුල් නුවර ගෘහ ආදීය නොවසන ලද්දාහු නමුදු එහි සියලු භාණ්ඩ සුරක්ෂිත වෙති. එසේ ම සොරුන්ට ඇතුල් වීමට නොහැකි ද වෙති. එමෙන් ම ජවනක්ෂණයෙහි සීල සංවරාදී සංවර ධර්මයන් පහළවෙත් මැ චක්ෂුරාදී ද්වාරයෝද රක්නා ලද්දාහු මවෙති. භවාඞ්ගයන් හා ආවර්ජනාදී වීථිචිත්තයෝ ද රක්නා ලද්දාහු ම වෙති. එහෙයින් ජවනක්ෂණයෙහි උපදනා සීල සංවරාදිය ම චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය නමැයි දතයුතු. කන් ආදී අනෙක් ඉඳුරන්ට ලැබෙන ශබ්දාදිය පිළිබඳව ද මෙම ක්‍රමය මැයි.

මෙසේ සැකෙවින් රූපාදියෙහි කෙලෙසුන්ගේ අනුබැඳීම් ඇති නිමිත්ත අනුබ්‍යඤ්ජනග්‍රහණය දුරුකිරීම ලක්ෂණ කොට ඇත්තාවූ සිහියෙන් රැක්කයුතු ශීලය ඉන්ද්‍රියසංවරශීලය යී, හේ මෙහි සතිසංවරය යි දන්නාලැබේ.

(3) ඤාණසංවරය කවරේද යත්:—

ආයුෂ්මත් අජිත තෙමේ පාරායනයෙහි භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාළේ ය, හේ මෙසේ යි:—

**“සවන්ති සබ්බධි සොතා–(ඉච්චායස්මා අජිතො)සොතානං–**
**කිං නිවාරණං,**
**සොතානං සංවරං බ්‍රෑහි–කෙන සොතා පිථීයරෙ” ති,**

(=තෘෂ්ණා අභිධ්‍යා ව්‍යාපාදාදී ක්ලේශ ශ්‍රොතයෝ තෘෂ්ණාදීන්ට ආරම්මණ වූ රූපාදී සියලු අයතනයන්හි ගලා බසිත්, ඒ තෘෂ්ණාදී ශ්‍රොතයන්ගේ ආවරණය වළළු මැනවි, කවර හේතුවකින්

තෘෂ්ණාදී ක්ලේශශ්‍රෝතයෝ සිඳීයද්ද? ආයුෂ්මත් අජිත තෙමේ මෙසේ විචාළේය.” මෙහි පුලුවුත් පද සතරෙකි. ඔවුහු ප්‍රශ්න වශයෙන් දෙකෙකි. කුමක් හෙයින්ද යත්:—

යම් හෙයකින් මේ ගාථාවෙන් ගන්නාලද සමෘති ප්‍රඥා සංඛ්‍යාත මේ ධර්මයෝ දෙදෙන බොහෝ කරුණු අධිකාර කොට පැවැති වචනයෙන් විචාරණ ලද්දාහුද? එහෙයිනි! මෙයට විසඳුන් වදාළ බුදුහු :—

**“යානි සොතානි ලොකස්මිං-(අජිතාති භගවා)**
**සති තෙසං නිවාරණං,**
**සොතානං සංවරං බ්‍රෑමි-පඤ්ඤායෙතෙ පිථියරෙ” යි,**

වදාළෝ. ඒ තෘෂ්ණාදී ශ්‍රෝතයන්ගේ වැළැක්මට හේතුවූවා, කුශලාකුශල ධර්මයන්ගේ ගතිය මනාකොට සොයන්නාවූ විදර්ශනා සම්ප්‍රයුක්ත සමෘති තොමෝය. රූපාදී ආරම්මනයන්හි අනිත්‍යාදීන්ගේ ප්‍රතිවෙධය සිඩකරන මාර්ගප්‍රඥාවෙන් මූල් සිඳ හරණාහුය.

කායගතාසතිය භාවිත කරත් මැ චක්ෂුප්‍රසාදය මනාප වූ රූපාරම්මණයන්හි චිත්තසන්තාන හෝ පුද්ගලයා ඇද නො ගනී. අමනාප රූපාරම්මනයන්හි නො හැපේ. (ශ්‍රොතාදිය ද එසේමය.) කවර හේතුවකින් ද? ඉන්ද්‍රියයන් සංවරණයෙන් වළකාලූ බැවිනි; කුමකින් ඒ ඉන්ද්‍රියයෝ සංවරණයෙන් වළකන ලද්දේ ද? සමෘති ආරක්ෂාවෙහි මාර්ගඥානයෙන් කාමාදි අනුශයකෙලශයෝ පහවෙත්. අනුශය ප්‍රහාණයවත් මැ නැවත නැවත නැඟී සිටින කෙලෙස් පහවෙත්. කිනම් හේතුවකින්දයත්: අනුශය පහව ගිය බැවිනි; හේ මෙසේයි:- සඳත් ඇති රුකෙක් සියලු මූල් උදුරා දමත් මැ මල් පල ලපලු අකුරු පරපුර අතිශයින් සුන් වූවා වේ ද? එමෙන් ම අනුශය ප්‍රහාණයවත් මැ, නැවත නැවත නැඟී සිටින කෙලශ පරම්පරාව අතිශයින් සිඳුනී—වැනසුනී වන්නීය. කිනම් හේතුවකින් ද? ප්‍රඥාවෙනි; එහෙයින් වදාළහ. **“පඤ්ඤායෙතෙ පිථියරෙ”** යි මෙයින් කියැවුණේ ඥාන සංවරය යි. ප්‍රත්‍යය ප්‍රතිසෙවනය ද හෙවත් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ද මෙහි ම සංග්‍රහයට පැමිණෙයි, හේ කෙසේදයත්:—

**“පටිසඞ්ඛා යොනිසො** චීවරං **පටිසෙවති යාවදෙව සීතස්ස පටි ඝාතායාති ආදිනා** පන නයෙන **වුත්තො පටිසංඛාන පරිසුද්ධො චතුපච්චය පරිභොගො පච්චය සංනිස්සිත සීලං නාම”** යනු වදාළ බැවින් නුවණින් පස්විකා සිවුරු වැළඳ

ගනී ද, ''යම්තාක් සිත පීඩා නසනු පිණිස'' යනාදීන් දක්වනලද ප්‍රත්‍යවෙක්‍ෂායෙන් පිරිසුදු වූ සිවුපස පරිභොගය නොහොත් එසේ පැවැති **නිරවද්‍ය චෙතනාව** ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල නම්වේ. විස්තර විසින් කියත් මැ මිථ්‍යා ජීවයෙන් වෙන් වැ දැහැමින් සෙමෙන් ලබන ලද චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යි කියනලද සිවුපසය ඒ ඒ ප්‍රත්‍යය පිළිබඳ ව වදාළ ප්‍රත්‍යවෙක්‍ෂායෙන් නුවණින් සලකා ප්‍රයොජන ගැනීමෙහි උපදනා අනවද්‍ය චෙතනාව පත්‍යය සන්නිශ්‍රිත ශීලය යි දතයුතුයි.

එහි, i චීවර **පරිභොගය පිළිබඳ ප්‍රත්‍යවෙක්‍ෂාව** මෙසෙයැ ''පටිසංඛායොනිසො චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්‍ථං'' යනුයි.

(=නුවණින් පස් විසා සිවුරු වැළඳගන්නේය. යම්තාක් ම (''යාවදෙව'') මෙයැ ප්‍රයෝජනය විඳින සීමාව නියම කොට කියන වචනය යි මෙයින් සීත විනෝදය පිණිස ය යනාදී යම් ප්‍රයොජනයක් දක්වනු ලැබේනම් යොගාවචරයාගේ චීවර පරිභොගයෙහි ප්‍රයෝජනය මෙපමණෙක්ම වෙයි, මින් වැඩියක් නැතැයි දක්වයි, ආධ්‍යාත්මික ධාතුක්‍ෂොභ වශයෙන් හෝ බාහිර සෘතු පෙරළීම් වශයෙන් හෝ උපන් සීත නසනු පිණිස ද (සිරුර සීතෙන් පහරත් මැ එකග නොවූ සිත් ඇතියේ නුවණින් වියඹී කරනු නොහැකි වෙයි. එහෙයින් සීත නසනු පිණිස සිවුර පිරිභොග කටයුතුය යි බුදුහු අනුදත්සේක.'' උණ්හස්ස පටිඝාතාය'' යනාදී සියලු තන්හි ම මේ ක්‍රමයයි.) අග්නි සන්තාපයෙන් වූ උෂ්ණ නසනු පිණිස ද (සූර්‍ය්‍ය සන්තාපය උෂ්ණ වුවත් එය ''ආතප'' යන්නෙන් ගත් හෙයින් මෙය අග්නි සන්තාපය සඳහා දක්විණි.) පිඟුවන් මැස්සෝ ද මදුරුවෝද සරජ අරජාදී භෙද වාතය ද, අවුවද දීඝී ජාතික සර්පයෝද, යන මොවුන්ගේ දෂ්ට කිරීමෙන් හා ස්පර්‍ශයෙන් වන පීඩා නැසීම පිණිස ද, යම්තාක් ම ලජ්ජාව කොපනය කරන අඟ පසඟ වසනු පිණිස ද (නුවණින් පස් විසා සිවුර සෙවනය කරයි.) ''යාවදෙව'' යනු නැවත කිම සර්වකාලික ප්‍රයෝජනයාගේ අවධි වශයෙන් පරිච්ඡෙදය දක්වීම පිණිසයි. ලජ්ජාව කිපෙන අවයව මුවහකිරීම චීවර පරිභොගයාගේ නියත ප්‍රයෝජනය යි, සීත නැසීම් ආදී අනෙක් කරුණු ඇතැම් විටෙක ම ඇතිවන බැවින් අනියත ප්‍රයෝජනය යි දතයුතු යි.)

ii පිණ්ඩපාත පරිභොග ප්‍රත්‍යවෙක්‍ෂාව:—

"පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවති නෙවදවාය නමදාය නමණ්ඩනාය නවිභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණංච වෙදනං පටිහංඛාමි නවඤ්ච වෙදනං නඋප්පාදෙස්සාමි යාත්‍රාච මෙ භවිස්සති අනවජ්ජතාච ඵාසු විහාරොචා"ති යනුයි.

(=නුවණින් පස්විකා පිණ්ඩපාතය සෙවනය කෙරෙයි, ගම් දරුවන් සේ ක්‍රීඩා පිණිස ද නොම වළඳයි, (ක්‍රීඩාවන් මොහ හෙතු වෙන් වන බැවින් ද මොහය වඩන බැවින් ද මොහයට උපනිශ්‍රය නසන පිණිස මෙය කියන ලදී.) මුෂ්ටි යුධ කරන මල්ලවයන් මෙන් බලමද පුරුෂමද වඩනු පිණිස ද නොම වළඳයි, (බලමද පුරුෂමද දෙකම ද්වෙෂයට හේතු බැවින් ද්වෙෂොපනිශ්‍රය නසනු පිණිස මේ දක්විණි.) ඇතොවුරන් වෙසඟනන් සේ අඟපසඟ මහත් වනු පිණිස ද නොම වළඳයි, නළුවන් සේ පහන් සිවි ඔප් නඟනු පිණිස ද නොම වළඳයි. (මේ දෙපද රාගොපනිශ්‍රය පහ-කරනු පිණිස දක්වන ලදී) මේ පදසතරින් ම නුනුවණින් පුරන ප්‍රතිපත්තීන්ගේ ද, කාම සැපයෙහි ඇලී පවත්වන ප්‍රතිපදාවගේ ද, ප්‍රහාණය ප්‍රකාශ කළේ.) යම්තාක් ම පඨවි ආපො තෙජො වායො යන සතර මහාභූතයන් නිසා පවත්නා මේ ශරීරයාගේ පරම්පරා වශයෙන් බොහෝ කලක් පැවැත්ම පිණිස ද, යැපීම පිණිස ද, නොහොත් මේ කය පිළිබඳ ජීවිතෙන්ද්‍රියයාගේ පැවැත්.ම පිණිස ද, ක්‍ෂුධා සංඛ්‍යාත විහිංසාවගේ සංසිඳීම පිණිස ද, ශාසන ඇතුළත් සසුන් බඹසරට නොහොත් මගබඹසරට අනුග්‍රහය පිණිස ද, (පිණ්ඩ පාතය වළඳයි.) මෙසේ වැළඳීමෙන් බොජුන් වැළඳීමට පෙර පැවතුණු ක්‍ෂුධා වෙදනාවද නසමි. කුසගිනි පමණ ඉක්මවා වැළඳීමෙන් වන අලුත් වෙදනාව ද නොඋපදවන්නෙමි. (මෙපමණෙකින් පැවිද්දනට සුදුසු ප්‍රත්‍යය පරිභොගය කී බැවින්, යුක්ත පරිභොග සංග්‍රහය ද, සාදුක් ඇ නැසීම කී බැවින් ආත්ම කිලමථ ප්‍රහාණය ද, ධ්‍යාන සුඛාදීන්ට කාරණවූ ශරීර සැපය වර්ජනය නොකළ බැවින් දැහැමි සැප දුරු නොකිරීම ද, දක්වන ලදී.) සැප අහර පමණ දැන වැළඳීමෙන් මාගේ සතර ඉරියව් පැවැත්ම ද වන්නේය. දැහැමින් පසය සපයා පමණ දැන පිළි ගෙන පස්විකා වැළඳීමෙන් නිරවද්‍ය බවද, සතර පස් පිඩක් පමණ අඩු කොට වැළඳීමෙන් සැප විහරණය ද වන්නේය යි සලකා පිණ්ඩ-පාතය සෙවනය කෙරෙයි.)

මෙහි "නෙවදවාය" යනාදීන් ප්‍රහාතව්‍ය අඞ්ගසතරක් ද, "ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය" යනාදින් භොජනානිසංස අෂ්ටාඞ්ගයක් ද දැක්විණි.

iii සෙනාසන පරිභොග ප්‍රත්‍යවෙක්ෂාව:-

"පටිසංඛා යොනිසො සෙනාසනං පටිසෙවති, යාවදෙව-පෙ-යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං" යනුයි.

එහි "සීතස්ස පටිඝාතාය" යනාදිය පෙරකී සේයි. (=යම්තාක්ම සෘතු පීඩා නසනු පිණිස ද, නොහොත් අසප්පාය සෘතුව හා සිංහ ව්‍යාඝ්‍රාදී ප්‍රකට උපද්‍රව ද, රාගද්වෙෂ ඈ මුවහම් පවත්නා උවදුරු ද, දුරුකරනු පිණිස ද, විවෙක සැපය යි කියනල ද ධ්‍යාන විදර්ශනා ඵල සමාපත්ති ආදියෙහි ඇලීවසනු පිණිස ද, නුවණින් පස්විකා සෙනසුන් සේවනය කරයි.)

iv ගිලාන ප්‍රත්‍යය පරිභොග ප්‍රත්‍යවෙක්ෂාව:-

"පටිසංඛා යොනිසො ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවති, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ජ පරමතායා"ති, යනුයි.

(=යම්තාක් ම උපන්නා වූ ධතුක්ෂොභ ලක්ෂණ වූ හෝ කුෂ්ටපිළිකා දීවූ හෝ ව්‍යාබාධයෙන් හටගත්තාවූ අකුසල විපාක වෙදනාවන්ගේ නැසීම පිණිස ද, නිදුක්බව උතුම්කොට ඇතිබැවි පිණිස ද නුවණින් පස්විකා ගිලන් පස බෙහෙත් පිරිකර හෙවත් ගිලනහුගේ රොග සංසිඳවනු පිණිස වෙදහු ඇණවූ ගිතෙල් වෙඬරු ආදී ජීවිත පරිවාර බෙහෙත් සම්භාරය සේවනය කෙරෙයි,)

මේ ප්‍රත්‍යවෙක්ෂා තොමෝ වර්තමාන ප්‍රත්‍යවෙක්ෂාය, අතීත ප්‍රත්‍යවෙක්ෂා යි විප්‍රකාර වන්නීය. එහි ඒ ඒ ප්‍රත්‍යයන් ලැබුණු කලද, පරිභොග කරන කලද, යට දැක්වුණු ක්‍රමයෙන් ප්‍රත්‍යවෙක්ෂා කිරීම වර්තමාන ප්‍රත්‍යවෙක්ෂා නම් වේ.

සිහි මුළාවකින් හෝ ගිලන් බැව් ආදියක් නිසා හෝ වෙනයම් සුහුසුළු කාරුණක් නිසා හෝ ලද පසය නොපස්විකා පරිභොග කොළේ නම් ඒ මහණ තෙමේ සිල්වත් වතු දු ඍණපරිභොගයෙන් නොමිදෙයි. ප්‍රත්‍යය දායකයනට දැසි දස් කම්කරුවන්ව ඉපදීමෙන් හා ඇත් අස් ගව මහිසාදි අහෙතුක යොනිවල ඉපදීමෙන් බර ඉසිලීම් ආදී බැලමෙහ කොට පමණ කළ නොහැකි ජාතියෙහි විගුණ තිගුණ වශයෙන් එහි ණය ගෙවිය යුතුවෙයි!!

එහෙයින් නොපස් විකා කල ඉකුත්ව ගිය සිවුපස පරිභොගය සඳහා, පෙරවරු පස්වරු පෙරයම මැදුම්යම පසුයම යන පස් තැනක හෝ යටත් පිරිසෙයින් අරුණ නැගීමටපළමු ව එක් වරක් ම වත් කළ යුතු ප්‍රත්‍යවෙක්‍ෂාව අතීත ප්‍රත්‍යවෙක්‍ෂාව නම් වේ. හෝ මෙසේයි:-

"මයා 'පච්චවෙක්ඛිත්වා අජ්ජයං චීවරං පරිභුත්තං තං යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං, යථා පච්චයං පවත්තමානං ධාතුමත්ත මෙවෙතං යදිදං චීවරං තදුපභුඤ්ජකො ච පුග්ගලො ධාතු මත්තකො නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො සබ්බානි පන ඉමානි චීවරානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති" යනාදින් 'සිවුපසය පිළිබඳ එකක් පාසා දෙපරිද්දෙකින් දක්වනලද අතීත පස්විකුම් අටෙක් වෙති. එහි භාවත්ථ මෙසේයි:-

(=මා විසින් අද නොපස්විකා යම් සිවුරක් පරිභොග කරනලද ද එය යම්තාක් සීතනසනු පිණිස ද -පෙ- ලජ්ජාව කිපෙන අඟපසඟ වසනු පිණිස ද (ප්‍රයෝජන ගතිමි.) පසවු පරිදි පවත්නා වූ යම් මේ සිවුරක් වේද, මෙය පඨවි ආපො තෙජො වායො යන ධාතු මාත්‍රයෙක්මය, එය ප්‍රයෝජන ගන්නාවූ පුද්ගල තෙමේ ද ධාතු මාත්‍රයෙක්වෙයි, එහෙයින් සත්ත්වයෙක් ද නැත, ජීවයෙක් ද නැත, ශූන්‍යය, පිළිකුල් නොකටයුතු වූ මේ සියලු සිවුරු මේ කුණුකයට පැමිණ අතිශයින් පිළිකුල් කට යුත්තාහු වෙති.)

පිණ්ඩපාතාදියෙහි ද අයුකල් පස්විකුම් මෙසේ ම දත යුත්තාහ. ප්‍රඥාවන්තයා සිවුපසයෙහි ආදීනව හා ආනිසංස දක්මට සමර්ථ බැවින් මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ප්‍රඥාවෙන් සිඩ කටයුතුවේ. එහෙයින් ප්‍රත්‍යයෙහි ගිජුකම හැරපියා දැහැමින් සෙමෙන් උපන් සිවුපසය යටකීනයින් පස්විකා නුවණින් පරිභොග කරන්නහු විසින් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය සම්පාදනය කටයුතුයි. මෙසේ ප්‍රත්‍යය ප්‍රතිසෙවනය ද ඇතුළත්කොට ඇතියේ ඥාණසංවරයයි.

4 ඛන්ති සංවරයනම්:- අධිවාසන ක්‍ෂාන්තියෙන් සීතොෂ්ණාදිය පිළිබඳ කාමාදී ආශ්‍රවයන් පහකිරීමෙන් ආරක්‍ෂා වීමයි. යේ කෙසේදයත්:-

"ඉධ භික්ඛවෙ භික්ඛු, පටිසංඛා යොනිසො ඛමො හොති! සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය, ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචන පථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පාන‍ං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරාණං, අධිවාසක ජාතිකො හොති යංහිස්ස භික්ඛවෙ, අනධිවාසයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාත පරිළාහා අධිවාසයතො එවංසතෙආසවා විඝාත පරිළාහා න හො-න්ති ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, ආසවා අධිවාසනා පහාතබ්බා,,

(=මහණෙනි, මේ ශාසනයෙහි යොගාවචර මහණ තෙමේ නුව-ණින් උපාය මාර්ගයෙන් සලකාබලා සීතොෂ්ණ සාපිපාසා ඉවසන්-නෙක් වෙයි චපල පුරුෂයකු මෙන් මදපමණකිනු දූ සිතෙන් නොසැලෙයි, කමටහන් නොහරී. වැළිදූ ලොමසනාග තෙරුන්සේ මද කුදු සිතෙන් නොසැලී කමටහන් ම මෙනෙහි කරයි:- තෙරුන්වහන්සේ චනාහි සෑගිරියෙහි පුවඟුලෙන පධන් ගෙහි වසනුයේ නවම් මැදින් දෙමස අතර අටදිනය වන පිනී හෙන සෙමෙහි ලොවතර නිරා පස්විකා කමටහන් නොහරනේ ම අබ්‍යා-වකාශයෙහි කල් ඉක්මවි!

හුදක් යම් භික්‍ෂුවක් අධික උෂ්ණ ඉවසා නම් එම තෙරුන් මෙන් ඒ භික්‍ෂු තෙමේ ද උෂ්ණ ඉවසන්නෙකැ යි දතයුතුය. තෙරුන්වහන්සේ ගිම් සෙමෙහි පසුබත කමටහන් මෙනෙහි කරමින් සක්මනින් පිටත වැඩහුන්නේය. ඔහු කැසින් ඩහ මිදෙති, අතවැසි තෙමේ "වහන්ස, මෙපෙදෙස සිහිල්ය! මෙහි වැඩ හිඳිනා සේක්ව" යි කීය. තෙරුන්වහන්සේ "ඇවැත්නි, උෂ්ණුසුම් බියෙන් ම මෙහි හිඳිනු රිසියෙමි,, යි අවීචිමහනිරය ප්‍රත්‍යවෙක්‍ෂා කොට ම වැඩ උන්නේය. යමෙක් දෙතුන් වාර— යෙකැ බතක් හෝ පැනක් නොලබනුයේද; අක්මුල් නැති සසර තමාගේ ප්‍රේතලොකොතපන්තිය මෙනෙහි කොට නොසැල මින් කමටහන් නොහරනේය

රාත්‍රියෙහි පධන් වීර්‍ය්‍යයෙන් කල්ගත කොට සිටි තෙරුන් වහන්සේට උදර වාතයෙක්. උපන. හේ එය ඉවසිය නොහැකිව ඔබි මොබ පෙරලෙයි. සක්මනැ පසෙකැ සිටි පිණ්ඩපාතික තෙර නමක් ඔහුට ඇවැත්නි, "පැවිදිවරයෙක් නම් ඉවසන ගති ඇති යෙක් වේය"යි කීය හේ වහන්ස, මැනැවැ!යි ඉවසා නොසැලී

අධික වූ පිගුවන් මැසි මදුරු වා අවු පහසින් පුස්නා ලදුයේ තමුදු තිරිසන් උපැත් පස්විනා නොකැපෙමින් කමටහන් නොහ-රනේය. දික්දෑ සපු පහසින් පුස්නා ලදුයේ ද අක්මුල් නැති සසර සිහ වග ඈ සැඩ සතුන් මුවතුළ නෙකවර වැටුණු විරූබැව් පස්විනා පධානිය තෙරුන් මෙන් නොසැලෙනුයේ කමටහන් නොහරනේමය.

කඩසළු වෙහෙර කිණිහිරි පධන්ගෙහි ආයඹිවංශය අසමින් සිටි තෙරුන්වහන්සේ දරුණු විෂඇති සපියෙක් දෂ්ටකෙළේය. ඒ බව දත් තෙරණුවෝ පහන් සිතින් වැඩහිඳ දහම් ම අසති. විෂ-වේගය අධිකවිය. තෙරුන් වහන්සේ උපසම්පදා මාලකයෙහි පටන් සිල් බලා පිරිසුදු සිල් ඇතියෙමි සි, සතොස් පහළ්කළෝ. එකෙණෙහි විෂ බැස්සේය. තෙරුන් වහන්සේ එහිදී ම සිත් එකඟ බැව් ලැබ විදසුන් වඩා රහත් බැව් පසක් කළෝය.

යමෙක් අක්‍රොශ වශයෙන් නපුරු කොට කියන ලද්දවුද එහෙයින්ම නපුරුකොට පැමිණියාවූ ද, අන්තිම වස්තුවෙන් යුත් වාක්පථයන් අසා දීඝභාණක අභය තෙරුන් සේ ක්ෂාන්තිගුණයම මෙනෙහි කොට නොසැලේද, හේ දුරුත්ත දුරාගත වාක්පථයන් ඉවසන්නෙකැ යි දතයුතු.

තෙරුන්වහන්සේ පස සතොස් හවුනැ ඇලුණු බැවින් මහ අරිවස් දළිපැදුම් කිය. මුළු මාගම් වැසියෝ එහි එති. එයින් තෙරුන්ට මහත් සත්කාර උපන. එය ඉවසිය නොහැකි එක් පෙරකෙනෙක් "දීඝභාණකයා අරිවස් කියමි යි මුළු රැය කොලහල කෙරේ "යි යනාදීන් අක්‍රොශ කෙළේය. තම තමන් වසන වෙහෙරට යන දෙතෙරණුවෝ ම ගවුවක් පමණ දුර එක මගින් ම ගියෝය. එතෙක් දුර ගමන්හි හේ දීඝභාණකයනට අක්‍රොශකෙළේ තමුදු දෙවෙහෙරට යන මග බෙදුණු තැන්හි නැවතුණු දීඝභාණ-කයෝ තෙරුන් වැඳ වහන්ස, "මේ තුඹවහන්සේ විසින් යායුතු මගය,,යි කීහ. හේ නො ඇසුණක්හු සේ ගියේය. තෙරුන් වහන්-සේ ද වෙහෙරට ගොස් පා සෝදා වැඩහුන්නේය. අතවැසි තෙමේ ඔවුනට කිමෙක වහන්ස, මුළු ගවුවක් පමණ මගැ බණින්නහුට කිසිවක් නොවිදළහුදැ යි කීහ. තෙරණුවෝ "ඇවැත්නි, ඉවසීම ම මට භාරවූ වෙක, නොඉවසීම භාරවූවක් නොවෙයි! එක පියවරක් ඔසවා තබන ඇසිල්ලෙහි දු කමටහනින් නොවෙන් වීමි,,යි වදාළෝ

යමෙක් වනාහි දුකසේ ඉවසිය යුතු හෙයින් දුක් වූ, බහල බැවින් තීව්‍ර වූ, රළු බැවින් කෲර වූ තියුණු බැවින් කටුක වූ, අස්වාද රහිත බැවින් අසාත වූ මනනොවඩන බැවින් අමනාප වූ, පණ පැහැර ගැන්මට සමත් බැවින් පාණහර වූ, සිරුරැ අටගත් දුක් වෙදනා ඉවසා ද, හේ සිතුල් පවු වැසි පධානිය තෙරුන් සේ නො සැලෙන ස්වභාව ඇතියෙක් වෙයි!

රාත්‍රියෙහි පධන් වියර්‍යයෙන් හල්ගත කොට සිටි තෙරුන් වහන්සේට උදර වාතයෙක් උපන. හේ එය ඉවසිය නොහැකිව ඔබි මොබ පෙරලෙයි. සක්මනැ පසෙකැ සිටි පිණ්ඩපාතික තෙර නමක් ඔහුට "ඇවැත්නි, පැවිදිවරයෙක් නම් ඉවසන ගති ඇති-යෙක් වේය" යි කීය. හේ වහන්ස! මැනැවැ, යි ඉවසා නොසැලී වැදහෙවීය. වාතය නැබමඬල පටන් හෘදය පැළීය. තෙරුන් වහන්සේ වේදනාව මැඩ පවත්වා විදසුන් වඩා මොහොතෙකින් අනාගැමියෙක් ව පිරිනිවීය!!

සීතාදීන් අතුරෙන් යම් කිසිවක් නොඉවසන්නහුට කාමාදී ආශ්‍රවයන් හා දුක් ඇති කරන වෙනත් කෙලෙස් දැවිලි උපදනාහු නම් එම ඉවසන්නහුට ඔවුහු නොවෙත්. සීතෙන් පීඩිත වැ සිටින උෂ්ණ රිසියෙක් හට කාමාශ්‍රවයද, සුගති භවයෙහි අපට කිසිසේත් සීතොෂ්ණයක් නොවේවා'යි භවය පතන්නහුට භවාශ්‍රයද, සීතො-ෂ්ණ මමය මාගේය යි විපරීත කොට ගන්නහුට දෘෂ්ටි ආශ්‍රවය ද, සියල්ල හා සම්ප්‍රයුක්ත ව පවත්නා අවිද්‍යාශ්‍රවය ද උපදිත්. මේ ආශ්‍රව ධර්මයෝ සීතාදීන් අතුරෙන් එක එකක් පාසා සතර සතර යෙදී මෙන් අනෙක විධවූවෝ වෙති. ඔවුහු මේ ඛන්ති සංවරය,යි කියනලද අධිවාසන ක්ෂාන්තියෙන් ප්‍රහණය කටයුත්තෝයැ. එහෙයින් මේ ඛන්තිසංවර නම්වේ.

(5) විරිය සංවරය නම්:–වියර්‍ය වෑඩීමෙන් කාමාදී ආශ්‍රව ධර්මයන්ගෙන් සිත ආරක්ෂාකර ගැනීමයි. හේ කෙසේද යත්:—

“ඉධ භික්ඛවෙ, භික්ඛු පටිසංඛා යෝනිසො උප්පන්නං කාම-විතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තී කරොති අන-භාවං ගමෙති; උප්පන්නං ව්‍යාපාද විතක්කං නාධිවාසෙති —පෙ— උප්පන්නං විහිංසා විතක්කං—පෙ — උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තී කරොති අනභාවං ගමෙති, යංහිස්ස භික්ඛවෙ, අවිනොදයතො උප්ප—

ජ්ජෙය්‍යුං ආසවා විඝාත පරිළාහා විනොදයතො එවංස තෙ ආසවා විඝාත පරිළාහා න හොන්ති, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, ආසවා විනොදනා පහාතබ්බා”

(=මහණෙනි, මේ ශාසනයෙහි යොගාවචර මහණ තෙමේ “මේ විතර්කය මේ හේතුවෙන් අකුසලය, මේ කරුණෙන් සාවද්‍යය, මේ මේ හේතුවෙන් දුක් විපාක ඇතියක්ය, හේ තමහට පීඩා පිණිස පවතී” යනාදී ක්‍රමයෙන් නුවණින් කාමවිතර්කයෙහි ආදීනව මෙනෙහි කොට ඒ ඒ අරමුණු නිමිත්ත කොට උපන් කාමවිතර්කය නොඉවසයි. පැසකින් කසළක්මෙන් බැහැර කරයි. කෙවිටි පහරින් ඇඩ ගවයකු සේ දුරු කරයි. නවද එය අභ්‍යන්තරයෙහි නොපවත්නා සේ කෙළවරට පමුණුවයි. නැවත නූපදනා සේ විෂ්කම්භන ප්‍රහාණයෙන් අභාවයට පමුණුවයි. (ව්‍යාපාද විහිංසා විතර්කයන්හි ද මේ ක්‍රමය මැයි.)

සියක් වරෙහි දු උපනුපන් පවිටු අකුසල ධර්මයන් නොහොත් කාම, ව්‍යාපාද, විහිංසා, ඥාති, ජනපද, අමරපරානුද්දයතා ප්‍රතිසංයුක්ත ලාභ සත්කාර ශ්ලොක ප්‍රතිසංයුක්ත අනවඤ්ඤත්ති ප්‍රතිසංයුක්ත විතර්කය යි කියනලද නව මහා විතර්කයන් උපන් ඇසිල්ලෙහි ම නොඉවසීම ද, බැහැර කිරීම ද, දුරුකිරීම ද, කෙළවර කිරීමද, අභාවයට පැමිණ වීමද කරන්නේය. මෙහි කාම විතර්කය කාමාශ්‍රව යයි. එය අරමුණු කොට භවය පැතීම භවාශ්‍රයයි. නව මහාවිතර්කයන්හි සම්ප්‍රයුක්ත අවිද්‍යාව අවිද්‍යාශ්‍රවයයි. කාමවිතර්කාදීන් අතුරෙන් යම්කිසි විතර්කයක් දුරු නොකරන්නහුට කාමාදී ආශ්‍රවයන් හා දුක් ඇති කරන වෙහෙස් කෙලෙස් දැවිලි උපදනාහු නම් එය දුරුකරන්නහුට ඔවුහු නොවෙත්. මෙසේ කාම විතර්කාදී වශයෙන් අනෙක විධ වූ මේ ආශ්‍රව ධර්මයෝ. ඒ ඒ විතර්කයෙහි ආදීනව සැලකීම හා යෙදුණු වීර්‍ය සංවර සඞ්ඛ්‍යාත විනොදයෙන් පහකට යුත්තෝයැ යි කියනු ලැබෙත්. මේ වීර්‍ය සංවරයයි. ආජීව පාරිශුද්ධිශීලය ද මේ වීර්‍ය සංවරයෙහි ම ඇතුළත් වේ, හේ කෙසේද යත්:—

“ආජීව හෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං අවීතික්කමස්ස කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදීනං ච පාප ධම්මානං වසෙන පවත්තා මිච්ඡාජීවා විරති ඉදං ආජීව පාරිසුද්ධිසීලං,, යි දැක්වුණු හෙයින්.

(=ආජීවය හේතුකොට ගෙන පණවා වදාළ සිකපද සය නො ඉක්ම වන්නහුගේ කුහණා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේ ආදී වූ ද ලාමක සවභාවයන්ගේ වශයෙන් පැවතුණු මිථ්‍යාජීවයෙන් යම් විරතියක් වේද, මේ විරති චෛතසිකය තෙමේ ආජීව පාරිශුද්ධි ශීලය නම් වේ.)

i එහි **ආජීවය නිසා** පැණවුණු සිකපද සය නම්: ආජීවය කාරුණ්‍ය කොට ගෙන තෘෂ්ණාවෙන් මඩනාලද්දා වූ නැති ගුණ පහළ කරන අදහස් ඇති මහණහට පැමිණෙන, මෙහි **සපතා පතතිසක්ඛන්ධයෙහි** දක්වුණු- "1. **උතුරුමිනිස්දහම් පරිජි** ඇවත ද 2. **සංචරිත්ත** සඟ වෙසෙස් ඇවත ද, 3. යමෙක් තොපගේ විහාරයෙහි වෙසේ ද, **ඒ මහණ** තෙමේ රහත්ය යි පර්‍යාය වචනයෙන් උතුරු මිනිස් දම් ඇඟවීමෙන් සිදුවන ථුල්ලසි ඇවිත ද, 4. **පණීත** භොජන විඤ්ඤත්ති **පචිත්තිය** ද, 5. **සූපොදන** විඤ්ඤත්ති දුකුළා ඇවත ද, 6. විඤ්ඤත්තියෙන් **ප්‍රණීත** භොජනයන් ලබා අනුභව කිරීමෙන් මෙහෙණියනට සිදුවන පාටිදෙසනීයාපත්තිය ද යන මොහුයි.

ii **කුහණා** නම් රහස් බිණීම් ආදී තුන් වැදෑරුම් කුහක ප්‍රතිපත්තියෙන් දායකයන් විෂ්මයට පත් කරවීම යි.

iii **ලපනා** නම් තමා ද දායකයා ද උසස් කොට ඔහු කිසිවක් දෙන පරිද්දෙන් බිණීමයි.

iv **නෙමිත්තිකතා** නම් ප්‍රත්‍යය දානයෙහි සංඥ උපදවන කාය වාක් කර්මය යි කියන ලද සලකුණු දක්වීමයි.

v **නිප්පෙසිකතා** නම් ලාභය පිණිස අනුන් අක්‍රොශ වස්තුවෙන් පෙළීමයි.

vi **ලාභෙන ලාභං නිජිගිංසනතා** නම් තමා ලත් ලාභය අනිකෙක්හට දී ඔහුගෙන් අනෙක් මහත් ලාභයක් සෙවීමයි. මේ කුහණාදී පදයන්ගේ වැඩි විස්තරය විශුද්ධිමාර්ගයෙන් දතයුතුය.

vii **එවමාදිනාංච** යන මෙහි ආදිශබ්දයෙන් එක්විසි අනෙසන අෂ්ටකුලදූෂණ වශයෙන් ද විඤ්ඤත්ති රූපිය සංවොහාර ක්‍රයවික්‍රය වශයෙන් ද පැවැති මිථ්‍යාජීවය සංග්‍රහ කරනු ලැබේ.

## (1) එකි එක්විසි අනෙසන නම්:—

1 "වෙළු දානං, 2 පුප්ඵ දානං, 3 පත්ත දානං, 4 ඵල දානං, 5 දන්තකට්ඨ දානං, 6 මුඛොදක දානං, 7 සිනාන දානං, 8 චුණ්ණ දානං, 9 මත්තිකා දානං, 10 චාටුකම්‍යතා, 11 මුග්ගසූප්‍යතා 12 පාරිභට්ටකතා, 13 ජඞ්ඝපෙසනියතා, 14 වෙජ්ජ කම්මං, 15 දූත කම්මං, 16 පහෙන ගමනං, 17 පිණ්ඩපති පිණ්ඩං, 18 දානානුප්පදානං, 19 අඞ්ගවිජ්ජා, 20 වත්ථුවිජ්ජා, 21 නක්ඛත්ත විජ්ජා" යී දැක්වුණු වෙහෙර උපන්නාවූ හෝ අරණ්‍යාදියකින් ගෙනෙන ලද්දාවූ හෝ සඞ්ඝ ගණ පුද්ගල සන්තක හුණ දඬු දීම ද, පුවගුමල් සපු මල් ආදී මල් දීම ද, බුලත් තල්පත් ආදි පත්‍ර දීමද, තල් පොල් ආදී ගෙඩිවගී දීම ද, දැහැටිදඬු දීම ද, මුව දෝනා පැන් දීම ද, නහන පැන් දීම ද, මහරි සුණු, කොළිඳ සුණු ආදී සුණු දීමද, ප්‍රකෘති මැටි පස්වන් මැටි ආදී මැටි දීමද, උපස්ථායකයන් කෙරෙහි තමන් දාසයකු මෙන් පවත්වන නීචවෘත්තිය යී කියන ලද චාටුකම්‍යතාවයද; පිසන ලද මුඳගසූපයක් සේ ජනයාගේ සිත් ගැනීම පිණිස සැබෑ මඳ කොට බොරු බොහෝ කොට කීමය යි කියන ලද මුග්ගසූප්‍යතාවයද, ලාභාසාවෙන් කුලදරුවනට වස්ත්‍ර ආදිය දීමෙන් නැලවීමය යි කියන ලද පාරිභට්ටකතාවය ද, හසුන්පත් රැගෙන එහෙන් මෙහෙට යන කුඩා මෙහෙය යි කියන ලද ජඞ්ඝපෙසනිය ද, පැමිණි නොපැමිණි සියලු දෙනාට වෙදකම් කිරීම ද, ගිහියන්ගේ පත් හසුන් පඬුරු ගෙන යාමය යි කියන ලද දූත කම්යද, කෙත් වත් අරම් ආදියට මෙහෙවර පිණිස යන පහෙණ ගමනය ද, තමා ලද පසය කුලයනට දී උන්ගෙන් ලද දෙය ගැනීමය යි කියන ලද පිණ්ඩප්‍රතිපිණ්ඩය ද, ලාභාසාවෙන් අත්ලස් ආදිය දීම වූ දානානුප්පදානය ද, අඟ පසඟ දක්වන්නාවූ අඞ්ගවිද්‍යාව ද, ළිං කිඹි ගෙබිම් ආදිය දක්වන වස්තු විද්‍යාවද, තිථි හොරා නක්ෂත්‍ර විධි දක්වන්නාවූ නක්ෂත්‍රවිද්‍යාව ද, යන එක්විසි ධර්‍මයන් පැවිද්දන් විසින් නොසෙවිය යුතු හෙයින් අනෙසන නම් වෙත්.

## ii අෂ්ට කුල දූෂණය.

"කුලානි දූසෙති i පුප්ඵෙනවා ii ඵලෙනවා iii චුණ්ණෙනවා iv මත්තිකායවා, v දන්තකට්ඨෙනවා, vi වෙළුයාවා, vii වෙජ්ජිකායවා, viii ජඞ්ඝපෙසනියෙනවා" යනුවෙන් දැක්වුණු (අනෙසන යෙහි ඇතුළත් වූ)පුෂ්පාදියෙන් කුලයනට සංග්‍රහ කිරීම අෂ්ටකුල දූෂණය නම් වෙති.

ලජ්ජී ප්‍රියශීලී භික්ෂූන් කෙරෙහි මනුෂ්‍යයන්ගේ ශ්‍රද්ධාව දූෂ්‍යකරන හෙයින් මොවුහු කුලදූෂණක යි දන්නා ලැබෙත්.

### iii විඤ්ඤත්ති.

විඤ්ඤත්ති නම් ගිලන් කාලය හැර සිවුපසය පිළිබඳ යම්කිසිවක් නෑ නොවන නොපැවරුවන්ගෙන් ඉල්වාගැනීමයි. නෑයෝනම්:-

ජෙට්ඨභාතා කණිට්ඨො ච—තථාභගිනීයො දුවෙ,
චූලමාතා චූලපිතා—මහාමාතා මහාපිතා,
මාතුච්ඡා මාතුලො චෙති—දසමෙ ඤාතයො මතා,යි.

දක්වූණු පරිදි i වැඩිමහලු සහෝදරයා ද, ii බාල සහෝදරයා ද, iii—iv වැඩිමහලු බාල සහෝදරයෝ දෙදෙනා ද, v සුළුපියා ද, vi මහපියාද, vii සුළු මව ද, viii මහ මව ද, ix නැන්දද x මාමා ද, යන දසදෙන සත්කුල පරම්පරාව දක්වා නෑයෝ නම් වෙත්. එයින් අන්‍යයෝ නොනෑයෝයැ.

### iv නොපැවරූවෝ නම්.

වහන්ස, සිවුපසයෙන් වුවමනා ඇතිකල්හි මට දන්වුව මැනවැ යි විශෙෂවශයෙන් හෝ දිවිහිම් කොට ද, දවස් මාස අවුරුදු, වශයෙන් කාල පරිච්ඡෙද කොට ද, කප්පිය කාරක වූවෝ යැ.

i සංඝයාට කැපකරු වීමය. ii පුද්ගලයාට කැපකරු වීමය යි කැපකරු වීම දෙයාකාරයකින් නියමිත යැ. කැපකරු වූවෝ දස නෑයන් වැනි වෙත්. එහෙයින් යට කී පරිදි කැපකරු නොවූවාහු නොපැවරුවෝ වෙති යි දතයුතු යි.

### v රූපිය සංවොහාරනම්.

රන් රිදී මසු කහවණු ආදිය දීමෙන් යම්කිසිවක් ලැබීමයි. මීට පළමු රූපිය පටිග්ගහණ ශික්ෂාවෙන් රන් රිදී මසු කහවණු පිළිගැනීම ද අනෙකෙකු ලවා ගැන්වීම ද දායකයන් විසින් "මෙය නුඹ වහන්සේට වේව යි පරිත්‍යාග වශයෙන් සමීපයෙහි තබන ලද්දේද "මෙය අපට කැප නොවේය" යි කායවචනයෙන් ප්‍රතික්ෂෙප නොකොට සිතින් ඉවසීම ද තහනම් කර තිබේ.

රූපිය සංවොහාර ශික්ෂාවෙන් වෙළඳාම් වශයෙන් ගනුදෙනු කිරීම ද තහනම් කරන ලදී. මෙය වැඩි දුරටත් ප්‍රකට කිරීම පිණිස අටුවාවෙහි පතත්‍ර චතුෂ්කාය දක්වා තිබේ. හේ කෙසේදයත්:-

1. යම් භික්ෂුවක් රන් රිදී මසු කහවණු පිළිගෙන එයින් යකඩ උපදවා එයතලා ඒ ලොහයෙන් පාත්‍රයක් සාරවයි ද, මේ පාත්‍රය මහා අකප්පිය නම් වේ. මේ පාත්‍රය මූල බීජයෙහි පටන් දූෂිත බැවින් කිසි උපායකින් කැපවූවක් කිරීමට නොහැකි වෙයි.

2. යම් භික්ෂුවක් රන් රිදී මසු කහවණු පිළි ගෙන එයින් පාත්‍රයක් මිල දී ගනී ද, මේ පාත්‍රය ද අකැපවෙයි.

මේ පාත්‍රය රන්රිදී මසු කහවණු පිළිගත් හෙයින් ද, කය විඤ්ඤත්වශයෙන් ගැණුනු හෙයින් ද, පස් සැහැ භූමියනට ම කැප නොවේය යි මහා පච්චරිය අටුවා වෙහි දක්වා තිබේ.

එය නැවත කැපවූවක් කර ගැනීමට නම්:- එමිල මිල හිමියනට ද, පාත්‍රය පාහිමියනට ද දිය යුතුවෙයි. එය නැවත කැපවස්තුවක් දී ලබා ගෙන පරිභොග කිරීමට සුදුසුය.

3. යම් භික්ෂුවක් රන් රිදී මසු කහවණු පිළි ගෙන එයින් කැපකරුවකු ලවා පාත්‍රයක් ගන්වයි ද, මේ පාත්‍රය ද මිල ඉවසූ හෙයින් අකැපවේ යි. මිල නිසදීමක් නොකළ හෙයින් සෙසු භික්ෂූන්ට ද කැප නො වෙයි.

4. යම් භික්ෂුවක් රන්රිදී මසු කහවණු පිළි නොගෙන කැප-කරුවකු සමග කඹුරුකුලයකට ගොස් මෙ මිල ගෙන මේ පාත්‍රය දෙවයි. අකැපව්‍යවහාරයෙන් මිල දෙවා පාත්‍රයක් ගනී ද, මේ පාත්‍රය විචාර රහිත වැ ගත් හෙයින් ඒ භික්ෂුවට පමණක් නො-වටීයයි මෙසේ පත්‍ත චතුෂ්කය විස්තර කොට තිබේ,

මිලදී යමක් ගැනීම පමණක් නොව දූකුලා වස්තුවෙකින් දූකුලා වස්තුවක් හෝ නිසගි වස්තුවක් හෝ කැප වස්තුවක් හෝ නිසගි වස්තුවෙකින් නිසගි වස්තුවක් හෝ දූකුලා වස්තුවක් හෝ කැප වස්තු වෙකින් දූකුලා වස්තුවක් හෝ නිසගි වස්තුවක් හෝ හුවමාරු කිරීම ද තහනම් කොට තිබේ.

එහි පිළිගැනී මෙන් දූකුලා ඇවැත් අවදනා මුතු මැණික් වෛඩූර්‍ය්‍ය සක්ගල් පබළු මැසිරිගල් රතුකැට යන මොවුන්ද, සප්ත විධ ධාන්‍යය ද බෙර වීණා දවුල් තම්මැට්ටම් කඩිප්පු ආදි සියලු තූර්‍ය්‍ය භාණ්ඩ ද කඩු තෝමර කිරිච්චි තුවක්කු දැල් අතාංගු කරක්ගෙඩි ආදී සත්ව හිංසාව පිණිස යොදන ලද සියලු .ආයුධ භාණ්ඩ ද,සියලු ස්ත්‍රී රූපද, ස්ත්‍රී ආභරණ ද ස්ත්‍රී කුමාරිකා දාසිදස්,එළු

තිරළු කුකුළු හුරු, බිලු, ඇත් අස්, ගව, මහිෂ වතුපිටි ගම් කුඹුර ඵලදරණ වෘක්ෂ හා ගස්වල තිබෙන ශෙඩිවගී ද යනාදිය දුකුලා වස්තූහු වෙත්. රන්රිදී මසු කහවණු නිස්ගි වස්තුනම් වෙති. බොම කොෂෙය්‍යාදී සිවුරුපිළි පාත්‍ර සහල් ගිතෙල් සීනි, සූකිරි, හකුරු පැණි ආදී භික්ෂූන්ට කැප දෙය කැපවස්තු නම් වෙති. මෙම වස්තු ගනුදෙනු කිරීමෙන් ලද පසය භික්ෂූන්ටකැප නොවේ.

රජ්ජශික්ෂා ජද අමුවාවෙහි:-

"සචෙ කස්සකා කහා පණෙ ආහරිත්වා ඉමෙ සංඝස්ස ආහටා'ති වදන්ති, අඤ්ඤතරො ච භික්ඛු එත්තකෙහි කහාපණෙහි සාටකෙ ආහරථ එත්තකෙහි යාගු ආදීනි සම්පාදෙථා'ති වදති යෙන ආහරන්ති සබ්බෙසං අකප්පියං, කස්මා? කහාපණානං විචාරිතත්තා," යනුවෙන් (=ඉදින් ගොවියෝ කහවණු ගෙණවුත් මොවුහු සඟනට ගෙණෙන ලද්දේය යි කියත්ද; එක්තරා භික්ෂුවක් මෙපමණ කහනුවලින් වස්ත්‍ර ගෙන එව් මෙපමණකින් කැඳ ආදිය සපයව්ය යි කියා ද, ඔවුහු (එයින්) යමක් ගෙන එත්ද, එය සියල්ලන්ට අකැප වේ. කුමක්හෙයින්දයත්? කහවණු විචාරණය කළහෙයිනි) යනු දැක්වේ.

ඉදින් ධාන්‍ය ගෙනවුත් මෙය සඞ්ඝයාට ගෙණෙන ලදැ යි කියත් ද එක්තරා භික්ෂුවක් පළමුනයින් ම "මෙපමණ වීවලින් මෙනම් මෙනම් දෙය ගෙණ එව් යැ"යි කියා ද ඔවුහු එයින් යමක් ගෙන එත් ද එය ඒ භික්ෂුවට ම අකැපවෙයි. කුමක්හෙයින්දයත්:- දුකකට වස්තුවක් වූ ධාන්‍යය විචාරණය කළහෙයිනි.

ඉදින් සහල් හෝ මුං මෑ ආදිය හෝ ගෙණවුත් මෙය සඟනට ගෙනෙන ලදැයි කියත් ම එක්තරාභික්ෂුවක් පළමුනයින් ම මෙප–මණ සහල්වලින් මෙනම් මෙනම් දෙය ගෙන එව්යැයි කීකල්හි ඔවුහු එයින් යමක් ගෙණ එත් ද එය සියල්ලට ම කැපවෙයි. කුමක්හෙයින්ද යත්. කැපවූ සහල් විචාරණය කළහෙයිනි, කැප කරුවෙකුට කී හෙයින් කායවිකකයෙහි ද ආපත්ති නොවේය යි කැප අකැප දක්වා තිබේ. තවද:—

"සචෙ කොචි අබ්‍යත්තො අකප්පිය වොහාරෙන තලාකං පතිගණ්හාති වා, කාරෙතිවා තං භික්ඛුහි න පරිභුඤ්ජ තබ්බං තං නිස්සාය ලද්ධං කප්පිය භණ්ඩම්පි අකප්පියමෙව, සචෙ භික්ඛුහි පරිච්චත්තභාවං ඤත්වා සාමිකොවා තස්ස පුත්තධීතරො වා අඤ්ඤො වා කොචි වංසෙ උප්පන්නො පුන කප්පිය වොහාරෙන

දෙති මට්ටති" යනුවෙන්, (=ඉදින් කිසියම් අවියත් මහණෙක් අකැප වහරින් වැවක් පිළිගනී ද, නොහොත් කරවයි ද, එය භික්ෂූන් විසින් පරිභොග නොකට යුතු, එය නිසා ලබන ලද කැපබඩු ද අකැප වෙයි.

ඉදින් එය භික්ෂූන් විසින් වර්ජනය කළ බව දැන අයිතිකාරයා හෝ ඔහුගේ දූ දරුවන් හෝ එම වංශයෙහි උපන් අන් කිසිවෙක් හෝ නැවත කැප වහරින් දේ නම් පිළිගැනීම වටිය යි අකැප වස්තුව කැපවන පිළිවෙළද අටුවාවෙහි විස්තර කර තිබේ.

vi ක්‍රය වික්‍රය නම්:—

චීවරාදී කැප බඩුවක් දී එයින් කැප වූ යම් කිසිවක් ලබාගැනීම යි. මෙරමාගේ බඩුවක් ගැනීම "ක්‍රය" යැ යි ද — එය පිණිස තමන්ගේ බඩුවක් දීම "වික්‍රය" ය යි ද කියනු ලැබේ.

"සහත්ථං පරභණ්ඩස්මිං – පරහත්ථං ච අත්තනො
භණ්ඩකෙ පන සම්පත්තෙ – නිස්සග්ගිය මුදීරිතං" යී.

(=අනුන්ගේ බඩුව සිය අතට ද, තමන්ගේ බඩුව අනුන්ගේ අතට ද, පැමිණෙත් ම නිසගි ඇවැත් සිදුවේය යි දක්විණි.)

"මේ බත් අනුභව කොට මෙනම් කටයුත්තක් කරව්ය" යි ශිල්පින් ලවා ඩබරා ආදී වස්තුවක් කරවයි ද, රජකයන් ලවා වස්ත්‍රාදිය සෝදවයි ද, කරනවැමියන් ලවා ඉස රැවුල් බාවයි ද, කම්කරුවන් ලවා නව කම් කරවයි ද, නොවටී, වස්තුව වූ පරිදි ඇවැත් වේ.

මෙහි වස්ත්‍ර ධොවනයෙහි ද, කෙශච්ඡේදනයෙහි ද, භූමි ශොධනාදි නවකර්මයෙහි ද, තමන් අතට පත් අන්සතු බඩුව කිසිසේත් නිසදිය යුතු නොවේ. දුස්සාට නිසගි කැප වස්තූන් පිළිබඳව රූපිය සංවොහාරය ලැබෙන්නේ ය, ක්‍රයවික්‍රය වනාහි කැපවස්තූන් පිළිබඳව මැ සිදුවන්නේ ය. මේ රූපිය සංවොහාර, ක්‍රයවික්‍රය දෙකේ වෙනස යි. විනයාර්ථ කථායෙහි: —

"අයං හි ක්‍රයවික්‍රයො ඨපෙත්වා පඤ්ච සහධම්මිකෙ අවසෙසෙහි ගිහී පබ්බජිතෙහි අන්තමසො මාතා පිතූහි'පි සද්ධිං නවට්ටති"

යනාදීන් (=මේ ගනුදෙනුව වනාහි පස්සහදූමියන් හැර සෙසු ගිහි පැවිදි තැන් හා යටත් පිරිසෙයින් මවුපියන් සමඟ ද නො වටීය යි දක්වා තිබේ.)

මවට හෝ පියාට මෙය දෙව යි කියන භික්ෂුහට විඤ්ඤත්ති-යක් ද, මෙය ගනුව යි දෙන්නහුට සඬාදෙය්‍ය විනිපාතය ද නොවේ. මේය දෙව යි නොනෑයෙකුට කියන්නහුට විඤ්ඤත්තිය ද, මෙය ගනුව යි කියන්නහුට සඬාදෙය්‍ය විනිපාතය ද, මෙයින් මෙය දෙව යි ගනුදෙනුවට පැමිණෙන්නහුට නිසගිය ද වන්නේ ය.

එහෙයින් කැප භාණ්ඩය හුවමාරු කරන්නහු විසින් මවු පියන් හා කයවිකකයට ද, නොනෑයන් හා තුන්ඇවැතට ද නොපැමිණ පරිවත්තනය කටයුතුයි.

එහි මේ මතු පහලවනුයේ පරිවත්තන විධියයි. භික්ෂුවක් ලඟ මගවියදමට තිසි සහලක් තිබී හෝ අතර මගදී බත් මූලක් ගත් අත් ඇති පුරුෂයෙකු දැක, අපට සහල් තිබේ, මෙයින් අපට ප්‍රයෝජන නැත, ප්‍රයෝජන වනුයේ බතිනැයි! කියත් ම, පුරුෂයා සහල් ගෙන බත් දේද, වරී තුන් ඇවැතම සිදු නොවෙති. යටත් පිරිසෙයින් නිමිත්ත කර්මය පමණකු දු නොවේ. කුමක් හෙයින් ද? මිල නැති බැවිනි.

මේ තොපගේ පාත්‍රය කෙතෙක් අගී දැයි විචාරත් මැ මෙතෙක් අගියයි කියා ද, ඉදින් ඔහුගේ කැප බඩුව වඩා අගනේ නම්, "උපාසකය, මාගේ මේ වසතුව එයට වඩා අගනේ ය! තොපගේ පාත්‍රය අනිකෙකුට ·දෙවයි. ඔහුට මෙසේ පිළිවදන් දෙත් මැ එයසා උපාසක තෙමේ එසේ නම් "අනෙක් තලු තැටිය කුදු දෙමි" යි කියාතම් ගන්නට වරී, යමෙක් වනාහි එසේ නොකොට මෙය රැගෙන මේ වසතුව දෙවයි හුවමාරු කෙරේ නම් යථා 'වසතුක (=වසතුව වූ පරිදි) ඇවැත් වේය යි දක්වා තිබේ.

මේ ආදී අනෙක ක්‍රමයෙන් දක්වුණු ලාමක ආකාරයන්ගෙන් උපන් සිවුපසය ප්‍රයෝජන ගැනීමෙන් මිත්‍යා ආජීවය වේ, සියලු අතින් ම මිත්‍යාජීවයෙන් වැලැක් ම ආජීවපාරිශුඬි ශීලය යි.

මනාසේ පටන්ගත්නාලද වීයඝීයෙන් මිත්‍යාජීවයෙන් මැලකීම ඇතිවන හෙයින් ආජීවපාරිශුඬි තොමෝ වීයඝීයෙන් සම්පාදනය කටයුතු, එහෙයින් සසර බිය දක්නා මහණුන් විසින්

ශාස්තෘ ශාසනයට සුදුසු නොවූ අයුතු පස සෙවීම දුරුකොට වියඹී වඩා පිඩු සිඟා හැසිරීම් ආදියෙන් මේ ආජීව පාරිශුඬි ශීලය සමපාදනය කටයුතු.

මෙසේ වියඹී සංවරය ආජීව පාරිශුඬිශීල වශයෙන් ද ප්‍රභෙදයට පැමිණියේ වෙයි, මෙසේ පඤ්චවිධ සංවරයෙහි චතු පාරිශුඬි ශීලය ඇතුළත් වූවාක් මෙන් මැ "සංවරසිල,, පදයෙන් ද, දක්විය යුත්තේ ඒ සිවු වැදෑරුම් සංවරසීලය මැයි.

තවද සාමණෙර, ගෘහස්ථ, ප්‍රතිපත්තීන් ද සංවර විනයෙහි ම ඇතුල් ව තිබෙන බැවින් භික්‍ෂු ප්‍රතිපත්තියට අනතුරු ව එකී ප්‍රතිපදා දෙක ද, සැකෙවින් මෙහි දක්වනු ලැබේ. එහි,

(2) සාමණෙර ප්‍රතිපත්තිය කෙසේද යත්:—

"අනුජානාමි භික්ඛවෙ, තීහි සරණ ගමනෙහි සාමණෙර පබ්බජ්ජං,, යනුවෙන් "මහණෙනි,"බුඬං සරණං ගච්ඡාමි,, යනාදීන් තෙවරක් උභතො සුඬියෙන් කියනලද ත්‍රිවිධ සරණගමණයෙන් සාමණෙර ප්‍රව්‍රජ්‍යාව අනුදනිමියි,, වදාළ හෙයින් ඒ සරණ සමාදනයෙහි උපදනා ශ්‍රඬා සම්ප්‍රයුක්ත කුශල චෙතනා තොමෝ ප්‍රව්‍රජ්‍යා නම් වෙයි.

"අනුජානාමි භික්ඛවෙ, සාමණෙරානං දස සික්ඛාපදානි, තෙසු සාමණෙරෙහි සික්ඛිතුං, පාණාති පාතා වෙරමණී, අදින්නාදනා වෙරමණී, අබ්‍රහමචරියා වෙරමණී, මුසාවාද වෙරමණී, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී, විකාලභොජනා වෙරමණී; නච්ච ගීත වාදිත විසූක දස්සනා වෙරමණී, මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී, උච්චාසයන මහාසයනා වෙරමණී, ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී,, යනුවෙන් "සාමණෙරයන්ට දශ සික්‍ෂාපදයන් ද, සාමණෙරයන් විසින් ම දශ සික්‍ෂාපදයන්හි හික්මෙන්ට ද අනුදනිමි" යි වදාළ හෙයින් දශ ශීලය, සංක්‍ෂෙපයෙන් ඒ සාමණෙර ප්‍රතිපත්තිය පිළිබඳ ශීලය වේ.

ප්‍රව්‍රජ්‍යා තොමෝ සරණ ගමණයෙන් ම සඵල වන්නීය. ශික්‍ෂාපදයෝ හුදක් ශික්‍ෂා පදපූරණය පිණිස දතයුත්තෝ ය. එහෙයින් එය පාලියෙහි ආ ක්‍රමයට ඉගෙන ගන්නට නොහැකි වුන් නෙකුට යම් කිසි භාෂාවෙකින් අර්ථවශයෙන් ද කිමැවපී!

යම්තාක් ඔහු හික්මිය යුතු සිකපද නොදනී ද, සගල සිවුරු පාසිවුරු දැරීම් ඉඳීම් සිටීම් ආදියෙහි ද, පානභොජනාදියෙහි ද දක්ෂ නොවේ ද, ඒ තාක් බොජුන්හලට හෝ සලාක දෙන තැනට හෝ අනෙක් එබඳු තැනකට හෝ නොයැවිය යුතු. සමීපයෙහි හැසිරෙන්නෙක් ම කළයුතු යි. ළදරුවකු මෙන් ආරක්ෂා කට යුතු යි. ඔහට සියලු කැප අකැප කියා දිය යුතු, හැඳීම් පෙරවීම් ආදී ආභිසමාචාරික වත්හි ද හික්මවිය යුතු.
**"අනුජානාමි භික්ඛවෙ, දස හඞ්ගහි සමන්නාගතං සාමණේරං නාසෙතුං"** යී වදාළ දසනාසනාඞ්ගයන් දුරු කොට ආභිසමාචාරික **ක්ෂුද්‍රානුක්ෂුද්‍රක** වත් පිළිවෙත් පුරන්නහු විසින් දස සීලය මනාව **ආරක්ෂා** කට යුතුය යි අටුවාවෙහි දක්වන ලදී.

> "දස සීලං දස සික්ඛා – දස පාරාජිකා ති ච
> නාසනා දස වත්ථූව – පඤ්ඤසා හොනති හෙදතො,,

යනුවෙන් (="පාණාතිපාතා වෙරමණී,, යනාදීන් දක්වන ලද දස සීලයෝ ද, දස පරාජිකාවෝ ද, දස නාසනාවෝ ද, දස දඬුවම් වත්ද යි හෙද වශයෙන් සමපණසෙක් වෙති යි) සාමණේර සීලයෙහි විභාග දක්වා තිබේ. ප්‍රාණඝාතයෙන් දුරුවීම්, අදත්තාදානයෙන් දුරුවීම, අබ්‍රහ්මචය්‍ය්‍යාවෙන් දුරුවීම, මුසාවාදයෙන් දුරුවීම, සුරා – පානයෙන් දුරුවීම. විකාලයෙහි ආහාර වසතුවක් අනුභව කිරී මෙන් දුරුවීම, නැටීම්, ගායනා කිරීම්, බෙරගැසීම්, විසුළු දැකීම් යන මෙයින් දුරුවීම, සැරසීමට හා අලඞ්කාරයට කාරණ වූ මල් ගඳ විලවුන් දැරීමෙන් දුරුවීම, වඩුරියනට වඩා ප්‍රමාණය ඉක්මුණු උස් ආසනයෙන් හා අකැප ඇතිරිළි අතුරණ ලද මහා සයනයෙන් දුරුවීම, රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් දුරුවීම යන මේ දසය, දස සීල ය නම් වේ. මේ දස සීලය ම හික්මිය යුතු බැවින් දස සික නම් වේ.

දස සීලයෙහි දැක්වුණු, ප්‍රාණඝාත, අදත්තාදාන, අබ්‍රහ්මචය්‍ය්‍යා මුසාවාද, යන සතර හා සුරාපානය ද, බුඞ රත්නයෙහි අගුණ කීම, ධර්‍මරත්නයෙහි අගුණ කීම, සඞ්ඝරත්නයෙහි අගුණ කීම, ප්‍රකෘති භික්ෂුණියක් දූෂ්‍ය කිරීම, අනියත මිථ්‍යා දෘෂ්ටි ගැනීම යන මේ දසය දස පාරාජිකා නම් වෙත්.

දස පාරාජිකාවන් අතුරෙන් ප්‍රාණඝාතාදි ප්‍රථම අඞ්ග පස ශ්‍රමණ වේශය නසා නැවත පැවිදි කළ යුතු හෙයින් ලිඞ්ග නාසනාය යි ද, බුදුරුවන්හි අගුණු කීමාදී වූ දෙවන අඞ්ග පස ශ්‍රමණ වේශය නසා සස්නෙන් බැහැර කළ යුතු හෙයින් සඞ්ඝ

නාසනාය යි ද, නම් කෙරෙමින් අවිශෙෂයෙන් මොවුහු දසනාසනා නම් වෙති යි දක්වූහ. විකාල භොජනාදි අඞ්ගපස වැලි දිය අද්දවා සැමලු ආදියෙහි දමවන වැලි දඬුවම් වත්ය යි ද, භික්ෂූන්ට අලාභ පිණිස උත්සාහ කිරීම, අනර්ථ පිණිස උත්සාහ කිරීම, ලබිනා ආවාසයෙන් නෙරපීමට උත්සාහ කිරීම, අක්‍රොශ පරිභව කිණීම, මහණුන් ඔවුනොවුන් හා බිඳවීම යන මේ අඞ්ග පස තමන් නිතර වසන සෙනාසනය සහ ආචාර්‍ය්‍ය උපාධ්‍යායනට මෙහෙවර පිණිස යාම ද; වළකනා හෙයින් සඟරමින් නෙරණා වත්යයි ද, වෙන් කොට දක්වා සියල්ල ම එක් කොට අවිශෙෂයෙන් දස දඬුවම් වත් යයි වදාරණ ලදී.

මෙසේ පසළොස් දසනායන්ගේ වශයෙන් සාමණේර සීලය සම්පූර්ණස් වැදෑරුම් වේ. විනය අටුවාවෙහි. "සාමණේරොහි අත්‍ත මනො කුන්ථකිපිලලිකම්පි මාරෙන්‍තො -පෙ- අවසිට්ඨං හොති,, යනුවෙන් සාමණේර තෙමේ යටත් පිරිසෙයින් කුරු කුහුඹියෙකු මැරීමෙන් මකුණු බිජු වටකු දු බිඳීමෙන් ලිඞ්ගනාසනායෙන් නැසිය යුතු බවට පැමිණේ යි. එකෙනෙහි ම ඔහුගේ සරණ ගමනය හා උපාධ්‍යායග්‍රහණය ද වස් එළඹීම ද සංසිඳෙත්! (පහවීයති.) හේ සංඝ ලාභය ද නොලබ යි. එකම මහණ වෙසය වූ ලිඞ්ග මාත්‍රය පමණක් ඉතිරිවේය යි දක්වන ලදී.

ඒ හෙරණ තෙමේ ඉදින් ආකිණ්ණ දොෂ ඇතියෙක් ම වේ ද. මතු සංවරයෙහි නොපිහිටයි ද එයින් ම බැහැර කළ යුතුය. යළිත් හේ තෙමේ "මා විසින් යුහුසුළුව මැ නපුරු කොට වරදෙක් කරන ලදැ,, යි නැවත සංවරයෙහි පිහිටනු කැමති යේ වේ ද. එහි ලිඞ්ග නාසනය කිරීමෙක් නැත්තේය. මහණ වෙසය වෙනස් නොකොට හැඳි පෙරවි පරිද්දෙන් ම ඔහට සරණ සමාදානය කරවා උපාධ්‍යායග්‍රහණය ද කරවිය යුතු. ශික්ෂාපදයෝ සරණගමණයෙන් ම සිඬවෙති. භික්ෂුව විසින් උපසම්පදා මාලකයෙහි චතු පාරිසුඞි සීලය සැපයුණු සේ සාමණේරයන් විසින් ද සරණ සමාදානයෙන් ම මේ දස සීලය සැපයුණේ වෙයි. එසේද වුවත් දළහී කරණය පිණිස හා මතු සංවරයෙහි පිහිටුවීම පිණිසත් නැවත දස සීලය සික පද විසින් කියවිය යුතුය.

ඉදින් නැවත පෙරවසෙහි සරණ සමාදන්වන ලද්දහු ද, පසුවසෙහි වස්සාවාසිකාය ලැබිය හැකිය. පසුවසෙහි සමාදන්වන ලද්දහු නම් සංඝයා විසින් අපලොකන කර්මයෙන් (ඔවුනොවුන් විචාරා) ලබා දිය හැකිය.

අදත්තාදානයෙහි තණ පතක් පමණ වස්තුවෙන් ද, අබ්‍රහ්ම-සරයෙහි තුන්මගතුරෙන් යම් කිසි මඟෙකැ වරදවා හැසිරීමෙන් ද මුසාවාදයෙහි සිනාසෙන පිසිතු දු බොරුකීමෙන් ද, මද්‍යපාන යෙහි දිය බිඳක් පමණ රහමෙර පානයෙන් ද, අශ්‍රමණ වන්-නේය! ලිඞ්ගනාසනාවෙන් නැසියයුතු බවට පැමිණෙයි.

නොදැන ද බීජයෙහි පටන් මත්පැන් පානය කරන භික්ෂුව හට පචිති ඇවැත් වේ. දැන දැන පානය කරණ හෙරණ තෙමේ සීල භෙදයට පැමිණෙ යි. නො දැන පානය කරනුයේ සීල භෙදයට නොපැමිණෙයි. මේ එහි වෙනසයි.

ඒ සාමණේර තැනගේ විකාල භොජනාදී ඉතිරි සික පද පස කීදෙන් මැ ලිඞ්ගනාසනාවෙන් නොනැසිය යුතුයි. අපරාධ යට සුදුසු පරිදි දඬුවම් කළ යුතු. දඬුයමින් පෙළා මතු සංවරය පිණිස සික පද සමාදානය කරවිය යුතුය.

. තෙරුවන් නුගුණ කීමෙහි අරහාදී නව ගුණයනට ප්‍රති-පක්ෂ වැ බුදුන්ගේ ද, ස්වාක්ඛාතාදි ෂඩ්ගුණයනට ප්‍රතිපක්ෂ වැ ධර්මයාගේද, සුප්‍රතිපන්නාදී නව ගුණයනට ප්‍රතිපක්ෂ වැ සංඝ-යාගේද, නුගුණ කියන්නාවූ තෙරුවනට නින්දාකරන්නාවූ ගර්හා කරන්නාවූ හෙරණ තෙමේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් විසින් "එසේ නොකරවයි" අගුණ කීමෙහි ආදීනව දක්වා වැලක්විය යුතුයි.

තුන්වර දක්වා අවවාද කරනු ලබනුයේ ඒ ලබධිය හරියි ද, දඬුයම් කරවා වරද දෙසවිය යුතුයි. ඉදින් නොහරියි ද එසේම දැඩිකොට ගෙන සිටියි ද. ලිඞ්ගනාසනාවෙන් නැසිය යුතු; හෙවත් සිවුරු හරවා ශාසනයෙන් නෙරපිය යුතු.

ශාස්වත උච්ඡෙද මිත්‍යාදෘෂ්ටි ගත් සාමණේරයන් කෙරෙහි ද මේ ක්‍රමය මැයි, මෙහි දැක්වූණු භික්ෂුණී දූෂක තෙමේ ඒ කාරණ යෙන් අබ්‍රහ්මචාරී ග්‍රහණයෙන් ගන්නා ලද්දේ නමුදු මතු සංවර යෙහි පිහිටනු කැමති සාමාන්‍ය අබ්‍රහ්මචාරික හෙරණහු මෙන් ප්‍රව්‍රජ්‍යාප සම්පදාවට කිසිසේත් ම සුදුසුවූයේ නොවෙයි. මේ අර්ථය හඟවනු පිණිස භික්ෂුණී දූෂකයා වෙනම ඇතුළත් කොට දසවන අඞ්ගය වදාරන ලදැයි දතයුතු යි.

තවද විනය ටීකාවෙහි, "ආභිසමාචාරිකෙසු'පි විනෙතබ්බො'ති ඉමිනා සෙඛිය වත්ත ඛන්ධ වත්තෙසු, අගෙඩසු ච සුක්ක විසට්ඨි ආදි ලොකවජ්ජ සික්ඛාපදෙසු ච සාමණෙරෙහි වත්තිතබ්බං,,

යනුවෙන් (=ආභි සමාචාරික (ක්ෂුද්‍රානුක්ෂුද්‍ර) වත්හිද හික්මවිය යුතු. යන මේ සමන්ත පාසාදිකා අටුවා වචනයෙන් සෙඛියා වත් කඳු වත්හි ද, අතිකුදු සුක්කවිසට්ඨි ආදි ලෝකවද්‍ය ශික්‍ෂා පදයන්හිද් සාමණේරයන් විසින් පැවැතිය යුතුය) යි දක්වන ලද හෙයින් මෙහි සප්තාපත්ති ස්කන්ධයෙහි දුෂ්කෘතාපත්ති ස්කන්ධය පිළිබඳව දක්වන ලද පන් සැත්තෑවක් පමණ සෙඛියා සික පද යන්හිද, ආගන්තුග, ගමික, ආවාසික, අනුමෝදන, භත්තග්ග පිණ්ඩචාරික, ආරඤ්ඤක, සේනාසන, ජන්තාඝර, වච්චකුටී, උපජ්ඣාය, සද්ධිවිහාරික, ආචරිය, අන්තෙවාසික යන තුදුස් කඳු වත්හි ද, සංඝාදි ශේෂාපත්ති ස්කන්ධයට ඇතුලත් සුක්ක විසට්ඨි කායසංසග්ග; දුට්ඨුල්ලවාචා, අත්තකාමපාරිචරියා, අමූලික චොදනා ඛිඤ්චි දෙස ලෙස, සංඝ හෙද, හෙදනු වත්තක, දුබ්බච, කුලදූෂණ යන සිකපද නවයෙහි ද,

පාචිත්තියාපත්ති ස්කන්ධයටම ඇතුලත් අචිජ්ඡඳන, අත්තපරිණාමන, තිසගි දෙකෙහි ද, මුසාවාද, ඔමසවාද, උජ්ඣාපනක ඛියනක, අනුපඛජ්ජ නිසජ්ජ, නික්කඩ්ඪනක, ආමිස හෙතු, අභිහට්ඨුපචාරණ, උය්‍යොජන, සභොජනකුල, රහො නිසජ්ජ, දුතිය රහොනිසජ්ජ, උය්‍යුත්ත දස්සන, උය්‍යොධික, සුරාපාන, අඞ්ගුලි පතොදක, උදකෙහස්සධම්ම, අනාදර, භිංසාපන, අපනිධාන, පාණජීවිතා වොරොපන, උක්කොචන, දුට්ඨුල්ල පටිච්ඡාදන දිට්ඨි අප්පටිනිස්සජ්ජන, උපලාපන, සික්ඛාපද විවණ්ණනක, මොහනක, පහාරදාන, තලසත්තික, අමූලක, කුක්කුච්චුප්පාදන, උපස්සුති, කම්මපටිබාහන ඡන්දඅදාන, ඛියනක, ලාබ පරිණාමන යන අටතිස් සුඛ පචිති සිකපදයන්හි ද යි මෙකී සමපණස් ලෝකවද්‍ය ශික්‍ෂාවන්හි සාමණේර තැන් විසින් හික් මිය යුතු.

ඔමසවාදයෙහි ඇතුලත් හෙයින් දුබ්භාෂිතාපත්තිහු ද සාමණේර තැන් විසින් ආරක්‍ෂාකට යුත්තෝයැ.

"තඤ්ච පන අවත්තමානො අලජ්ජී දණ්ඩකම්මා රහො ච හොති" යනුවෙන් එහි නොවැටෙන හෙරණ තෙමේ අලජ්ජියෙක් වෙයි. දඬුයමට සුදුස්සෙක් ම වේය යි කීහෙයින් යට කියැවුණු එක්සිය එකුන් අසූවක් ශික්‍ෂාවන් නොරකින හෙරණ තැන්ට දඬුයම් කිරීමෙන් ආයති සංවරයෙහි පිහිට විය යුත්තෝය. මෙසේ විස්තර විසින් දක්වුණේ සාමණේර ප්‍රතිපත්තිය යි. දස සීල-

යෙහි පමණක් නොව ලොකවද්‍ය ශික්ෂාවන්හි ද පැවැතිය යුතු හෙයින් සාමණෙර සීලය, ගිහි දස සීලයට වඩා වෙනස් බවද සැලැකිය යුතුයි.

( 3 ) ගෘහස්ථ ප්‍රති පත්තිය:—

"උපාසක උපාසිකානං නිච්චසීල වසෙන පඤ්ච සික්ඛාපදානි, සතිවා උස්සාහෙ දස උපොසථඞ්ග වසෙන අට්ඨාති, ඉදං ගහට්ඨං සීලං" යනුවෙන් (-උපාසක උපාසිකාවන්ගේ නිත්‍ය සීල වශයෙන් පඤ්ච ශික්ෂාපද ද ඉන් මත්තෙහි දු සිල් රක්‍ෂාකිරීමෙහි උත්සාහය ඇති කල්හි සචීකාරාදීන්ගේ මෙන් සාමණෙරයන් විසින් රැකියයුතු දශ ශික්‍ෂා පද ද, උපොපථඞ්ග වශයෙන් නච්චාදි මාලාදී වෙරමණී අඞ්ගවය එකක් කොට රන් රිදී මසු කහවණු පිළිගැනීමෙහි ශික්ෂාව හැර ඉතුරු ශික්ෂාපද අට ද ගෘහස්ථ ශීලය නමැයි දතයුතු.

සීලයෙහි අනුසස්: "පඤ්චිමෙ ගහපතයො, ආනිසංසා සීලවතො සීල සම්පදාය" යනු වදාළ බැවින් සිලයෙන් සමන්විත පුද්ගල තෙමේ "අප්‍රමාද ව මහත් භොගසකන්ධයට පැමිණෙයි. දසදිග යසස් පතලවෙයි. යම් පිරිසකට පැමිණේනම් විශාරද වැ නිර්භීත වැ පැමිණෙයි. නුමුළාව කළුරිය කරයි. මරණින් මතු සවර්ගී ලොකයෙහි උපදී, තවද "පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ" යනාදීන් වදාළ පරිදි කරුණු පසෙකින් යුත් පුද්ගල තෙමේ ගෙන එන ලද්දක් බිම තබන්නාක් මෙන් සවර්ගයෙහි උපදනේය! කවර කරුණු පසෙකින්ද යත්:-"යමෙක් තෙමේ පණිවායෙන් දුරුවීද, අයිනාදනින් දුරුවීද, මිථ්‍යාචාරයෙන් දුරුවී ද, බොරු කීමෙන් දුරුවී ද, රහමෙර පානයෙන් දුරුවී ද යන මේ පඤ්ච ශික්ෂාපද සමාදානයෙන් යුත් පුද්ගල තෙමේ හිස තුබූ බරක් බිම තබන්නාක් මෙන් මරණින් මතු සවර්ගී ලොකයෙහි උපදනා බව වදාළසේක.

"ඤාතීනඤ්ච පියො හොති – මිත්තෙසුච විරොචති
කායස්ස භෙදා සුගතිං – උපපජ්ජති ස සීලවා" යි

දැක්වුණු හෙයින් "සිල්වත් පුද්ගල තෙමේ නෑයින්ට ප්‍රියවූයේ වෙයි, මිත්‍රයින් අතර බබළයි, මරණින් මතු සවර්ගී ලොකයෙහි උපදියි, යමකු ගේ සීලය නිර්මලවී නම් ඔහුගේ උත්පත්තිය සඵලවූයේ වෙයි. හේ නොයෙක් ඵල විපාක ලබන්නෙක් ද වෙයි! භික්ෂුවකගේ ශීලය නිර්මල වීනම් ඔහුගේ පැවිද්ද සඵල වූයේ වෙයි, හේ නොයෙක් ඵල විපාක ලබනෙක් ද වෙයි!

ඒ සීලයාගේ කිලුටුවීම හා පිරිසුදුවීම කවරේ ද? ඛණ්ඩ සබලාදී ස්වභාවය සීලයාගේ කිලුටුවීමය යි ද අඛණ්ඩ අච්ඡිද්‍රාදී ස්වභාවය පිරිසුදුවීමය යි ද දතයුතුයි, සීලය පිළිබඳ ඛණ්ඩ සබලාදී කිලුටුභාවයෝ ලාභ කීර්ති ප්‍රශංසාදිය හේතු කොට ගෙන හා සප්ත මෛථුන යොග වශයෙන් ද ලැබෙන්නාහ.

මේ ශාසනයෙහි යම් භික්ෂුවකගේ සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් මුල හෝ අග හෝ යම් ශික්ෂාපදයක් බිඳුනේ නම් ඔහුගේ සීලය කොන සිඳුණු රෙදි කඩක් සේ කඩවූයේ වෙයි. යම් භික්ෂුවකගේ මැද ශික්ෂාපදයක් සිඳුණේ නම් ඔහුගේ සීලය මැදින් සිදුරුවූ රෙදි කඩක් සේ ඡිද්‍රවූයේ වෙයි, යම් භික්ෂුවකගේ දෙතුන් ශික්ෂාපද කෙනෙක් පිළිවෙලින් බිඳුණාහු නම් ඔහුගේ සීලය පිට හෝ බඩ හටගත් නොසම වූ කළු රතු ඈ සිරුරු පැහැ ඇති කබර දෙනක් මෙන් සබලවූයේ වෙයි යම් භික්ෂුවකගේ සිකපද අතර තුරෙහි බිඳී ගියාහුනම් ඔහුගේ සීලය අතරතුර නොසම වූ පැහැ ඇති බින්දු ලක්ෂණයෙන් විචිත්‍ර වූ තිත් දෙනක් මෙන් කල්මාසවූයේ වෙයි.

මෙසින් සීලයාගේ කිලුටුවීම දැක්විණි. සීලයාගේ පිරිසුදුවීම අඛණ්ඩ අච්ඡිද්‍ද අසබල අකම්මාස භුජිස්ස විඤ්ඤුප්පසත්ථ අපරාමට්ඨ සමාධි සංවත්තනික වශයෙන් අෂ්ට ප්‍රකාරයකින් ලැබෙන්නේයැ, මෙයම සීලයාගේ අෂ්ටාඞ්ගය යි ද සලකනු ලැබේ, එහි යම් සීලයෙකැ ආදියෙහි හෝ අන්තයෙහි ශික්ෂාපදයක් නොබිඳුණේ නම් එය අඛණ්ඩ නම් වේ. යම් සීලයෙකැ මැද ශික්ෂා පදයක් නො බිඳුණේ නම් එය අච්ඡිද්‍ර නම් වේ. යම් සීලයෙක ආදියෙහි හෝ අන්තයෙහි සිකපද දෙකක් තුනක් නොබිඳුණාහු නම් එය අකම්මාස නම් වේ. එබඳු ශුඩ ශීලය තෘෂ්ණා සංඛ්‍යාත දාසභාවයෙන් මිදුන හෙයින් භුජිස්ස නම් වේ. බුද්ධාදී ආර්‍ය්‍යයන් විසින පසස්නා ලද බැවින් විඤ්ඤුප්පසත්ථ නම් වේ. තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ශනය නොකැරුණ බැවින් අපරාමට්ඨ නම් වේ. උපචාර අර්පණා සංඛ්‍යාත සමාධි ප්‍රතිලාභය පිණිස පවත්නා හෙයින් සමාධි සංවත්තනික නම් වේ. මේ සීලයාගේ අෂ්ටාඞ්ගය යි.

සිල්වත් බෞද්ධොපාසකයන් විසින් මිථ්‍යාජීවයෙන් තොර වැ සම්‍යගාජීවයෙහි පිහිටියයුතු හෙයින් අනතුරුව භෙද දක්වනු ලැබේ. එනම්:—

1 මත්පැන් විකිණීම; 2 විෂ බෙහෙත් විකිණීම; 3 සත්ත්ව ඝාතනයට යොග්‍ය වූ ආයුධ විකිණීම; 4 මස් පිණිස එළුවන් ඌරන් කුකුළන් ආදී සතුන් විකිණීම; 5 දූසි දූස් කම්කරුවන් ඇති කොට ධනවතුන්ට විකුණීම යන මේ අධර්ම වෙළඳාම් පසින් මිල මුදල් සපයා අඹුදරුවන් පොෂණය කිරීම හලාහල විෂ පෙවීමක් සේ සලකා මෙයින් ද එමතින් ම වෙන් ව ධාර්මික වෙළ හෙළඳාම් ගොවිකම් ආදියෙන් දිවි පැවැත්විය යුතුයි.

තවද ආත්මීය ශිෂ්ටත්වය නැතිකරන්නාවූ ද මෙලොව පරලොව දෙකින් පිරිහී මිනිස් තිරිසන් බවට පමුණුවන්නාවූ ද ධනොපාර්ජනය නොකළ හැකිවූ ද බුදුන් විසින් ගිහිවිනයෙහි තහනම් කොට පණවා වදාලාවූද,

1 සුරාපානය, 2 සූදුකෙළිම, 3 නෘත්‍ය ථිටර්ස්, බයස් කෝප්, ආදිය බැලීමට යාම, 4 නොකල්හි වීථිසංචාරාදියෙහි යෙදීම, 5 පස්පවු දසඅකුසල් කරන මිත්‍රයන් ආශ්‍රය කිරීම, 6 කම්මැලිකමින් නියමිත වැඩපල ආදිය නොකර කල්තැබීම යන මේ කරුණු හයෙන් තමහට වැඩ කැමති පින්වතුන් විසින් නිරවශෙෂයෙන් වැළකිය යුතු සි!

එසේ ම ධන සැපයීම නොකළහැකිවූ ද සැපයුණු ධනය විනාශවීමට මඟ සැලසෙන්නාවූ ද සිදුරු හයක් තිබේ.

එනම්:— 1 කම්මැලිකම, 2 සිහිමුළාව විසීම, 3 උට්ඨාන වීර්‍ය්‍යය නැතිබව, 4 සිල්වත්ව නොසිටීම, 5 නොවේලෙහි නිදීම, 6 නැතැනීම (=හොම්බරිකම) යන මොහුය.

මෙම සිදුරු නැති කොට ශ්‍රද්ධා වීර්‍ය්‍ය ප්‍රඥා උපදවා සිහියෙන් කල්යැවී ම සිල්වත් බෞද්ධයන්ගේ ලක්ෂණයෙකි.

මෙසේ කල්යවන ගෘහස්ථයන් විසින් සැප සතරක් අයත් කොට ගිහිගෙයි විසියයුතුබව වදාළසේක.

ඒ සැප සතර නම්:— i අත්ථි සැපය. ii භොග සැපය. iii අණන සැපය. iv අනවජ්ජ සැපය යන මොහු යි.

එහි i. අත්ථි සැපය නම්: උසස් පමණින් හෝ මධ්‍යම ප්‍රමාණයෙන් හෝ යන්තමින් හෝ ගිහියකුට වුවමනා කරන වතු පිටි ගම් කුඹුරු ගව මහිෂාදී දේපල ඇතිව සිටිමේ සැපය යි.

ii තිබෙන පමණින් පමණ දැන ගෙන අපතේ නොහැර යථා විධියෙන් ප්‍රයෝජන ගැනීමෙන් ඇතිවන සැපය භොග සැපය යි.

iii දේපල ඇති පමණ සලකා කටයුතු යොදා ගෙන කිසි විධියකින් ණය නොවී සිටීම අණන සැපය යි.

iv කාය වචන හිතින් කිසිවකුට අපරාධයක් නොකර නොසිතා පස්පවු දස අකුසල් දුරු කොට ආත්ම දමනයෙන් යුක්ත වැ විසීම අනවජ්ජ සැපයයි. තමන්ගේ ධර්මබලය නිර්මාණ කොට ගෙන ඔවුනොවුනට මෙකී සැප සතර අයත් කර ගැනීමට හැකි වන්නේය!

## ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා.

බෞද්ධයන් විසින් දාන සීල භාවනා වශයෙන් තුන් කුශල් වස්තු සැපයිය යුත්තාහ. ඔවුහු මෙහි පුණ්‍යක්‍රියාය යි කියනු ලැබෙත්.

**එහි දානය වනාහී චේතනා දානය, දෙය්‍යධර්මදානය යි ද්විප්‍රකාර** වේ. චේතනා දානය තෙමේ අෂ්ටවිධ කාමාවචර කුශල චේතනා වශයෙන් අට වැදෑරුම් වේ. පුණ්‍ය ක්‍රියා වස්තු වශයෙන් දානමය සීලමය යි, ද්විප්‍රකාර වේ. කාය වාක් මනො කර්ම වශයෙන් තෙ වැදෑරුම් වේ. ප්‍රතිසන්ධි වශයෙන් නව වැදෑරුම් වේ. විපාක දීමේ හැටියෙන් සොළොස් පරිදි වේ. ඒ කෙසේද යත්:—

දනක් දියයුතුය යි යමෙකුගේ සිත දානයෙහි පිරිනමන ලද ද නිතර සිහිකිරීම් වශයෙන් හසුරුවන ලද ද ප්‍රතිරූප දෙශවාසය සත්පුරුෂාශ්‍රය. සද්ධර්මශ්‍රවණය. කෘත පුණ්‍යභාවය යනාදිය හේතු කොට ගෙන නුවණින් සලකන ලද ද යන මේ ප්‍රත්‍යය හේතු—වෙන් ඕහට කුශල් පිළිබඳ චේතනා දානය උපදී. අන් පරිද්දෙ—කින් නොලැබේ.

ඒ චේතනාව ද යම් කාලෙක්හි බලවත් ශ්‍රද්ධාවය, ආනිසංස දක්නා බවය, දෙය්‍ය ධර්ම ප්‍රතිග්‍රාහකාදී සම්පත්තිය, යන මොවුන්ගේ ප්‍රතිලාභයෙන් තුටුපහටු ව නැණවතුන්ගේ සේවන යෙන් "අත්‍ථිදින්නං" යනාදී දශාකාරයකින් පැවැතියාවූ සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට පසු නොබස්නේ මෛරමා විසින් [illegible]නා මෙහෙයන ලදුව දන්දේ ද එකල්හි සොම්නස් සහගත ඥාන-

සම්ප්‍රයුක්ත අසංසකාරික ප්‍රථම කාමාවචර කුසල් සිත උපදී. යම් විටෙක කී ක්‍රමයෙන් සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට නොපහකළ මසුරු බැව් ආදීන්ගේ වශයෙන් පසු බසිමින් හෝ මෙරමා විසින් මෙහෙයන ලදුව හෝ දන් දේ ද, එ කල්හි සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංසකාරික දෙවන කාමාවචර කුසල් සිත යෙදෙ යි. යම් කලෙක ඥාති සමූහයාගේ ප්‍රතිපත්ති දකීමෙන් පළ පුරුදු යහපත් ගති ඇති දරුවෝ භික්ෂූන් දුක සතුටු සිතැති වැ වහා අත තුබූ දෙයක් දෙත් ද, එ කල්හි සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත අසංසකාරික තුන්වෙනි කාමාවචර කුසල් සිත ලැබේ. යම් විටෙක ඥාතීන් විසින් "දරුවෙනි, දානය කරව්!" යනාදීන් උත්සාහවත් කරවන ලදුව දෙත් ද, එකල්හි සිවුවෙනි සසංසකාරික කාමාවචර කුසල සිත ලැබේ. යටකී සොම්නස් හේතුන්ගේ අභාවයෙන් සතර වාරයකාම සොම්නස් රහිත ව දන් දෙත් ද. එකල්හි සෙසු සිත් සතර උපෙක්ෂා සහගත ව උපදිත්. මෙසේ කාමාවචර කුසල චේතනා වශයෙන් අටවැදෑරුම් වේ.

යම් විටෙක දියයුතු වස්තුවක් ලැබ මා විසින් දානයක් දිය යුතුය යි දෙයි ද, එකල්හි දානමය වේ, යම්කලෙක දෙය්‍ය ධර්මයක් ලැබ මෙය මාගේ කුල වංසය–කුල පෙළපතය—කුල ප්‍රවේණිය යි සලකා දේද, එකල්හි සීලමය වේ. මෙසේ පුණ්‍ය ක්‍රියා වස්තු වශයෙන් විප්‍රකාර වේ.

සියතින් දන් දේද එකල්හි කාය කර්මය යි, දූ දරුවන්ට හා දූසි දස් ආදීන්ට අණවා දන්දෙයි ද, එකල්හි වාක්කර්මය යි. දීමට සුදුසු වස්තුවක් ලැබ මෙය දන් දෙන්නෙමි යි සිතයි ද, එකල්හි මනොකර්මය යි මෙසේ කාය වාක් මනොකර්ම වශයෙන් තෙවැදෑරුම් වේ.

ඒ මේ කාමාවචර කුසලය බනාගී කාම සුගතියෙහි නවවිධවූ කාමාවචර ප්‍රතිසන්ධිය දෙයි. පසුව සුදුසු පරිද්දෙන් කාමරූප භූමින්හි සොළොස් (16) වැදෑරුම් වූ ප්‍රවෘත්ති විපාක ගෙන දෙයි. හේ කෙසේද යත් :—

අටවැදෑරුම් ඒ දානමය කුසලයන් අතුරෙන් යම් කුසලයක් තමාගේ ප්‍රවෘත්ති කාලයෙහි පූර්ව පශ්චිම භාගයෙහි පැවැතියා වූ කුසල් සිත් විසින් පිරිවරන ලදුයේ පසුව ආසේවන ප්‍රත්‍යය ලාභයෙන් හෝ මනාකොට පුරුදු කරන ලද්දේ වේ ද හේ උත්කෘෂ්ට නාම වේ. යම් කුසලයක් අකුසලයන් විසින් පිරිවරන ලදුයේ

පසුව මා විසින් නපුරු කොට කරන ලද්දේය යි විපිළිසර බැවි ඉපද වීමෙන් හෝ කෙලෙසන ලද්දේ වේද. හේ ඔමක නම් වේ. එහි යම්බඳු ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලයක් වේද, හේ එකම ප්‍රතිසන්ධියක් දී පසුව ප්‍රවෘත්තියෙහි සොළොස් විපාකයක් දෙයි. යම්බඳු ත්‍රිහෙතුක ඔමක කුසලයක් හෝ ද්‍විහෙතුක උත්කෘෂ්ට කුසල යක් වේ ද, හේ එකම ප්‍රතිසන්ධියක් දී පසුව ත්‍රිහෙතුක වර්ජිත වූ දොළොස් විපාකයන් දෙයි. යම්බඳු ඔමක ද්‍විහෙතුක කුසලයක් වේද, හේ මනුෂ්‍යයන් අතර ජාත්‍යන්ධ ජාතිබධිර නපුංසක උභතො බ්‍යඤ්ජනකාදී අහෙතුක ප්‍රතිසන්ධි දීමෙන් පසුව අටවැදෑරුම් වූ අහෙතුක විපාක දෙයි. 'එකා චෙතනා හි එකමෙව පටිසන්ධිං දෙති, පවත්ති විපාකං පන අනෙකෙසු ජාති සත සහස්සෙසු දෙතියෙව"

(=එකම චෙතනාවක් එකම ප්‍රතිසන්ධියක් දෙයි, ප්‍රවෘත්ති විපාකය වනාහී නොයෙක් ලක්‍ෂගණන් ජාතියෙහි දෙන්නේ ය.) යනු දක්වුණු හෙයින් එක් ජවන් විපියෙක සත් ජවන් සිත් අතුරෙන් පළමුවෙනි ජවන චෙතනාව ඉහාත්මයෙහි විපාක සපයන හෙයින් දෘෂ්ට ධර්මවේදනීය නම් වේ.

අර්ථ සාධක වූ සත්තම ජවන චෙතනා තොමෝ උපපද්‍යවේදනීය කර්ම නම්, හේ අනතුරු අත් බැව්හි විපාක දෙයි, එසේ නොහැකි වීනම් අහොසි කර්ම වේ. ඉතුරු ජවන් සිත්පස අපර පරියාය වේදනීය කර්ම නම් වේ. ඔවුහු අනාගතයෙහි අවකාශ ලැබෙන පරිදි විපාක දෙති. සසර පැවැත් ම ඇතිතාක් අහොසික නොවෙති. එයින් මිදුන සත්ත්වයෙක් නැත්තේය.

මෙසේ චෙතනාදානය කුසල විපාක අහෙතුක ප්‍රතිසන්ධිය සහෙතුක මහාවිපාකඅට යන මේ නව වැදෑරුම් ප්‍රතිසන්ධි වශයෙන් ද සහෙතුක අහෙතුක සොළොස් වැදෑරුම් ප්‍රවෘත්ති විපාක වශයෙන් ද, ප්‍රභෙද වූයේ වෙයි. සීලමය භාවනාමය කුසලයන්හි ද මේ ප්‍රභෙදය මෙසේ ම අවබොධ කටයුතුයි. දෙය්‍ය ධර්ම්ම දානය වනාහී:—

**1. ආමිෂ දානය.** 2. **අභය දානය.** 3. **ධර්ම්දානය** යි. දිය යුතු වස්තූන්ගේ වශයෙන් තෙවැදෑරුම් වේ. එහි 1 ආමිෂ දාන යද: i බාහිර දානය ii අධ්‍යාත්මික දානය යි දෙවැදෑරුම් වේ. i. බාහිර දානය වනාහී සූත්‍ර ක්‍රමයෙන්:—

1. ආහාර දානය.
2. පාන වර්ග දානය.
3. ආවාස දානය.
4. වස්ත්‍ර දානය.
5. යාන දානය.
6. මාලා දානය.
7. විලෙපන (විලවුන්) දානය.
8. ගන්ධ දානය.
9. සයන දානය
10. පහනට හිතවූ තෙල දානය යි

දාන වස්තු වශයෙන් දසයෙක් වෙති. විනය ක්‍රමයෙන්:-

1. චීවර දානය.
2. පිණ්ඩපාත දානය
3. සෙනාසන දානය.
4. ගිලාන ප්‍රත්‍යය දානය යි

ප්‍රත්‍යය වශයෙන් සිවු වැදෑරුම් වේ. අභිධර්ම ක්‍රමයෙන්:-

1 රූප දානය
2 ශබ්ද දානය
3 ගන්ධ දානය
4 රස දානය
5 ස්පර්ශ දානය
6 ධර්මාරම්මණ දානය යි

සවැදෑරුම් වේ.

1. එහි නීලාදී පැහැ ඇති මල් ආදීන් අතුරෙන් එක්තරා දෙයක් ලැබ වර්ණ වශයෙන් සලකා (මේ මාගේ වර්ණ දානය යි සිතා) තෙරුවන් පුදා ද එකල්හි හේ රූප දාන නම් වේ.

2 ශබ්ද දානයක් දෙන්නෙමි යි හෙරි මෘදඞ්ගාදිය වාදනය කරවා ද, ස්වර හෙදයට බෙහෙත් ආදිය සපයා දෙයි ද, ධර්මශ්‍රවණය පිණිස කාල ඝොෂා කෙරේද, ශබ්ද නගා බණකියයි ද, ධර්ම කථා හෝ කෙරේද හේ ශබ්ද දානය වේ.

3 සුගන්ධ ද්‍රව්‍යයෙන් තෙරුවන් පුදනම් හේ ගන්ධදානය යි.

4 මූලරස මධුරසාදියෙන් තෙරුවන් පුදනම් හේ රස දාන නම් වේ.

5 ඇඳ පුටු කොට්ට මෙට්ටාදී සැප පහස් ඇති වස්තු පරිත්‍යාගය ස්පර්ශ දානය යි

6 ධර්මාරම්මණ දානය වනාහි i ඔජා දානය, ii පාන දානය, iii ජීවිත දානය යි තෙවැදෑරම් වේ.

i ගිතෙල්, වෙඬරු ආදිය දීම ඔජා දානය යි, ii අෂ්ටවිධ පාන වශීයෙන් දීම පාන දානය යි, iii සලාක බත් පක්ඛික බත් ආදිය දීම ද, රෝගයෙන් පීඩිතවූවන්ට බෙහෙත් සපයා දීමද, සත්ත්ව ඝාතනය පිණිස පවත්නාවූ දැල්, කරක්, කෙමන් කොටු ආදිය සුන්බුන් කොට දැමීම ද, සතුන්ගේ දිවි රැකීමට හේතුවූ "මාඝාතා'' දී නීති පැණවීම ද යන මේ අදියාදිය ජීවිත දානය යි මෙසේ ප්‍රභෙද වූයේ ධර්මාරම්මණක දානය යි. මේ කියැවුණේ බාහිර දානවිභාගය යි.

ii. යම් කිසි බොධිසත්ත්වයෙක් පත්‍රා දාන වශයෙන් ඇස් ඉස් මස් ආදිය පරිත්‍යාග කිරීම ද! ස්වකීය ජීවිතය තමූත් නිර්ලෝභී වැ ඉල්වන් නෙකුව දාන වශයෙන් පරිත්‍යාග කිරීම ද! අධ්‍යාත්මික දාන නම් වේ. මෙසේ බාහිර අධ්‍යාත්මික වශයෙන් ආමිෂ දානයාගේ භාවය දතයුතු යි.

2. අභය දානය නම්:-

රජ සොර සතුරු ගිනි දිය යන මොවුන්ගෙන් ද, සිංහ ව්‍යාඝ්‍ර යක්ෂ රාක්ෂෂාදීන් කෙරෙන් ද, සතුන්ට භයක් පැමිණි විට එයින් ආරක්ෂා කිරීමයි. ප්‍රාණඝාතාදියෙන් වෙන් වැ විසීම ද, සත්ත්වයනට අභය දානය දීමය යි දක්වා තිබේ.

3 ධර්ම දානය නම්:-

මේ කුශල ධර්මය, මේ අකුශල ධර්මය, මේ සාවද්‍ය ධර්මය, මේ අනවද්‍ය ධර්මය, මේ නුවණැත්තන් විසින් නින්දාකටයුතු ධර්මය, මේ නුවනැත්තන් විසින් පසස්නා ලද ධර්මය, සම්පූර්ණ කරන ලද සමාදන් වන ලද මේ ධර්මයෝ අහිත පිණිස දුක් පිණිස පවත්නා හුය. මේ ධර්මයෝ හිත සැප පිණිස පවත්නාහුය යි කුශලාකුශල කර්ම පථයන් ද, කර්ම විපාකයන්ද, මෙලොව පරලොව දෙක ද යනාදිය පැහැදිලි කොට දක්වමින් අකුසලින් වළක්වා කුසල්හි පිහිටුවා ධර්මදෙශනා කිරීමයි.

යමෙක් වනාහී මේ ධර්මය පරිඥාතය කටයුතුය, මේ ධර්මය ප්‍රහාණය කටයුතුය, මේ ධර්මය ප්‍රත්‍යක්ෂ කටයුතුය, මේ ධර්මය වැඩිය යුතුය යි සිවුසස් දක්වමින් නිර්වාණාවබොධය පිණිස දහම් දෙසයි ද මෙය ශිඛා ප්‍රාප්ත (=මුදුන් පැමිණි) ධර්ම විනය යි කියනු ලැබේ.

"සබ්බදානං ධම්මදානං ජිනාති" යනුවෙන් "සියලු දානයන්ට වඩා ධර්මදානය ජයගනී" යි වදාළ බැවින් මෙහි දැක්වුණු සියලු දානයන්ට වඩා ධර්මදානය ම උතුම් බව සැලකිය යුතු.

චීවරාදී සිවුපස දානවස්තුව යටකී භික්ෂු ප්‍රතිපත්තියෙන් යුත් සිල්වතුන්ට ම පිදිය යුතුය! දුස්ප්‍රතිපත්තික අලජ්ජී අශ්‍රමණයන් කෙරෙහි නොපිදිය යුතු!

## දුශ්ශීල සේවනය.

සිල්වත් බෞද්ධොපාසකයන් විසින් දුශ්ශීලයාගේ තත්වය දැන ඔවුන් ආශ්‍රය කිරීමෙන් තොර වැ සංවර වියයුතු හෙයින් දැන විස්තරයට අනතුරු ව දුශ්ශීල සේවනය හා එහි භෙද විනිශ්චය සැකෙවින් දක්වනු ලැබේ. දුශ්ශීලයා නම් දූෂ්‍යවූ සිල් ඇති යේ හෝ සිල් නැති තැනැත්තේය. 1 ගිහි දුශ්ශීලයාය, 2 ශ්‍රමණ දුශ්ශීලයාය යි දුශ්ශීලයෝ දෙදෙනෙක් වෙති.

1. ගිහි දුශ්ශීලයා නම්: "දක්ඛිණාවිභඞ්ග සූත්‍රයෙහි" "දුස්සීලෙ දානං දත්වා සහස්ස ගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා" යනුවෙන් දැක්වුණු පස් පවු දසඅකුසල් කරමින් අධර්මයෙන් දිවි පවත්වන අඥාන පුද්ගලයා ය.

2. ශ්‍රමණ දුශ්ශීලයා නම්: මහණවෙස් ගෙන කාය වාක් සංවරයෙන් තොරවැ සප්තා පත්ති ස්කන්ධයන් ඉක්මවා භික්ෂු ධර්මයට විපක්ෂ ව ක්‍රියා කරන අලජ්ජී පුද්ගලයාය.

1. දූශිත දුශ්ශීලයාය, 2 ඡේද්‍යගාමිනී දුශ්ශීලයා යි, ශ්‍රමණ දුශ්ශීලයෝ දෙ දෙනෙක් වෙති.

1. දූශිත දුශ්ශීලයා නම්. සිය පුහුදුන් බැව් නිසා සිහිමුළාවීම් ආදියෙන් සඟ වෙසෙස් පච්ති දුකුළා දුබැසි අවැත් ඇවැදියේ භය ලජ්ජාවට පැමිණ අවත් ඇවැත් වලින් නැගී නොසිටින අලජ්ජී පුද්ගලයාය.

2. ඡේද්‍ය ගාමිනී දුශ්ශීලයා නම්: තමන්ගේ හා උපස්ථා-නාදිය කරන ශිෂ්‍ය දායකාදීන්ගේ ද ස්වර්ග මොක්ෂ මාර්ගයන් ආවරණය කරන යටකී පාරාජිකාවන් ගෙන් යම් කිසි පාරාජිකාව කට පැමිණ සියලු ගුණදම් සිඳවසන ශ්‍රමණ දුශ්ශීලයා යි.

තවද වෙදකම් කරන, නැකත් කියන, වෙළ හෙළඳම් ගොවිකම් ආදිය කරන, ගිහියන්ගේ පණිවුඩ පණත් ඉටු කරන ඉඩ කඩම් වවන, සල්ලි මිල මුදල් සපයන, සල්ලි පොලියට දෙන, ආණ්ඩුවේ උසාවිවල නඩුහබ කියන, සඟසතු ඉඩ කඩම් ආදිය ශිෂ්‍යානු ශිෂ්‍යයනට ඔප්පුසිට අයිති කරදෙන ඇත් අස් ගව මහිෂාදීන්ගේ ස්වාමියෙක් ව වසන අනුන්ට අලාභ හානි පමුණුවන අත්ලස් ගන්න, කාෂාය වස්ත්‍රධාරී අලජ්ජී පාපිෂ්ඨ පුද්ගලයෝ ද මෙකී දෙවැදෑරුම් දුශ්ශිලයන්ට ඇතුළත් වෙති. එයින් ඡේද්‍යගාමිනී දුශ්ශීලයා සම්බන්ධ ව. "උපසම්පන්නො නම්පි පාරාජික සමාපත්තියා සරණාගමනාදී සාමණේර භාවස්සා පි විනාසනතො සෙනාසන ගාහො පටිප්පස්සම්භති සංඝලාභම්පි සො න ලභතානි!,,

(=යනුවෙන් හෙරණුන් ගේ පමණක් නොව උපසම්පන්නයන් ගේ ද පරිජි ඇවතට පැමිණි මෙන් සරණගමනාදී !සාමණේර භාවය ද විනාශ වන හෙයින් වස් එළඹීමය යි කියන ලද සෙනසුන් ගැන් ම සන්සිඳෙයි.(=පහවෙයි.)ඔවුහු සඟසතු ලාභ යද නොලබත් ය යි ප්‍රකාශිත හෙයින් ඡේද්‍ය ගාමිනී ශ්‍රමණ දුශ්ශීලයා හට (තද වස්ථායෙහි) සරණ මාත්‍රය කුදු ශේෂ නොවන බව පැහැදිලියැ.

පිටිසර වැසි පුරුෂයෙක් රජකෙනකුගේ සිත් ගෙන පිළි- වෙළින් ගම් මුලාදෑනි තනතුරකට ද,-ඉන් මුදලි තනතුරකට ද, පත්ව සිටින අතර මුදලි තනතුරට විරුද්ධ කටයුතු කිරීමෙන්, කෝපයට පැමිණි රජ ඇමතියන් ඔහු මුදලි තනතුරෙන් බැහැර කරත් මැ අතික් තනතුරෙන්ද බැහැර වූයේ යම් සේ ද! එමෙන් උපසපන් මහණක් හට පරිජි ඇවැත් පැමිණි මෙන් සරණ ගමනාදී අන් සියලු ගුණ යෝ ද විනාශයට පැමිණෙති! එහෙයින් ඔහු (ඡේද්‍යගාමිනී ශ්‍රමණ දුශ්ශීලයා) ශාසනයට ද සැදැහැවතුන්ගේ සිවුපස පරිභොගයට ද අභව්‍ය වූ භ්‍රෂ්ට පුද්ගල යෙකැ යි දත යුතු.

“යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ දුස්සීලා පාපධම්මා -පෙ- කසම්බු ජාතා දස්සනං පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං අනත්ථාවහං වදාමි!” යනුවෙන් (=දුශ්ශීල භික්ෂූන්ගේ දැකීම් ද, වචන ඇසීම ද, ඔවුන් සිහිකිරීම ද, අනුව පිළිපැදීම ද, ඔවුන් සමීපයට පැමිණීම ද, නැවත නැවත ළඟ ඉඳීම් වශයෙන් ඇසුරු කිරීම ද, අපාය දුක් එළවන හෙයින් අනර්ථදායකය යි වදාරා තිබේ.

“එවරූපො භික්ඛවෙ, පුග්ගලො ජිගුච්ඡිතබ්බො න සෙවි- තබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො,, යනාදීන් ශ්‍රමණ

දුශ්ශීලයා අසූචියක් මෙන් පිළිකුල් කටයුතු ය. ඔහු සමීපයට නො එළඹිය යුතු ය. ඔහුගේ කිසි ක්‍රියාවට ඇලුම් නොකට යුතු ය. ඔහු වෙන හිඳීම් වශයෙන් නැවත නැවත නො පැමිණිය යුතු යයි වදාළ හෙයින් ශ්‍රමණ දුශ්ශීලයා සෙවනය භජනය පයිරුපාසනය නොකොට වර්ජනය කටයුතු.

ගිහි දුශ්ශීලයා සෙවනය භජනය පයිරුපාසනය නොකට යුතු ය යි වදාළා මිස පිළිකුල් කටයුතු ය යි, නොවදාළ බැවින් ගිහි දුශ්ශීලයාට වඩා ශ්‍රමණ දුශ්ශීලයා අතිශයින් නින්දා කටයුතු වූ කිසිත් ගුණයක් නොමැති හිස් පුද්ගලයෙකැ යි දතයුතු.

ජේද්‍යගාමිනී ශ්‍රමණ දුශ්ශීලයාට සිවුපස දානයක් පිටකත්‍ර—යෙහි ම නිසම වැ නැත්තේය. එහෙයින් "දුස්සීලස්ස පරිභොගො ථෙය්‍ය පරිභොගො,, යනුවෙන් දුශ්ශීලයාගේ සිවුපස පරිභොගය (ඔහුට අයිති නොවූවක් බැවින්) චෞර පරිභොගයෙකැ යි දක්වන ලදී. "සුතාදිගුණ යුතොතා පි අපූජාර්හො සුසානගගි විය බ්‍රාහමණානං!" යනුවෙන් "බහුශ්‍රැත බැව් ආදී ව්‍යක්ත ගුණයෙන් යුක්ත වූයේ නමුදු දුශ්ශීල පුද්ගලයා බමුණන්ට සොහොන් ගින්නක් සේ පූජාවට සුදුසු නොවේය!,, යි දක්වා තිබේ.

ජේද්‍යගාමිනී ශ්‍රමණ . දුශ්ශීලයා බව දැන දැන ඔහුට පූජා සත්කාර හා බුහුමන් කිරීම ඔහුගේ දුශ්ශීල භාවාදිය තව දුරට ත් දියුණු කරලීමට අනුබල දීමෙක් වෙයි! බුදුන් විසින් එබඳු ශ්‍රමණ දුශ්ශීලයාගේ ආශ්‍රය ද, ළඟට යාම ද, ඔහුගේ වචන ඇසීම ද, නොකට යුතුය යි තහනම් කොට අසූචියක් මෙන් පිළිකුල් කටයුතුය යි වදාරන ලදී. අසූචියට වුවත් පිරිසුදු කරන අදහසින් සමීප වීම මෙන් "අඤ්ඤත්‍ර අනුද්දයා අඤ්ඤත්‍ර අනුකම්පාය" යනුවෙන් දුශ්ශීලයා ඉන් මුදවාගැනුම් වස් ආශ්‍රයට පමණක් ඉඩ තබා සෙවනාදිය තහනම් කර තිබේ.

එහෙයින් උපාසක උපාසිකාදී කිසිවෙක් ජේද්‍යගාමිනී ශ්‍රමණ දුශ්ශීලයා දැන දැන සෙවනය භජනය පයිරුපාසනය කෙරෙමින් ඔහුගේ අවවාදයට අවනත වැ එහි පිහිටීමෙන් දෘෂ්ටානුගතියට බැඳී දන් දීමාදී පූජාසත්කාර කෙරේනම් ඒ දායකයා ද ශ්‍රමණ වෙශධාරියා ද යන දෙදෙන ම මරණින් මතු නරකාදී සතර අපා දුකට භාජන වන බව බුදු දහමින් පැහැදිලි වෙයි!

"දානං නාම න කස්සචි නිවාරිතං" යනාදීන් කිසිවකුට දන් දී ම නො වළක්වන ලදී. යාචක වශයෙන් පැමිණි දුශ්ශීලයාට හිඟුමන් වශයෙන් යමක් දිය යුතුය යි දක්වෙන හෙයින් පිඩු පිණිස

වෙත පැමිණි දුශ්ශීලයාට තමන්ගේ ත්‍යාග ධර්මය කාඩ නොවී ම පිණිස යාචකත්වය සලකා ආහාරාදී යමක් දීමට ඉඩ ඇත ත් ඉන් වැඩි කටයුතු කිරීමෙන් හිරකරුවන්ට උදව් දීමක් මෙන් වරදට බැදීමට හේතුවන බව සැලකිය යුතු.

"සෙවතානි උපසඞ්කමනං සෙවනං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති" වෙත එළඹීම් වූ සෙවනය ද බොහෝ කාලක් අහිත පිණිස දුක් පිණිස වේයයි දක්වෙන බැවින් එබඳු ශ්‍රමණ දුශශීලයන් සොයා ගොස් ඔවුන් වෙත පැමිණ චීවර පිණ්ඩපාතාදිය දීම අපා-යොත්පත්තියට හේතු වූ අසත්පුරුෂ සංග්‍රහයක් බව නිසැක ව දතයුතු. එසේ දන උපාසක උපාසිකාදීන් විසින් එබඳු දුශ්ශීල සෙවනොපසථානාදියෙන් තොර වැ යට කී පරිදි සතර සංවර ශීලයෙන් යුත් සුපෙශල ශික්ෂාකාමී කල්‍යාණමිත්‍ර සිල්වත් ගුණවත් ලජ්ජී ප්‍රියශීලී භික්ෂූන්ගේ ආශ්‍රයට පැමිණ, යථා ශක්තින් සිවුපසින් උපසථාන කොට, පින් සිදු කර ගත යුතු යි! භාවනාව වනාහි මතු ප්‍රකාශ වේ.

දෙවැදෑරුම් විනය අතුරෙන් මේ හැම සංවර විනයට ඇතුළත් ධර්ම වෙති. මේ සියලු ම සංවරය නමා පිළිබඳ, සංවර කටයුතු වූ ද, හික්මවිය යුතු වූද, කාය දුශචරිතාදී සියලු දෙෂයන් සංවර කරන හෙයින් සංවරය යි ද, හික්මවන හෙයින් විනයය යි ද කියනු ලැබේ. මෙසේ සංවර විනය පස් පරිච්ඡෙදකින් ප්‍රභෙද වී යයි සැලකිය යුතු. අනතුරු ව විස්තර කටයුතුව තිබෙනුයේ ප්‍රහාණ විනය යි. හේ මෙහි සැකෙවින් දක්වනු ලැබේ. කෙසේද යත්:—

## (2) ප්‍රහාණ විනය.

සංවර විනය මෙන් ප්‍රහාණ විනය ද :-

i තදඞ්ගප්‍රහාණ ය,
ii විෂ්කම්භන ප්‍රහාණ ය,
iii සමුච්ඡෙද ප්‍රහාණ ය,
iv ප්‍රති ප්‍රශ්‍රබ්ධි ප්‍රහාණ ය,
v නිශ්ශරණ ප්‍රහාණය යි පස් වැදෑරුම් වේ.

i. නාම් රූ දෙක වෙන් කර ගැනීමාදී වූ විවසුන් නුවණව පිළිපන් බැවින් පහනින් අඳුරු විධමන සේ ඒ ඒ විවසුන් නැණින් එයට ප්‍රතිවිරුඞ අවයවයාගේ යම් ප්‍රහාණය කිරීමෙක් වේද, හේ තදඞ්ග ප්‍රහාණ නම් වේ. කෙසේද යත්:—

නම් රූ දෙක වෙන් කොට සලකා බැලීමෙන් එයට ප්‍රතිවිරුඬ වූ විංශති වස්තුක සක්කාය දෘෂ්ටියගේ ප්‍රහාණය වන්නේ ය. එසේ ම අවිද්‍යා තෘෂ්ණාදී වූ ප්‍රත්‍යය පරිග්‍රහයෙන් (හෙවත් ප්‍රතිසන්ධියෙහි නාමරූප දෙක අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම යන මේ හෙතූන්ගේ වශයෙන් උපදනේ ය.) ප්‍රවෘත්තියෙහි දු රූපය, කර්ම, චිත්ත, ඍතු, ආහාර ප්‍රත්‍යය වශයෙන් ද, නාමය ද චක්ෂුරාදි නිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් හා රූපාදී ආලම්බන ප්‍රත්‍යය වශයෙන් ද විශෙෂයෙන් යොනිසො මනසිකාරාදී චතුෂ්චක්‍ර සම්පත්තියෙන් කුශලය ද අයොනිසො මනසිකාරාදී වශයෙන් අකුශලය ද, කුශලාකුශල වශයෙන් විපාකය ද, භවඞ්ගාදී වශයෙන් ආවර්ජනාදිය ද, රහතුන්ගේ ශුඬසන්තානාදී වශයෙන් ක්‍රියා ජවන ද උපදින්නු යි මෙසේ සාධාරණ සාධාරණ වශයෙන් අතීතාදී කාලත්‍රයෙහි නාම රූපයන්ගේ පැවැත්මට අනුමානාගම ප්‍රත්‍යක්ෂ සිඬි ඇති කර්මාදී ප්‍රත්‍යයයාගේ අයත් කොට ගැන්මෙන් (සමුදය සත්‍යයයාගේ නිශ්චය කිරීමෙන්) අහෙතු විෂමහෙතු දෘෂ්ටින්ගේ ද, කඞ්ඛාවිතරණ විසුඬියෙන් හෙවත් සොළොස් වැදෑරුම් වූ ද අට වැදෑරුම් වූ ද සැක එතර කළ හැකි වූ පිරිසුදු නුවණින්–

1 අතීතයෙහි මම වූයෙම් ද?
2 අතීතයෙහි නොවූයෙම් ද?
3 අතීතයෙහි කවරෙක් වූයෙම් ද?
4 අතීතයෙහි කෙසේ වූයෙම් ද?
5 අතීතයෙහි කෙබන්දෙක් ව කෙබන්දෙක් වීම් ද?
6 අනාගතයෙහි මම වන්නෙම් ද?
7 අනාගතයෙහි නොවන්නෙම් ද?
8 අනාගතයෙහි කවරෙක් වන්නෙම් ද?
9 අනාගතයෙහි කෙසේ වන්නෙම් ද?
10 අනාගතයෙහි කෙබන්දෙක්ව කෙබන්දෙක් වන්නෙම්ද?
11 මම වෙම් ද?
12 මම නොවෙම් ද ?
13 මම කවරෙක්වෙම්ද?
14 කෙසේ වෙම් ද?
15 මේ සත්ත්වයා කොහි සිට ආවේ ද?

16 හේ කොහි යන සුලුද? යන මේ සොළොස් වැදෑරම් වූ ද, "සත්ථරි කඞ්ඛති" යනාදී අටවැදෑරුම් වූ විචිකිච්ඡාවගේ ද රූපාරූප සන්තති වශයෙන් කලාප සම්මශීනයෙන් (හෙවත් යම් රූපයෙක් අතීතයෙහි ජාත ද, හේ අතීතයෙහි ම නිරුඬය. යම්

රූපයෙක් අනාගතයෙහි වන සුළු ද,හෙද එහිම නිරුඬ වන්නේය. යම් රූපයෙක් වර්තමානයෙහි උපදීද? එය අනාගතයට නොපැ-මිණ එහිම නිරුඬ වන්නේය. එසේම ආධ්‍යාත්මික වූ ද බාහිරවූ ද සූක්‍ෂම වූ ද, ඖදාරික වූ ද, හීණ වූ ද, ප්‍රණීත වූ ද, රූපාදී හු ඒ ඒ කාලයෙහි ඉපද නිරුඬ වන්නා හ,, යනාදීන් සමූහ වශයෙන් කැටි කොට ක්‍ෂයට පැමිණෙන අර්ථයෙන් අනිත්‍යය. භයව කරුණු හෙයින් දුකය. ආත්ම රහිත හෙයින් අනාත්මය යි ද, එසේම ඇස, කන, නැහැය, දිව ශරීරය, සිත යන මොහු අනිත්‍යයහ. චක්‍ෂුර් විඥනය ශ්‍රොත විඥනය ඝ්‍රාණ විඥනය ජිහ්වා විඥානය, කාය විඥනය, මනො විඥානය යන මොහු අනිත්‍ය දුඃඛ අනාත්ම යහ යි යනාදීන් අතීතාදී කාල වශයෙන් ද රූප සන්තති අරූප සන්තති වශයෙන් ද, අතීතාදී ක්‍ෂණ වශයෙන් ද "හුත්වා අභාව, උදයව්‍යය පතිපීළන, අවසවත්තනාකාර සඞ්ඛ්‍යාත ලක්‍ෂණත්‍රය සම්මශීන වශයෙන් පැවැතියාවූ කලාප සම්මශීනඥනයෙන්) මමය මාගේය යි වරදවා ගන්නා දෘෂ්ටියගේ ද,

මාර්‍ගා'මාර්‍ගයන් ව්‍යවස්ථා කිරීමෙන් (හෙවත් අවභාසාදී වූ දශ උපකෙලශයෝ මාර්‍ගයෝ නොවෙති.) විදර්‍ශනාව කෙලෙසන ධර්මයෝ යැ. තදන්‍ය වූ වීපිප්‍රතිපන්න වූ විදර්‍ශනා ඥනය ම මාර්‍ග-යයි මෙසේ මාර්‍ග ස්වරූපය නිශ්චය කිරීමෙන් අමාර්‍ගයෙහි මාර්‍ගය යන සංඥවගේ ද,

උදය දර්‍ශනයෙන් (හෙවත් "අවිජ්ජාසමුදයා රූපසමුදයො තණ්හා සමුදයා රූප සමුදයො කම්ම සමුදයා රූප සමුදයො ආහාරසමුදයා රූප සමුදයො" යි රූපස්කන්ධයෙහි ද වේදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රයෙහි සතරවන ආහාර ප්‍රත්‍යය හැර "ඵස්ස සමුදයා වෙදනා සමුදයො" යනාදීන් "ඵස්සය" යොදා විඥන ස්කන්ධයෙහි ද, ස්පර්‍ශය හැර "නාමරූප සමුදයා විඤ්ඤාණ සමුදයො" යනාදීන් 'නාමරූප" යොදා දක්වන ලද මේ සූවිසි සංඛ්‍යාවට එහිම දක්වෙන උත්පත්ති ලක්‍ෂණය ද එකතු කොට එකෙකි ස්කන්ධයෙහි ප්‍රත්‍යය වශයෙන් සතරෙක, ලක්‍ෂණ වශ යෙන් එකෙකැ යි පස්විසි අයුරෙකින් උදය සඞ්ඛ්‍යාත උත්පත්ති දන්නා නුවණින්,

"සතො සත්තස්ස විනාසං විභවං පඤ්ඤාපෙති" යි වදාළ පරිදි ආත්ම සත්ත්ව පුද්ගල වශයෙන් විද්‍යමාන වූ සත්ත්වයාගේ මරණින් මතු විනාශය—අනුත්පත්තිය පනවන්නා වූ උච්ඡෙද දෘෂ්ටියගේ ද, ව්‍යය දර්‍ශනයෙන් (හෙවත් "අවිජ්ජා නිරොධා රූප නිරොධො

තණ්හා නිරොධා රූපනිරොධො කම්මනිරොධා රූප නිරොධො ආහාර නිරොධා රූප නිරොධො"යි රූපස්කන්ධයෙහි ද වෙදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රයෙහි සතරවන ආහාර ප්‍රත්‍යය හැර "ඵස්ස නිරොධා වෙදනා නිරොධො" යනාදීන් "ඵස්සය" යොදා විඥාන ස්කන්ධයෙහි දු "ස්පර්ශය" හැර නාමරූප නිරොධා විඤ්ඤාණ නිරොධො" යනාදීන් "නාමරූප" යොදා දක්වන ලද මේ සුවිසි සංඛ්‍යාවට එහිම දක්වෙන අනුත්පත්ති ලක්ෂණය ද, එකතු කොට එකෙකි ස්කන්ධයෙහි ප්‍රත්‍යය වශයෙන් සතරෙක, ලක්ෂණ වශයෙන් එකෙකැයි යටකී ලෙස පස්විසි අයුරෙකින් ව්‍යය සංඛ්‍යාත අනුත්පත්ති දන්නා නුවණින් සත්ත්ව පුද්ගල වශයෙන් සම්මත වූ මේ ධාතු සමූහය සදාකාලික ආත්මයකින් ශූන්‍ය යැ, නොනස්නා ස්වභාව ඇත්තේ යැ. එහෙයින් ම නිත්‍යයැයි! අදහන ශාශ්වත දෘෂ්ටිය ගේද, භඞ්ගානු දර්ශනයෙන් විදසුන් වඩන්නා වූ යොගාවචරයාට දෑඹුදෑඹූ දෑ දවන අඟුරුවලක් සේ තුන් භවයෙහි සංස්කාරයන් භය වශයෙන් දක්නා නුවණින්.භය සහිත සංස්කාර වස්තු විෂයෙහි අභය සංඥාවගේ ද,

භයතු පට්ඨාන ඥානය භාවනා කරන යොගාවචරයාට සැඩ සතුන් ගැවසීගත් වන ලැහැබක් සේ තුන්භවයෙහි සියලු සංස්කාරයෝ දොෂඇත්තා හ යි, ආදීනව වශයෙන් දක්න නුවණින් ආස්වාද සංඥාවගේ ද,

ආදීනවානු දර්ශනඥානය මෙනෙහි කරන්නාහට "සිත් කුළු පවුවෙහි" ගුණ දුටු රන්වන් හංසරාජයා පිළිකුල් බැව් ඇති ගම් දොර ගවර වළෙක්හි සිත් නො අලවන්නා සේ දුටු දොෂ ඇති සංස්කාරයන් කෙරෙහි උකටලී වෙමින් උපදනා නිබ්බිදානු පස්සනා ඥාණයෙන් අභිරති සංඥාවගේ ද,

සංස්කාරයන් කෙරෙහි උකටලී වූ යොගාවචරයාට දැලතුළට වන් මසුන් දැලින් මිදෙනු රිසියන් සේ සංස්කාරයන් කෙරෙහි නො ඇලී ඔවුන් දුරු කරනු අටියෙන් උපදනා මුඤ්චිතු කාම්‍යතා ඥානයෙන් නොමිදනු කැමති බවගේ ද,

සංස්කාරයන් අයත් කෙරෙමින් ම ඔවුන් දොස් දැක ගින්නට ලන්කල කුකුළු පිහාටු මෙන් සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ වෙමින් උපදනා සංස්කාරොපෙක්ෂා ඥානයෙන් උපෙක්ෂා රහිත භාවයාගේ ද,

අනුලොම ඥාණයෙන් (හෙවත් තමන් උපදවාගත් විදර්ශනාවවද මතු ඉපැද විය යුතු ආර්ය මාර්ගයට ද එකඟ වැ පරිකම් උපචාර අනුලොම ගොත්‍රභූ වශයෙන් පවත්නා වූ ආවර්ජනයනට

අනතුරු වැ උපදනා කාමාවචර ජවන සිත් පිළිබඳ ඥානයෙන් ධම්සථිතිය යි කියන ලද ධම් නියාමයෙහි හා නිවනෙහි ප්‍රතිලෝම භාවයාගේ ද එහෙවත් පිළිවෙළ ඉක්මවා පැවැත්මගේ ද,

අනුලෝම ඥානයෙන් මතු තුන්වැනි වැ හෝ සතරවැනි වැ විවසුන් බෙලෙන් නිවන් අරමුණු කොට මාගී සමංගීයොගා-වචරයාගේ පුහුදුන් වහර ඉක්මවා ආය්‍ය ව්‍යවහාරයට ද, පමුණු-වමින් මාගීයට අනන්තරාදී ප්‍රත්‍යයවූ ගොත්‍රභූ නමැති විදර්ශනා චිත්තයෙන් සකර නිමිති ගැන්මගේ ද යන මේ විරුඬ අවයවයන් ඒ ඒ හේතු බලයෙන් ප්‍රහාණය කිරීම තදඞ්ගප්‍රහාණ නම් වේ.

ii උපචාර අපීණා ප්‍රභෙද ඇති සමාධියෙන් (පඤ්ච නීවරණ-යන් ගේ) පැවැත් ම වළක්වන හෙයින් කළගෙඩි පහර ලැබ ජලය මතු පිට පැවතුණු සෙවෙල් පැහී ආදිය පහව යන්නා සේ (සමාධි-යට ප්‍රතිපක්ෂ වූ ඒ ඒ නීවරණාදී ධම්යන්ගේ යම් ප්‍රහාණයෙක් වේද, එහ් විසකම්භන ප්‍රහාණ නම් වේ.

iii. සතර ආය්‍ය මාගීයන් භාවිත කළ බැවින් ශ්‍රොත ආපත්ත්‍යාදී ඒ ඒ මාගී ධම්යන් ගෙන් යුත් සවකීය සනතානයෙහි "දිට්ඨිගතානං පහානාය,, යනාදී ක්‍රමයෙන් වදළ සමුදයට සහ භාගීවූ කෙලෙස් රාශිය අතීශයින් නො පවත්නා සේ මූලොච්ඡින්න වශයෙන් අභාවයට පැමිණ වී මෙන් පහකිරීමෙක් වේ ද, හේ සමුච්ඡෙද ප්‍රහාණය යි දතයුත්තේය,

iv. සෝවාන් ඵලාදියට පැමිණි කෙණෙහි ඒ ඒ මාගීයන ට විපක්ෂ ව පැවතුණු කෙලශධම්යන් ගේ යම් සන් සිඳුණු බවෙක් වේද, හේ ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණය යි දන්නා ලැබේ.

v. කුශලා'කුශලාදී සියලු සංස්කාර ධම්යන් බැහැර කළ බැවින් ප්‍රහීණ කළ සියලු සංස්කාර ධම් ඇති යම් නිවනෙක් වේද, හේ නිශ්ශර ප්‍රහාණ නමැ යි දතයුතු.

යම් හෙයකින් මේ සියලු පඤ්චවිධ ප්‍රහාණය ම බැහැර කිරීම් අර්ථයෙන් ප්‍රහාණ ය යි නම් වීද, හික්මවන අර්ථයෙන් විනය වීද, එහෙයින් ප්‍රහාණ විනයය යි කියනු ලැබේ. මෙසේ ප්‍රහාණ විනයයා-ගේද පඤ්චවිධ භාවය දත යුත්තේය.

සංවර විනයය ප්‍රහාණ විනය යි යට කී පරිදි සැකෙවින් දෙ වැදෑරුම් වූ ද, ප්‍රභෙද විසින් දස වැදෑරුම් වූ ද විනය භික්ෂු භික්ෂුණී

උපාසක උපාසිකාදී සිවු පිරිස ද, අෂ්ටවිධ ආර්‍ය පුද්ගලයන් ද සම්බන්ධ කොට පවත්නා පූර්වභාගවූ ද, ලෝකෝත්තර වූ ද, බුද්ධාදී උත්තමයන් විසින් ප්‍රශස්තා ලද ශ්‍රේෂ්ඨතර ශීලය වේ! එහෙයින් මේ හැම සංවර සීල නමැයි දත යුතු.

සූත්‍ර විනය, අභිධර්ම යන පිටකත්‍රය ම අළලා විභාග කටයුතු වූ "සංවර සීල" මාතෘකාව යටතේ ඉතා සැකෙවින් දක්වුණු මේ ධර්ම විස්තරය සැදැහැ උපදවා සිහි නුවණින් පරිශීලනය කොට අමාමහ නිවන් සැප ලැබීමෙහි උත්සාහ කටයුතුයි!!

**මෙතෙකින් "සංවරසීල දීපනිය" සමාප්ත යි.**

සාධු! සාධු!! සාධු!!!

# සංවර සීල දීපනී

## පරිශිෂ්ට සඞ්ග්‍රහය.

### "නමො බුඩාය!"

### කර්‍මස්ථාන භාවනා සංග්‍රහය.

කර්‍මස්ථාන භාවනාව වනාහි සමථය විදර්‍ශනාය යි දෙවැදෑරුම් වේ. එහි නීවරණයන්ගේ සංසිඳවීම් අර්‍ථයෙන් ධ්‍යානප්‍රතිලාභයට හේතු වූ භාවනාව සමථය යි ද, අනිත්‍යාදී නොයෙක් ආකාරයෙන් දැකීම් අර්‍ථයෙන් මාර්‍ගඵලප්‍රතිලාභයට හේතු වූ භාවනාව විදර්‍ශනාය යි ද, දතයුතු. නොයෙක් ආකාර භාවනාකර්‍මයාගේ පැවැත්මට ස්ථාන බැවින් කසිණාදි අරමුණු කර්‍මස්ථාන නම් වේ. සමථ—සංග්‍රහයෙහි:—

i දසකසිණයෝ ද, ii දසඅසුභයෝ ද, iii දසඅනුස්මෘතී හු ද, iv සතරඅප්‍රමාණ්‍යයෝ ද, v එක් සංඥවක් ද, vi එක් ව්වස්ථාන—යක් ද, vii සතරඅරූපාවචර භාවනාවෝ දැ යි කර්‍මස්ථාන සංග්‍රහය සත් වැදෑරුම් වේ.

i රාග චරිතය, ii ද්‍වේෂ චරිතය, iii මොහ චරිතය, iv ශ්‍රද්ධා චරිතය, v බුද්ධි චරිතය, vi විතර්‍කක චරිතය, යි චරිතසංග්‍රහය සය වැදෑරුම් වේ.

i පරිකර්‍ම භාවනාය, ii උපචාර භාවනාය, iii අර්‍පණ භාවනාය යි භාවනා සඞ්ග්‍රහය තෙ වැදෑරුම් වේ. එහි,

i දසකසිණයෝ නම්:—

පඨවි කසිණය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය, ලොහිත කසිණය, ඕදාත කසිණය, ආකාස කසිණය, ආලොක කසිණය යන මොවුහු වෙත්.

ii දස අසුභයෝ නම්:—

ඉදිමීගිය මළසිරුර වූ උද්ධුමාතකය, නිල්වගිය මළසිරුර වූ විනීලකය, නවදොරින් සැරව වැගිරෙන මළසිරුර වූ විපුබ්බකය, මැදින් දෙකඩව සිඳීගිය මළසිරුර වූ විච්ඡිද්දකය, සොණ සිගාලාදීන් විසින් කනුලබන මළසිරුර වූ වික්ඛායිතකය, සොණ

සිගාලාදීන් විසින් විවිධාකාරයෙන් කඩා ඒ ඒ තැන දමනලද මළසිරුර වූ වික්ඛිත්තකය, ආයුධයෙන් පැහැර අනෙකප්‍රකාර-යෙන් දමනලද මළසිරුර වූ හතවික්ඛිත්තකය, ලේ වෑහිරෙන මළසිරුර වූ ලොහිතකය, පණුවන් වහනය වන මළසිරුර වූ පුළුවකය, ඇටසැකිලි වූ අඪිකය යන මොවුහු දසදෙන යැ.

iii දස අනුස්සෘතීහු නම්:—

බුදුගුණ සිහිකිරීම වූ බුඩානුසමෘතිය, දහම්ගුණ සිහිකිරීම වූ ධර්‍මානුසමෘතිය, සඟුන් ගුණ සිහිකිරීම වූ සංඝානුසමෘතිය, තමන්ගේ සුපිරිසුදු සිල්ගුණ සිහිකිරීම වූ ශීලානුසමෘතිය, තමන්ගේ ත්‍යාග ගුණය සිහිකිරීම වූ ත්‍යාගානුසමෘතිය, දෙවතාවන් ශාක්ෂි ස්ථානයෙහි තබා තමන්ගේ ශ්‍රඩාදී ගුණ සිහිකිරීම වූ දෙවානුසමෘ-තිය, සියළු දුක් සංසිඳීම් සංඛ්‍යාත නිවන් ගුණ සිහිකිරීම වූ උපසමානුසමෘතිය, ජීවිතෙන්ද්‍රිය සිඳීමය යි කියනලද මරණය සිහිකිරීම වූ මරණානුසමෘතිය, කෙසාදී කොඨාසයන්හි පැවැති සිහිය වූ කායගතා සතිය, ආශ්වාස ප්‍රාශ්වාස අරමුණු කිරීම් වශයෙන් පැවති සිහිය වූ ආණාපාණසතිය, යන මොහු වෙත්.

iv සතර අප්‍රමාණයෝ නම්:—

සියළු සත්ත්වයන් කෙරෙහි හිත පැතිරවීම් වශයෙන් පැවති මෛත්‍රිය, දුකට පැමිණි සත්ත්වයන්ගේ දුක පහ කිරීමට කැමති කරුණාය, සැපයට පැමිණි සත්ත්වයන්ගේ සැපයෙහි සතුටුව පවත්නා මුදිතාය, සියළු සත්ත්වයන් කෙරෙහි මැදහත් ආකාර-යෙන් පැවති උපෙක්‍ෂාය, යන මොවුහු අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොට ඇති බැවින් අප්‍රමාණ්‍යයහ යයි ද, උත්තම විහරණ බැවින් බ්‍රහ්මවිහාරයෝ යයි ද කියත්.

v එක් සංඥාව නම්:—

පිඬු කොට අනුභව කටයුතු ආහාරයෙහි පිළිකුල් වශයෙන් පැවති සංඥාවයි.

vi එක් වවස්ථානය නම්:—

පඨවි ආදී සතර ධාතූන්ගේ ලක්‍ෂණාදී වශයෙන් නිශ්චය කිරීමයි.

vii සතර අරූපාවචරයෝ නම්:—

ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන මොහු ය.

මෙසේ සමථ නිර්දේශයෙහි අර්ථකථා නයින් කර්මස්ථාන සතළිසක් (40) හා පෙළේ ආ නයින් ආකාශ ආලෝක කසිණ දෙක හැර අටතිස් (38) අරමුණක් ද දක්වන ලදහ යි දතයුතු.

**සමථ සංග්‍රහය යි.**

—//—

චරිත සංග්‍රහයෙහි:— i **රාග චරිතයා** ට දස අසුභය හා කායගතාසතිය නම් වූ කොට්ඨාස භාවනාව ද සප්පාය වේ.

ii **ද්වේෂ චරිතයාට** සතර අප්‍රමාණ්‍යයෝ ද නීලාදී වර්ණ කසිණයෝ සතර දෙන ද සප්පාය වෙත්.

iii **මෝහ චරිතයාට** සහ iv **විතක්කචරිතයාහට** ආනාපාන ස්මෘතිය සප්පාය වේ.

v **ශ්‍රද්ධා චරිතයාහට**-බුද්ධානුස්මෘති ආදී සතරදෙන සප්පාය වේ.

vi බුද්ධි **චරිතයාහට**= මරණානුස්මෘතිය, උපශමානුස්මෘතිය, ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව, චතුධාතුවවස්ථානය, යන මොවුහු ගැඹුරු බැවින් ඥානයට ම ගොචරවන හෙයින් බුද්ධිචරිතයා හට සප්පා වේ.

සෙසු සියලු කර්මස්ථානයෝ සියල්ලන්ට ම සප්පාය වෙති. එහිදු කසිණයන් හි මහත් බැව් මෝහ චරිතයාහට ද, කුඩාබැව් විතක්ක චරිතයා හට ද සප්පාය වේ.

**සප්පාය භේදය යි.**

—//—

i **පරිකර්ම භාවනා නම්**:- භාවනාවට ආදි කර්මික වූ පූර්වභාග භාවනාවයි.

ii **උපචාර** භාවනා නම්:- කාමච්ඡන්දාදී නීවරණයන්ගේ විෂ්කම්භනයෙහි පටන් ගොත්‍රභූ චිත්තය අවසන් කොට ඇති පූර්ව භාගයෙහි පැවති කාමාවචර භාවනා ව යි. හේ අර්පණා සංඛ්‍යාත ධ්‍යානයට සමීපචාරී හෙයින් ගම සමීපය ග්‍රාමොපචාරය යි කරන ව්‍යවහාරය මෙන් උපචාර භාවනාය යි දතයුතු.

iii **අර්පණා** භාවනා නම්:- ධ්‍යානයට පැමිණි භාවනාව යි. එක්ව යෙදුනු චෛතසික ධර්මයන් අරමුණෙහි ඇතුළත් කරන්නාක් මෙන් පවත්නා හෙයින් විතර්කය අර්පණා නම්. එය ප්‍රධාන බැවින් සියලු ධ්‍යානයෝ අර්පණාය යි කියනු ලැබෙත්. සියලු කර්ම

ස්ථානයන් හි පරිකර්මභාවනාව ලැබෙ යි. සමහර කර්මස්ථානයෙක් හි අර්පණා භාවනාව නොලැබෙයි. බුද්ධානුස්මෘති ආදී අට අනුස්මෘතීන්හිද ආහාරයෙහි පටිකකූලසංඥා චතුධාතුවවස්ථානයන්හි ද යන දස වැදෑරුම් කර්මස්ථානයන්හි උපචාර භාවනාව ම ලැබෙයි. අර්පණාභාවනාව නොලැබෙයි. සෙසු සමතිස් (30) කර්මස්ථානයන්හි අර්පණා භාවනාව ද සම්පාදනය වේය යි දතයුතු.

ඒ කර්මස්ථානයන් අතුරෙහි දසකසිණයෙන් ද, ආණාපාණසතියෙන් ද, ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන පසක් ලැබිය හැකිවෙයි. දස අසුභයෙන් ද, කායගතා සතියෙන් ද, ප්‍රථම ධ්‍යානය පමණක් ලැබිය හැකිවෙයි. අසුභ භාවනාව පිළිකුල අරමුණු කොට ඇති බැවින් සැඩ පහර ඇති ගඟෙහි රිටි බලයෙන් ඔරුව නවත්වන්නාක් මෙන් විතර්ක බලයෙන් ම අසුභයෙහි සිත පවත්නා හෙයින් අශුභ කර්මස්ථානයෙහි විතර්කරහිත ධ්‍යානයෝ නොලැබෙත්.

මෛත්‍රී, කරුණා, මුදිතා, යන තුන් දෙන සොම්නස් සහ සහගත සිතෙහි ම ලැබිය යුතු හෙයින් පඤ්චමධ්‍යානය හැර ප්‍රථම ධ්‍යානාදි සතරෙහි ලැබෙත්. උපෙක්ෂා බ්‍රහ්මවිහාරය සොම්නස් සහගත සිතක නොලැබෙන හෙයින් පඤ්චමධ්‍යානයෙහි ලැබෙයි.

මෙසේ රූපාවචර ධ්‍යානය ලැබිය හැකි කර්මස්ථානයෝ සවිස්සක්(26)වෙත්. පිළිවෙළින් රූපාවචර පඤ්චම ධ්‍යානයට සම වැදී ආකාශ කසිණය හැර සෙසු කසිණයකින් ලබනලද කසිණාලොකය අහසෙහි පතුරුවා; එය මෙනෙහි නොකොට අතුරුදන් වූ කිසුණු ඉගුළු අහස ද එහි පැවැති විඥානය ද ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාවය ද අරූපාවචර ධ්‍යානය ලැබිය හැකි අරමුණු සතරෙක් වෙත්.

භාවනා භෙදයයි.

——||——

සම සතළිස්(40)කර්මස්ථානයන් අතුරෙහි වායොකසිණය හැර සෙසු නව කසිණයෝ ද දසඅසුභයෝ ද යන මෙ එකුන් වීස්ස(19) පලඹු කොට ඇසින් බලා දැකීමෙන් ගතයුතු වෙත්. කාය ගතා සතියෙහි තචපඤ්චකය දැකීමෙන් හා සෙසු කොටස් ඇසීමෙන් ද ගතයුතු වෙත්. අණාපාණසතිය ස්පර්ශ කිරීමෙන් ගතයුතු වෙයි. වායො කසිණය දැකීමෙන් හා ස්පර්ශ කිරීමෙන් ද ගතයුතු වෙයි. සෙසු අටළොස්(18)කර්මස්ථානයෝ ඇසීමෙන් ගතයුතු වෙත්.

මෙකී කර්මස්ථානයන් සුදුසු පරිදි දැක හෝ අසා හෝ ස්පර්ශ කොට හෝ භාවනා කරන්නාහට පරිකර්ම උද්ග්‍රහ ප්‍රතිභාග නිමිති උපදිත්. එහි පරිකර්මය යි කියන ලද පළමු භාවනාකර්මයට අරමුණු වේනුයි, පරිකර්ම නිමිත්ත නම්. එයම ඇසින් දුටු වාක් මෙන් සිතින් ගතයුතු අරමුණ උද්ග්‍රහ නිමිත්ත නම්. කසිණ දෝෂ රහිතවූ උද්ග්‍රහ නිමිත්ත වැනි වූ භාවනාමය නිමිත්ත උපචාර අර්පණාවන්ට අරමුණු බැවින් ප්‍රතිභාග නිමිත්ත නම් වේ.

ඒ නිමිතීන් අතුරෙහි පරිකර්ම නිමිත්ත ද උද්ග්‍රහ නිමිත්ත ද සියලු කර්මස්ථානයන් භාවනාවන්හි සුදුසු පරිදි ප්‍රකටව ද අප්‍රකටව ද ලැබේ. ප්‍රතිභාග නිමිත්ත වනාහි දස කසිණ දස අසුභ කොට්ඨාස ආණාපාණ සතීන්හි ම ලැබෙයි. මෙහි දු ප්‍රතිභාග නිමිත්ත අරභයා උපචාර සමාධිය ද අර්පණා සමාධිය ද පවතිත්ය යි දතයුතු.

විදර්ශනා කර්මස්ථාන සංග්‍රහයෙහි ඉපිද නැසීමය යි කියන ලද අනිස බව ලකුණු කොට ඇති අනිත්‍ය ලක්ෂණය ද, ඉපදීම් නැසීම් දෙකින් පෙළීම ය යි කියන ලද දුක් බව ලකුණු කොට ඇති දුඃඛ ලක්ෂණය ද, පරසමය වාදීන් විසින් කල්පනා කරණල ද ආත්මයක් හුගේ නැතිබවය යි කියනල ද අනත් බව ලකුණු කොට ඇති අනාත්ම ලක්ෂණය ද, යන මේ තිලකුණු දත යුත්තා හ.

කර්මස්ථාන භාවනා සංග්‍රහයයි.

—||—

## කායගතා සති භාවනාව*

අෂ්ට දුෂ්ටක්ෂණ විනිර්මුක්තවූ බුද්ධොත්පාදක්ෂණය සම්මුඛ කරගැනී මෙන් සසර දුකින් මිදී නිවන් සුව අත්පත් කරගනු කැමති සැදැහැවත් බෞද්ධයන් විසින් ප්‍රතිපත්තිය ගරුකරමින් කෙලශ රොගයට බෙහෙදක් වැනිවූ කර්මස්ථාන භාවනාව ද පුරුදු කරගත යුතුවෙයි! එබැවින් ඔවුන්ගේ ප්‍රයෝජනය පිණිස බුද්ධොත්පාද කාලය හැර අන්‍ය කාලයෙක් හි නොලැබෙන්නාවූ ද ඒ ඒ සූත්‍රප්‍රදෙශයන් හි "එක ධම්මො භික්ඛවෙ, භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති —පෙ—

* පිළිකුල් භාවනාව.

අමතං තෙසං භික්ඛවෙ, ආරද්ධං, යෙසං කායගතාසති ආරද්ධා!,, යනාදීන් (=මහණෙනි, එක් ධර්මයක් භාවිතකරන ලද්දේ ම මහත් සංවෙගය පිණිස පවතී ද යමකු විසින් කායගතා සති භාවනා නොමෝ පටන්ගන්නා ලද්දී ද, ඔහු විසින් නිර්වාණය පටන් ගන්නා ලද්දේ වේය යි) මේ ආදී නොයෙක් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රශංසා කොට වදාරන ලද්දා වූ කායගතාසතිභාවනාව ද මෙහි සංක්‍ෂෙපවශයෙන් දක්වනු ලැබේ,

## පාළිය.

---

"අත්ථි ඉමස්මිං කායෙ 1 කෙසා 2 ලොමා 3 නඛා 4 දන්තා 5 තචො 6 මංසං 7 නහාරු 8 අට්ඨි 9 අට්ඨිමිඤ්ජා 10 වක්කං 11 හදයං 12 යකනං 13 කිලොමකං 14 පිහකං 15 පප්ඵාසං 16 අන්තං 17 අන්තගුණං 18 උදරියං 19 කරීසං 20 පිත්තං 21 සෙම්හං 22 පුබ්බො 23 ලොහිතං 24 සෙදො 25 මෙදො 26 අස්සු 27 වසා 28 ඛෙළො 29 සිඞ්ඝාණිකා 30 ලසිකා 31 මුත්තන්ති,,

මෙසේ හිස් මොල ඇට මිදුලු වලට සංග්‍රහ කිරීමෙන් පටික්කූල මනසිකාර වශයෙන් දෙශනා කරනලද වත්තිංසාකාර කර්මස්ථානය මෙහි කායගතා සතිය යි අදහස් කරන ලදී.

## පදාර්ථ විවරණය.

---

ඉමස්මිං කායෙ= මේ ශරීරයෙහි. (1) කෙසා= (හිසවසාසිටි සමෙහි වී අගක් පමණ වැදසිටි) කෙශයෝය. (2)ලොමා=(අතුල් පතුල් හැර බොහෝ සෙයින් සෙසු ශරීර චර්මයෙහි ලෙහෙඩි පමණ වැදසිටියාවූ) ලෝමයෝය, (3) නඛා=(මස් සම්බන්ධ වූ තන්හි තඹ වන්වූ සෙසු තන්හි සුදුවූ පිලපොතුවැනි සටහන් ඇති ඇඟිලි අග පිහිටි) නියපොතුය. (4)දන්තා,=(ශුභ්‍ර වර්ණවූ නොයෙක් සටහන් ඇති එක් මුල්, දෙමුල්, තුන්මුල්, සිවුමුල්, එක්කොන්, දෙකොන්, තුන්කොන්, සිවුකොන්, ඇති සම්පූර්ණ දත් ඇත්තහුගේ වශයෙන් දෙතිස්) දන්තයෝය. (5) තචො= (කලුරන්වන් ආදී නොයෙක් වර්ණවූ යම් සිවියක් සියලු ශරීරයෙන් පිඩු කරන ලද්දී ඩෙබර ඇටක් පමණ වේ ද, ඒයට සිටියාවූ සියලු ශරීරය වසාසිටි ශුභ්‍රවර්ණවූ) සමය. (6) මංසං=(අතිරෙක සහීතවූ තුන්සියයක් ඇට වසා සිටි කැලමල් වැනි නවසියයක්) මස්පිඩු ය. (7) නහාරු= (උගුරෙහි මතුභාගයෙහි පටන් පෙරටුවෙන් ගියාවූ මහනහර පසක්ද, එසේම දකුණැලයෙන් ගියාවූ පසක්ද; වම්

ඇලයෙන් ගියාවූ පසක්ද, පිටිපසින් ගියාවූ පසක්ද, දකුණත වැලමිදෙමින් පෙරටුවෙන් හා පිටිපසින් ගියා වූ මහනහර දසයක්ද, එසේම වමත වැලමිදෙමින් ගියාවූ මහනහර දසයක්ද, දෙපය වැලමිදගෙන පෙරටුවෙන් ද පිටිපසින් ද ගියාවූ මහනහර විස්සෙක්දැයි, මෙසේ කැනහිල් මල් කැකුළු බඳු සටහන් ඇති ශරීර දරන්නාවූ මහනහර සැටක්ද, ඊට වඩා සියුම් වූ වරදූල් රැහැණට බඳුවූද කිඳිවැල් බඳු වූ ද විණා තත් බඳු වූ ද දළ නූල් බඳු වූ ද ඒ ඒ ප්‍රදෙශයෙහි පැතිර සිටි නහර ද, අතුල් පතුල් පිට පසම්පාද බඳු නහර ද, හිසෙහි ළදරුවන් හිස පළඳනා දූල් හු වැනි නහර ද, අව්වෙහි වනන ලද මසුන් බඳනා දූලකට බඳු පිටෙහි නහර ද, ශරීරයෙහි බහාලූ දූල් සැට්ටයක් බඳු ඒ ඒ අඞ්ගප්‍රත්‍යඞ්ග ගත නහරදැයි මෙසේ ගෙයක බැඳ සිටි වැල් මෙන් සියලු ශරීරයෙහි ඇට සැකිලි බැඳී සිටි ශුභ්‍රවර්ණවූ නවසියයක්) නහරය. (8) අට්ඨි = ( ශරීරයෙහි දෙතිස් දත් ඇට වෙන්කොට ගත්හෙයින් සෙසු සිවුසැටක් අත් ඇටද, සිවුසැටක් පා ඇටද, මාංශ නිශ්‍රිතවූ සිවුසැටක් මෘදු ඇටද, විළුම් ඇට දෙක ද, එකී එකීපාදයෙහි ගොප් ඇටදෙක ද, සීත් කකුලෙහි හෙවත් කෙණ්ඩෙහි ඇට දෙක ද, දන ඇටය ද, කලවෙහි ඇටය ද, කටියෙහි ඇට දෙක ද, පිට කටුවෙහි ඇට අටළොස ද, පරාල ඇට සූවිස්ස ද, ළෙහි ඇට තුදුස ද, හෘදය ඇටය ද, අකු ඇට දෙක ද, පතු ඇට දෙක ද, බාහු ඇට දෙක ද, අත අග ඇට දෙක ද උගුරෙහි ඇට සත ද, හනු ඇට දෙක ද, නැහයෙහි ඇටයද, හිස් කබල් නවය දැයි මෙසේ තුන්සියයක් ඇටය. (9) අට්ඨිමිඤ්ජා= (හුන නලයක බහාලූ ඉදී ගිය වෙයග බඩක් වැනි සටහන් ඇති ඒ ඒ ඇට ඇතුළෙහි පුරා සිටි සුදු වර්ණ ඇති) ඇට මිදුලුය. (10) වක්කං=(ගලවලුයෙන් නික්මුණු එක් මුලක් ඇති මදක් තැන් ගොස් දෙකක් ව බෙදුනාවූ මහනහරින් බැඳි හෘදය මාංශය වට කොට සිටියා වූ එරබදු ඇටකවර්ණ ඇති එක නටුවෙහි හටගත් අඹ දෙකකට බඳු වූ ආකාර ඇති වකුගඩු නම් වූ එක්ව බැඳී සිටි) මස් පිඬු දෙකය.

(11) හදයං=( රත් පියුම් පෙත්තක පිට බඳු පැහ ඇති යට බලා තුබූ නෙළුම් කැකුළකට බඳු ආකාර ඇති, පිටතින් සිලුටු වූ ඇතුළත වැටකොළු ඵලයක ඇතුළත වැනි වූ, නුවණැත්තන්ට මඳක් පිපුණා වූ, නුවණ මඳ වූ වන්ට හැකුළුනා වූ, ඇතුළෙහි දෙඹ ඇටයක් පිහිටන පමණ වළක් ඇති, යම් වළෙක අඩපතක් පමණ ලෙහෙසිටී ද, යම් ලෙයක් ආශ්‍රය කොට මනොධාතු මනොවිඤ්ඤාණධාතු දෙදෙනා පවතිත් ද, රාග චරිතයා හට රත්වත් වූ ද්වෙෂ චරිතයා හට කළු වූ, මොහ චරිතයාහට මස් දෙ වූ දියත්තක්

බඳුවූ, විතර්ක චරිතයාහට කොල්ලූ යුෂ බඳු වූ පැහැ ඇති, ශ්‍රද්ධා චරිතයාහට කිණිහිරිමලකට බඳු පැහැ ඇති, ප්‍රඥාචරිතයාහට පිරිසුදු කරන ලද ජාතිරංගමාණික්‍යයක් මෙන් පැහැදුණු ශුභ්‍රවර්ණවූ, ඒ ලෙස දරා සිටින්නා වූ, දෙතන මැද පිහිටි) හෘදය-මාංශය ද, (12) **යකනං**= (මුලදී එකක් ව අගදී දෙකක් ව කොබෝලීල පතකට බදු සටහන් ඇති නුවණ මදවූවන්ට එකක්වූ නුවණැත්තන්හට කුඩාව දෙකක් හෝ තුනක්හෝ වූ ඉතාරත්නොවූ මහතෙල් මලක පෙතිපිට බඳු වූ වර්ණ ඇති දෙතන මැද දකුණු පාර්ශ්වයෙහි පිහිටි අක්මා නම් වූ එක් ව බැඳී සිටි) මස්පටල දෙකය. (13 **කිලෝමකං**= (සුදු දුහුල් කඩකට බඳු වර්ණ ඇති හෘදය ද, වකුගඩුව ද, වසා සිටි පටිච්ඡන්න දළබුව ද, සියලු ශරීරයෙහි සම්න්යට මාංශ වැළඳ ගෙන සිටි අපටිච්ඡන්න දළබුවද යි යන පටිච්ඡන්න අපටිච්ඡන්න වශයෙන් ද්විප්‍රකාරවූ) දළබුවය. (14) **පිහකං**= (නීකමල් බඳු වර්ණ ඇති බොහෝ සෙයින් සතහල් පමණවූ කළු වස්සෙකුගේ දිවකට බඳු සටහන් ඇති ආයුධ පහරින් පිටත නික්මුණු කල්හි ජීවිතක්ෂය වන්නා වූ හදවතට වම් පාර්ශ්වයෙහි උදර පටලයා ගේ මතු භාගයෙහි පිහිටියාවු) බඩදිවය. (**15**) **පප්ඵාසං**= (නොසම කොට කැඩූ මහත් පූ කැබෙල්ලකට බඳු සටහන් ඇති ඇතුලෙහි කෑබී දෙයක් නැති කල්හි නැඟාවූ කර්මජ තේජස්හුගේ උණුසුමෙන් පහරණලද හෙයින් සපා හෙළූ පිදුරු කඩක් මෙන් නීසරුවූ ඕජස් නැත්තාවූ ඉතා නොපැසුන දිඹුල් ඵලයකට බඳු වර්ණ ඇති දෙතන අතුරෙහි හදවත ද අක්මාව ද මත්තෙන් වසා ගෙන එල්බෙමින් දෙතුන් කඩක්ව බෙදීගියාවූ) පපු මසය. (16) **අන්තං** = [හිස් වල්පත් නැති ඇලි ගැරඬියෙකුට බඳු සටහන් ඇති මත්තෙන් ගලවළුයෙහි ද පාත ගුදප්‍රදෙශයෙහි ද, බැඳී සිටි හෙයින් ගලවළු හා ගුදප්‍රදෙශය ද කෙළවර කොට ඇති පුරුෂයන්ට දෙතිස් (32) රියනක් පමණ වූ ස්ත්‍රීන්ට අටවිසි (28) රියනක් පමණ වූ එක්විසි (21) තැනෙකින් නැමුනා වූ ශරීරය ඇතුළෙහි පිහිටි) අතුනු වැටිය හෙවත් බඩ වැලය. (17) **අන්තගුණං**)= හෙල් මැලි මූලකට බඳු වර්ණ ඇති පා පිස්නා බිස්සෙහි දරණ මඬුල්ල එපිට මෙපිට නොයන ලෙස වෙලූ රොදක් මෙන් උදලු පොරෝ ආදියෙන් කර්මාන්ත කරන්නවුන්ගේ අතුනු වෑටිය ගිලිහිය නොදී එක් කොට බැඳී එක්විසි (21) අතුනුවැටි අතුරෙහි සිටි) අන්තගුණ නම් වූ අතුනු බහනය.

(18) **උදරියං**= (පෙරහනෙහි සිපිල කොට බඳනා ලද සහලට බඳු සටහන් ඇති උදරයෙහි වූ) වැළඳු ආහාරය. (උදරය නම්;—

දෙ අතින් පෙළනු ලද තෙත් සළුවෙහි මැද නැගී ඇති
වන අවකාශ ස්ථානය බඳු වූ අන්ත පටලය යි. එය පිටපතින්
සිලුටුය. ඇතුළත කුණුව ගිය කොස් කටුවෙක ඇතුළත බඳුය.
යම් උදර යෙක තකෙකාටක නම් පණුවෝ ය. ගණ්ඩුප්පාදනම්
පණුවෝය. පටහු වැනි පණුවෝය, හු වැනි පණුවෝය යි.
මේ ආදී දෙතිස්කුලප්‍රභෙද ඇති පණුවෝ ආකුල ව්‍යාකුල ව
සමූහ සමූහ ව හැසිරෙන්නාහු වෙසෙත් ද; යම් පණුවෝ වනාගී
පාන භෝජනාදිය නැති කල්හි පැන නැගී හෘදය මාංශය පහ
රිද් ද පාන භොජනාදිය වළඳන කල ඌර්ධ මුඛ ව පළමු කොට
වැළඳූ දෙ තුන් ආලොපයක් යුහුයුහු ව පැහැර ගෙන කත් ද,
යමක් ඒ පණුවන්ට වදන ගෙය වේද, වැසිකිළිය වේද, ගිලන්
හල වේ ද, අමු සොහොන වේ ද, යම් උදර පටලයෙක්හි පාන
භෝජනාදිය වැටී තිබේද, යම් සේ සැඩොල් ගම්දොර වූ ගවර
වළට ග්‍රීෂ්මකාලයෙහි දළපොද ඇති ව, වැසි වස්නා කල්හි දියෙන්
ගෙනයන මළමූත්‍ර, සම්, ඇට, නහරකඩ, කෙල, මූකුණු, ලෙහෙ
ආදීවූ නොයෙක් කුණු වැටී මඩදියෙන් ඇලලී දෙතුන් දවසක්
ඇවෑමෙන් හටගන්නාවූ පණු කුලයන් ඇතිවූයේ සූර්‍යරශ්මියෙන්
කකියනලද්දේ මතු මතුයෙහි පෙණ බුබුළු නැගෙමින් ඉතා නිල්
පැහැ ඇතිව අතිශයින් දුගඳ පිළිකුල් ව එළඹෙන්ට ද දකින්ටද
නුසුදුසු බවට පැමිණ සිටින්නේ ද, සිඹීම ද ආශවා ද කිරීමද කියනු
කිම? එපරිද්දෙන් ම නොයෙක් ප්‍රකාර ඇති පාන භොජනාදිය
දත් නමැති මොහොලින් සුනුකරනලද්දේ දිව් නමැති අතින්
පෙරළනු ලද්දේ දිවඅග කෙළ හා දිවමුල බොල්කෙළින් ද මිශ්‍ර
වන ලද්දේ එකෙනෙහි ම වර්ණ ගන්ධ රස යනාදී සම්පත් පහවූයේ
පෙසකාරයන්ගේ බලි හා බල්ලන්ගේ වමනය ද වැනි ව යම්
උදරපටලයෙක් හි වැටී පිත් සෙම් වාතයෙන් වැළඳෙන ලදුව
ජඨරාග්නි සන්තාප වෙගයෙන් කකාරනලද්දේ පණුවන් විසින්
ආකුලව මතුමත්තෙහි පෙණබුබුළු නැගෙමින් ඉතා කුණුගඳ
පිළිකුල්බවට පැමිණ සිටී ද, යම් උදරයක වැටුණාවූ පාන
භොජනෘදිය පස් පරිද්දෙකින් බෙදීමට පැමිණේ ද, එක් භාග-
යක් පණුවෝ කත් ද, එක් භාගයක් ජඨරාග්නිය දවා ද, එක්
භාගයක් මූත්‍ර බවට ද, එක්භාගයක් වර්චස් බවට ද, එක් භාග-
යක් රස බවට ද, පැමිණ ලේ මස් ආදීන් වඩා ද හේ උදර නමැයි
දතයුතු යි.)(19) **කරීසං**=නාභියෙන් යටය,පිට කටුවෙහි මූලය, යන
මොවුන්ගේ අතරෙහි අතුනු කෙළවර උසින් අටඟුල් පමණ වූ
හුණ නලයක් වැනි යම් තැනෙක්හි යම්සේ උස්වූ භූමි ප්‍රදෙශයෙහි
වැසිදිය ගිලිහී පාතභූමිප්‍රදෙශය පුරා සිටී ද, එපරිද්දෙන් ම

ආමාශයෙහි හුණුවාවූ යම් කිසි බත් පැන් ආදියක් ඇද්ද හේ උදර ගින්නෙන් පෙන නැගි නැගී පැසුණේ ගලෙහි ලා අඹරන ලද්දක් මෙන් සිලුටු බවට පැමිණ අතුණු සිදුරෙන් ගිලිගී බැස මැඩ හුණ නලෙන බහාලන ලද පඬුවන් මැටියක් මෙන් රැස්වී සිටී ද එබඳු වූ පක්වාශයෙහි පිහිටියාවූ) වර්චසය.

(20) **පිත්තං**= (යම් පිතක් කිපුනු කල්හි සත්ත්වයෝ උමතු වෙත් ද, පෙරළුනු සිත් ඇතිව විළිබිය හැර නොකටයුතු දෑ කෙරෙත් ද, නොකියයුතු දෑ කියත් ද, නොසිතිය යුතු දෑ සිතත් ද, මිදුණු මීතෙල් වැනි වර්ණ ඇති හෘදයවස්තුව හා පපු අතරෙහි අක්මාව ආශ්‍රය කොට පිහිටියාවූ වැටකොළු වගල්ලක් බඳුවූ පිත් කොෂයෙහි පිහිටි බඩපිත්තය ද, යම් ඒ පිතක් කිපුනු කල්හි ඇස් කසාවන් වෙද් ද, භ්‍රමණය වෙද් ද, ශරීරය සැලේ ද, ඇඟ කසත් ද, ඒ මලානික වූ රණවරාමල් වැනි වර්ණ ඇති කෙශ, ලොම, නඛ, දන්ත යන මොවුන්ගේ මසින් වෙන් වූ තැන් ද දැඩිවූ වියළිනාවූ සමද හැර අවශෙෂ ශරීරයෙහි දියෙහි පැතිරෙන තෙල්බිඳක් මෙන් පැහැර සිටිනා වූ අබද්ධ පිත්තය ද, යන මේ විප්‍රකාර වූ) පිතය;

(21) **සෙම්හං**=(යම්සේ දියෙහිවූ සෙවෙලෙහි කැට කැබිලිති ආදියක් හෙළූකල්හි දෙකට බෙදී නැවත පැතිර ගෙන එකක් ව සිටී ද එසේම බත් පැන් ආදියක් වැටුණු කල්හි දෙකට බෙදී නැවත පැතිර ගෙන යමක් සිටී ද, යම් සෙමක් අඩුවූ කල්හි පැසුනු ගඩක් මෙන් ද, කුනුවූ කිකිළිබිජුවටක් මෙන් ද; උදරය ඉතා පිළිකුල්ව කුණුගඳ වේ ද, එයින් නැංගාවූ ගඳින් නැලිනැගීම් ඇති මුඛය ද දුගඳවූයේ කුණපයක් බඳු වේ ද, එ පුරුෂයා ද "පහවෙ ව! දුගඳ වහනය වන්නේය"යි කියයුතු බවට පැමිණේ ද, යම් සෙමක් වැඩී බොල්බවට හෙවත් ඝනබවට පැමිණියේ වෑසි-කිළියෙහි පියන් පෝරුවක් මෙන් ඇතුළෙහි ම කුණුගඳ වසා ගෙ-න සිටී ද එබඳුවූ කැලියබෙල සුළකට බඳුවූ වර්ණ ඇති)සෙමය; (22)**පුබ්බෝ**=(කණු කටු ආයුධ ගිනි ආදියෙන් පහරණලද යම් යම් ශරීරප්‍රදේශයෙක්හි ලේ රැස්ව පැසේ ද, ගඩ පොල ආදීහු උපදිද්ද, එ එ තන්හි සිටින්නාවූ නිබඳ අවකාශයක් නැති පඬුවන් පතකට ඕදුපැහැ ඇති සැරවය. (23) **ලෝහිතං**=(කෙස, ලොම, නඛ, දන්ත යන මොවුන්ගේ මසින් වෙන් වූ තැන් ද, දැඩි වූ වියලුනා වූ සමද හැර අවිශෙෂ සියලු ශරීරයෙහි නහර අනුසාරයෙන් පැතිර සිටින්නාවූ ප්‍රසන්න ලාක්ෂාරසයකට බඳු වර්ණ ඇති විසිර පවත් නාවූ ලෙයද, යම් ලෙයක් වකු ගඩු හදවත් ආදිය තොතෙමනු

කල්හි සත්ත්වයෝ පිපාසිත වෙත් ද, ඒ හදවත් වකුගඩු පපු යන මොවුන්ගේ මත්තෙහි මඳ මඳ වැහෙමින් තෙමමින් සිටියාවූ කකාරන ලද ඝනවූ ලාක්ෂාරසයට බඳු වර්ණ ඇති අක්මාවෙන් යට භාගය පුරා සිටි රැස්ව සිටිනා ලෙය ද යන මේ ද්විප්‍රකාරවූ ලෙහෙය.(24) **සෙදො**= (ගිනි අව් සන්තාප ආදියෙන් හා විෂම ඍතු ගුණාදියෙන් ද ශරීරය තැවෙන කල්හි දිගයන් නැගූ කෙණෙහිම සම නොකොට කඩන ලද නෙලුම්බුදලි පියුම් උපුල්දඬු මිටියකින් වැහෙන්නාක් මෙන් සියළු කෙශ ලොමකූපවිවරයෙන් වැහෙන්නාවූ ප්‍රසන්න තලතෙලකට බඳු වර්ණ ඇති නියත අවකාශයක් නැත්තාවූ) ඩහදිය ය;(25)**මෙදො**=(ස්ථූල ශරීර ඇත්තාහුගේ සියලු ශරීරයෙහි පැතිරී සම්, මස් අතරෙහි කසාවන් දුහුල් වස්ත්‍රයක් මෙන් පිහිටියා වූ ද, කෘශවූ ශරීර ඇත්තාහුගේ ජඞ්ඝාමාංශය කලවෙහි මාංශයපිටෙහි මාංශය උදරපටල මාංශයයන මේ මාංශයන් ආශ්‍රය කොට දෙතුන්පටක් කොට තුබූ කසාවන් දුහුල් වස්ත්‍රයක් මෙන් පිහිටියාවූ ද මෙසේ ද්විප්‍රකාරවූ) මේද නම් තෙලය. (26) **අස්සු**= (මහත්කොට සිනාසීම ද, දොම්නසින් හැඬීම ද, විෂම ආහාර ඍතුගුණ ආදියද, ධූම රජස් වැදගැන්ම ද, ඇති කල්හි ඇස්වල පුරාසිටි ප්‍රසන්න තලතෙලට බදු වර්ණ ඇතිව වැගිරෙන්නාවූ කඳුළුය; (27) **වසා**= ගිනි අව් ඍතු විෂම හා ඇතුළෙහි වන විෂභාග ධාතුය යන මෙයින් අතුල් පතුල් නාසාපුට යනාදිවූ ප්‍රදෙශයන් උෂ්ණවූ කල්හි පහන් දිය මතුයෙහි පැතුරුණු තෙලක් මෙන් ඔබිනොබ හැසිරෙන්නා වූ පොල්තෙලට බඳු වර්ණ ඇති ) වුරුණු තෙලය; (28) **ඛෙළො**= යම්කලෙක්හි ආහාරපානාදියක් දකිද්ද, සිහිකරද්ද, ලවන, තික්ත, කටුක, ආම්ලාදී යම් කිසිවක් මුඛයෙහි තබද්ද, යම්කලෙක්හි හෘදය තෙත් වේ ද. යම්කිසිවෙක්හි පිළිකුල් උපදී ද, එකල්හී දෙකපොල පාර්ශවයෙන් බැස දිවෙහි සිටියා වූ මුඛයෙහි බහාලන ලද යමක් ගඟවැල්ලෙහි සාරනලද ළිඳක දියමෙන් ක්ෂය නොවී තෙත් කරන්ට සමර්ථවූ පෙනට බඳු වර්ණඇති දිවඅග තුනීකෙළ හා දිවමුලබොල්) කෙළය. (29) **සිංඝාණිකා**= යම්සේ පුරුෂයෙක් තෙම නෙළුම්පතෙක දීකිරි බැඳ යට කටුවෙන් විදිද, ඒ සිදුරෙන් දී පෙරළී දිය ගිලිහී පිටත හෙන්නේ ද එපරිද්දෙන්ම යම්කලෙක සත්ත්වයෝ වලපිද්ද විෂම ආහාර ඍතු වශයෙන් කිපුණාවූ ධාතු ඇත්තහු වේද්ද එකල්හී හිස් ඇතුලෙන් කුණු සෙම් බවට පැමිණි හිස්මුල් ගිලිහී හිස් විවරයෙන් අවුත් තල්ල මුදුනෙන් බැස නාසාපුටය පුරාසිට තල් ලොඳකට බඳු වර්ණ ඇති ව වැගිරෙන්නාවූ) මූකුණුය හෙවත් (සොටුය).

(30) **ලසිකා**=(එක්සිය අසූවක් සන්ධීන්ගේ ඇතුළෙහි සිටිමින් ඇට සන්ධි ආලෙප කරන්නාවූ යම් බෙලසුලක් අඩුවූකල්හි නැගී සිටින්නහුගේ ද, හිඳින්නහුගේ ද, යන්නහුගේ ද, අත් පා දිගු කරන්නහුගේ ද, හකුළුවන්නහුගේ ද, අස්ථිහු "කට කට" යන ශබ්ද කෙරෙද්ද, අසුරු පහරන්නකු මෙන් ඇවිදීද, එක් යොදුන් දෙයොදුන් පමණ තැන් ගියාහුගේ වායො ධාතුව කිපේ ද, හස්ත පාදදීහු දුඃඛිත වෙද්ද, ඒ කිණිහිරි ලහටුවලට බඳු වර්ණ ඇති) සඳ මිදුලුය. (30) **මුත්‍තං**=(ඉඳුල් දිය ගැනීමලාදීන් දම්න දිය මිශ්‍ර මඩ ඇත්තාවූ ගවර වළෙක්හි ඔබතලද දියවදනා ස්වභාව ඇති, නො පෙනෙන ප්‍රවෙශමාර්ගී ඇති, පෙනෙන නික්මෙන මාර්ගී ඇති, කාලයෙක්හි ගවරවල දිය වැද සිටින්නාක් මෙන් ප්‍රවෙශවන මාර්ගී නොපෙනෙන, පෙනෙන නික්මෙන මාර්ගීයෙක් ඇති, වස්ති ගර්භ යෙහි සිටි බොහෝ සෙයින් කරදියට බඳු වර්ණ ඇති මූත්‍රය. යන මොවුහු අපි, ඇත්තාහ.

---

**උද්ග්‍රහ කෞශල්‍යය.**

---

1. වචනයෙන් කීම, 2. සිතින් සිතීම, 3. වර්ණය සැලකීම, 4. සටහන සැලකීම, 5. දිසාව සැලකීම, 6. පිහිටිතැන සැලකීම, 7. පරිච්ඡේදය සැලකීමය යි උද්ග්‍රහ කෞශල්‍යය හෙවත් භාවනාව උගෙනගැනීමෙහි දක්ෂබව හත් ආකාර වේ.

මේ පිළිකුල් භාවනාව භාවිතකරන්නහු විසින් පළමු කොට වචනයෙන් සජ්ඣායනා කටයුතු. සජ්ඣායනා කරන්නහු විසින්ද තච පඤ්චකාදිය පිරිසිඳ අනුලොම ප්‍රතිලොම වශයෙන් සජ්ඣායනා කටයුතු.

---

**තච පඤ්චකයෙහි අනුලොමය.**

---

කෙසා, ලොමා, නඛා, දන්තා, තචො,

**ප්‍රතිලොමය.**

---

තචො, දන්තා, නඛා, ලොමා, කෙසා,

**වක්ක පඤ්චකය.**

---

මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං,
වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, නහාරු, මංසං,

පපඵාස පඤ්චකය.

හදයං, යකනං, කිලොමකං, පිහකං, පපඵාසං,
පපඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං,

මත්ථලුඞ්ග පඤ්චකය.

අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුඞ්ගං,
මත්ථලුඞ්ගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං,

මෙද ඡක්කය.

පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො,
මෙදො, සෙදො, ලොහිතං, පුබ්බො, සෙම්හං, පිත්තං,

මුත්ත ඡක්කය

අස්සු, වසා, ඛෙලො, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං,
මුත්තං, ලසිකා, සිඞ්ඝාණිකා, ඛෙලො, වසා, අස්සු,

මෙසේ අනුලෝම වශයෙන් හෙවත් මුල පටන් අග දක්වා පස් දවසක් ද, ප්‍රතිලොම වශයෙන් හෙවත් අග පටන් මුල දක්වා පස් දවසක් ද, අනුලොම ප්‍රතිලොම වශයෙන් හෙවත් මුල පටන් අග දක්වා ද, අග පටන් මුල දක්වාද පස් දවසක් ද යි පසළොස් දවසක් තව පඤ්චකය සජ්ඣායනා කටයුතු.

ඉක්බිති වක්ක පඤ්චකය ද මෙසේම පසළොස් දවසක් සජ්ඣායනා කොට තචපඤ්චක, වක්ක පඤ්චක දෙක එකතු කොට ද එසේම පසළොස් දවසක් සජ්ඣායනා කටයුතු.

මෙසේ පඤ්චක ඡක්ක සය වෙන වෙන ම භාවිත කිරීමට තුන් මාසයක් ද භාවිත කරන ලද පඤ්චක ඡක්කය සමග මුල් කොටස් එකතු කොට භාවිත කිරීමට දෙමස් පසළො දවසක්ද යි පසළොස් දවසක් අඩු සමසක් මේ භාවනාව පුරුදු කිරීමට ගත කළයුතු වෙයි. පසළොස් දවස ගණනට නොගෙන සමසක් භාවිත කට යුතුය යි. පොත පතෙහි සඳහන්ව තිබේ.

1. ත්‍රිපිටක ධරයෙක් වුවත් පළමු කොට මේ භාවනාව වචනයෙන් සජ්ඣායනා කළයුතු. වචනයෙන් සජ්ඣායනා කිරීමෙන් කම්සථාන පාළිය ප්‍රගුණ වෙයි. සිත ඔබිනොබ නුදුවයි. කොටස් ප්‍රකට වෙත්. දෑ අත එක්කොට තුබූ ඇඟිලි පෙළක් මෙන් ද වැටක බැඳි මාවර පෙළක් මෙන් ද දෙතිස් කුණපයෝ මනාව වැටහෙත්.

2. යම්සේ වචනයෙන් ප්‍රගුණ කෙරේද? එසේම සිතින් සිතිය යුත්තේම ය, වචනයෙන් ප්‍රගුණ කිරීම සිතින් ප්‍රගුණ කිරීමට කාරණ වෙයි. කෙසේදයත්:- බොහෝකල් වචනයෙන් ප්‍රගුණ කරණ ලද කම්සථාන පාළිය ආවර්ජනා කොට කල්පනා කරන්නා හට මුල පටන් කෙළවර දක්වා කිසි තැනෙක නොපැකිළ නිරතුරුව වැටහෙයි. එය අනුව යාමෙන් එහි අර්ථය ද ප්‍රකට ව වැටහෙයි. සිතින් භාවනා කිරීමවූ ඒ ඒ පදයන් ගේ අර්ථ සිතින් සිතීම ඒ ඒ කොට්ඨාසයන් ගේ අශුභ ලක්‍ෂණ මෙනෙහි වීමෙන් පිළිකුල සැලකීමට කාරණ වෙයි.

3. වර්‍ණය සැලකීම නම්:- කේසාදීන්ගේ පැහැය (පාට නියම කොට කල්පනා කිරීම යි.

4. සටහන සැලකීම නම්: ඒ කේසාදීන්ගේ ආකාර මේ, මේය යි උපමාදී වශයෙන් කල්පනා කිරීමයි.

5. දිසාව සැලකීම නම්: මේ ශරීරයෙහි නාභියෙන් උඩ මතු දිසා වයි. නාභියෙන් පහල යට දිසාවයි. එහෙයින් මේ කොටස මෙනම් දිසාවෙහි පිහිටියේය යි දිසාව නියම කොට කල්පනා කිරීම යි.

6. පිහිටි තැන සැලකීමනම්: මෙනම් කොටස මෙනම් අවකාශයෙහි පිහිටියේයයි ඒ ඒ කොටස් පිහිටි තැන නියම කොට කල්පනා කිරීම යි.

7. පරිච්ඡේදය සැලකීම නම්: මේ කොටස යටද, මත්තෙහිද සරසද මෙනම් මෙනම් කොටසින් වෙන්කරණලද යි යන සමාන කොටස් වෙන් කිරීම වූ ද කෙසයෝ දෙදෙනෙක් එක්ව නොවෙත්. යනාදීන් එක එකක් වෙන් කිරීම වූද සභාග පරිච්ඡේද යද, කෙසයෝ ලෝම නම් නොවෙති. ලෝමයෝ කෙස නම් නොවෙති. යනාදීන් අසමාන කොටසින් වෙන්කිරීම වූ විසභාග පරිච්ඡේදය ද, යන පරිච්ඡේද දෙකින් නියම කොට කල්පනා කිරීමයි. මෙසේ උද්ග්‍රහ කෞශල්‍යය දතයුතුයි.

—||—

## මෙනෙහි කිරීමේ දක්‍ෂ බව.

1. පිළිවෙළින් මෙනෙහි කිරීමද,
2. ඉතා ඉක්මන්ව මෙනෙහි නොකිරීමද,
3. ඉතා සෙමින් මෙනෙහි නොකිරීමද,
4. වික්‍ෂිප්ත බව ප්‍රති බාහනය කිරීමෙන් මෙනෙහි කිරීමද,
5. ප්‍රඥප්තිය ඉක්මවීමෙන් මෙනෙහි කිරීමද,
6. අනුපිළිවෙල මිදීමෙන් මෙනෙහි කිරීමද,
7. අර්පණා වශයෙන් මෙනෙහි කිරීමද,

8. 9. 10. තුන්සූත්‍රාන්ත වශයෙන් මෙනෙහි කිරීමදැ යි මෙනෙහි කිරීමේ දක්‍ෂබව දස ආකාර වේ.

1. පිළිවෙළින් මෙනෙහි කිරීම නම්: මේ කමටහන හැදෑරීමේ පටන් එකක් හැර එකක් මෙනෙහි නො කොට අනුපිළිවෙළින් සිහිකිරීමයි.

2. ඉතා ඉක්මන්ව මෙනෙහි නො කිරීම නම්: පිළිවෙළින් මෙනෙහි කිරීමේදී වහා මෙනෙහි කිරීමෙන් කම්සථානය ප්‍රකට නොවන හෙයින් ඉතා ඉක්මන් වී සිහි නොකිරීමයි.

3. ඉතා සෙමින් මෙනෙහි නොකිරීම නම්, විශෙෂාව බොධයට කාරණ නොවන හෙයින් ඉතා ප්‍රමාද ව සිහි නොකිරීමයි.

4. වික්‍ෂිප්ත බව ප්‍රතිබාහනය කිරීමෙන් මෙනෙහි කිරීම නම්: කමටහන හැර බාහිර රූපාදී නොයෙක් ආරම්මණයෙහි සිතෙහි වික්‍ෂිප්ත බව දුරුකිරීමෙන් සිහිකිරීමයි.

5. ප්‍රඥප්තිය ඉක්මවීමෙන් මෙනෙහි කිරීම නම්; පඨවි, ආපො, තෙජෝ, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා යන වෙන් නොකළ හැකි ශුද්ධාෂ්ටක රූපයන් නිසා ලෝකයා විසින් පණවන ලද කෙස් ලොම් යනාදී ප්‍රඥප්තිය ඉක්මවා ඒ ඒ කොටස්හි පිළිකුල් වශයෙන් සිත පිහිටු වීමයි.

6. අනු පිළිවෙල මිදීමෙන් මෙනෙහි කිරීමනම්: යම් යම් කොටසක් නොවැටහෙයි ද ඒ ඒ කොටස මෙනෙහි නොකට හරින්නහු විසින් අනු පිළිවෙළ මිදීමෙන් සිහිකිරීමයි.

7. අභිඥා වශයෙන් මෙනෙහි කිරීම නම්: කෙසාදී එකි එකි කොටසෙක්හි අභිඥා (ධ්‍යානය) වන හෙයින් අභිඥා කොටස් වශයෙන් මෙනෙහි කිරීමයි.

8. 9. 10 තුන් සූත්‍රාන්ත වශයෙන් මෙනෙහි කිරීම නම්: අධිචිත්ත සූත්‍රය, සීතිභාව සූත්‍රය, බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍රය, යන තුන් සූත්‍ර වශයෙන් මෙනෙහි කිරීමයි,

8. එහි රන්කරුවකු විසින් සුවර්ණයක් ලිපතබා කලින් කල ගිනි පිඹිමය, දිය ඉසිමය, බැලීමය, යන කරුණු තුනෙන් පමණට රන්කරගන්නාක් මෙන් අධිචිත්තයෙහි යෙදුන භික්ෂුව විසින් කලින් කල සමාධි නිමිත්ත ද, වීර්‍ය්‍ය නිමිත්ත ද, උපේක්ෂා නිමිත්ත ද මෙනෙහි කිරීමෙන් සිත කර්මණ්‍ය කටයුතු බව උගන්වන සූත්‍රය අධිචිත්ත සූත්‍රයයි.

9. කාලානුරූපව සිතට නිග්‍රහ කිරීමද උත්සාහවත් කිරීමද සතුටු කිරීම ද, මැදහත්ව බැලීම ද, ප්‍රණීත අධිමුක්ති ඇතිබව ද නිර්වාණයෙහි ඇලුන බව ද, යන කරුණු සයෙන් යුත් මහණ තෙමේ ලොකොත්තරවූ සිහිල් බව ලබන්ට සමර්ථය යි වදාළ සූත්‍රය සීතිභාව සූත්‍රයයි.

10. ඉතා බුරුල්වූ වීර්‍ය්‍ය ඇති බැව් ආදියෙන් පසුබටවූ සිතට ධර්මවිචය, වීර්‍ය්‍ය, ප්‍රීති සඞ්ඛ්‍යාත බොධ්‍යඞ්ගත්‍රය වැඩීමෙන් අනුබල දීම ද, අධිකව හටගන්නා ලද වීර්‍ය්‍ය ඇතිබැව් ආදියෙන් නොසන්සුන් චිත්තය පස්සද්ධි සමාධි උපෙක්ඛා සඞ්ඛ්‍යාත බොධ්‍යඞ්ගත්‍රය වැඩීමෙන් දමනය කිරීම ද, ප්‍රඥා ප්‍රයොගය මඳ බැවින් හෝ උපසම සුවය නොලැබීමෙන් හෝ ආශ්වාද රහිත සිත ජාතිය, ජරාය, ව්‍යාධිය, මරණය, අපාය දුකය, අතීත වෘතමූලක දුකය, අනාගත වෘතමූලක දුකය, වර්තමාන ආහාර සෙවීමේ දුකය, යන අෂ්ට සංවේග වස්තු මෙනෙහි කිරීමෙන් සංවෙග කිරීම හා බුද්ධ ධම්ම, සඞ්ඝ, ගුණානුස්මරණයෙන් ඊට ප්‍රසාද ඉපදවීම ද, අරමුණෙහි සමව පැවති සමථ වීථියට පිළිපන් සිත සමව පැවති අශ්වයන් කෙරෙහි සාරථියෙකු මෙන් මැදහත්ව බැලීමද, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවට නොපැමිණි නොයෙක් කටයුත්තෙහි යෙදුන වික්ෂිප්ත සිත් ඇති පුද්ගලයන් දුරින් දුරුකිරීමද, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවට පිළිපන් සමාධිලාභී පුද්ගලයන් කලින් කල සෙවනය කිරීමද, සමාධියට නැමුන හාත්පසින් නැමුන බවද, යන සංක්ෂෙප භාවයෙන් යුක්තවූ සූත්‍රය, බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍රය යි.

මේ තුන් සූත්‍රය වීයථී සමාධි දෙදෙනාගේ සමබව යොදනු පිණිස දතයුතු, එහි විස්තර විසුද්ධිමාර්ගාදී පොත්වලින් දතයුතු.

මෙසේ සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය හෙවත් හත් ආකාර භාවනාව ඉගනීමෙහි දක්ෂබව මනාකොට ප්‍රගුණ කොට දස ආකාර මනසිකාර කෞශල්‍යය දැනගැනී මෙන් උභය කෞශල්‍යය වශයෙන් කම්මට්ඨානය වැඩිය යුතු.

මේ භාවනාව පුරුදුකරන්නහු විසින් පළමු කොට කෙසයෙහි අසුභාකාර නිමිත්ත ගතයුතු. කෙසේද යත්:— තමාගේ හිසින් කෙසයන් එකක් දෙකක් පමණ සිඳ අල්ලෙහි තබා ගෙන පළමු කොට වර්ණය නියම කටයුතු, හිසකේ කපා දැමූ තන්හිද බලන්ට වටී.

කලුකල කලුයයි මෙනෙහි කළ යුතු, සුදුකල සුදුය යි මෙනෙහි කළ යුතු, මිශ්‍ර කාලයෙහි පැසුණු නොපැසුණු කෙස් අතුරෙන් බොහෝවූවන්ගේ වශයෙන් මෙනෙහි කළ යුතු.

කෙසයන්හි යම්සේ ද එමෙන් ම සියලු තචපඤ්චකයෙහි දැකම නිමිත්ත ගතයුතු. මෙසේ නිමිත්ත ගෙන සියලු කොටස් වර්ණ සටහන්, දිසා, අවකාශ, පරිච්ඡේද වශයෙන් නිශ්චය කොට වර්ණ, සණ්ඨාන, ගන්ධ, ආසය, ඔකාස, වශයෙන් පස් ආකාරය-කින් පිළිකුල මෙනෙහි කළ යුතු.

ඒ කෙසේද යත්:— මේ කෙසයෝ නම් වර්ණ වශයෙන් ද පිළිකුල් වෙත්. සටහන් වශයෙන් ද, ගඳ වශයෙන් ද, ආශ්‍රය වශයෙන් ද, පහිටි තැන් වශයෙන් ද, පිළිකුල් වෙත්. මනොඥවූ කැඳ භාජනයක හෝ බත් බඳුනක හෝ කෙස් පැහැ වැනි කිසි-වක් දැක මෙය හිසකේ මිශ්‍රය හරිව් ය යි පිළිකුල් කෙරෙති. මෙසේ වර්ණ වශයෙන් ද පිළිකුල් වෙති. රාත්‍රියෙහි අනුභව කරන්-නහු වරා නූලක් හෝ නියඳ නූලක් ස්පර්ශ කොට මෙය කෙස් මිශ්‍රය යි පිළිකුල් කෙරෙති. මෙසේ සටහන් වශයෙන් ද කෙස-යෝ පිළිකුල් වෙති. තෙල් ගෑම් ආදී සකස්කිරීම් රහිත කෙස-යන්ගේ ගන්ධය අතිශයින් පිළිකුල් වෙයි. ඊටත් වඩා ගින්නෙහි බහාලූ කේසයන්ගේ ගඳ පිළිකුල් වේ.

කෙසයෝ වර්ණ සටහන් වශයෙන් පිළිකුල් නොවන්නාහු ද, ගඳ හෙයින් පිළිකුල් වෙති.

යම්සේ අසුචි මලමූත්‍ර කරන තැනක හටගත් පලාවගී ආශ්‍රය පිළිකුල වශයෙන් සලකා අනුභවකිරීමට නොසතුටු වේද් ද, එමෙන් කෙසයෝ ද, සැරව, ලේ, මලමූත්‍ර, සෙම, පිත, ආදීන්ගේ ආශ්‍රයෙන් උපන් හෙයින් ආශ්‍රය වශයෙන්ද පිළිකුල් වෙත්. මේ කෙසයෝ වනාහි අසුචි රැසක හටගත් පුසක් මෙන් එක්තිස් කොටස් රැසෙහි හටගත්තාහුය. ඒ කෙසයෝ සොහොන කසළ ගොඩ ආදී තැන හටගත් පලා මෙන් ද, අගල් ආදියෙහි හටගත් නෙළුම්, මහනෙල් ආදී මල් මෙන් ද, අපිරිසුදු තැන හටගත් හෙයින් අතිශයින් පිළිකුල් වෙති මෙය ඒ කෙසයන්ගේ පිහිටි තැන් වශයෙන් පිළිකුල් බවයි. කේසයන්ගේ යම්සේ ද, එපරිද්දෙන් සියලු කොට්ඨාසයන්ගේ ද වර්ණය, සටහනය, ගන්ධය, ආශ්‍රය පිහිටිතැනය, යන මොවුන්ගේ වශයෙන් පස් ආකාරයකින් පිළිකුල් බව නියම කට යුතු.

මෙසේ ම සෙසු කොට්ඨාසයන් ද වර්ණ, සණ්ඨාන, දිසා, අවකාශ, පරිච්ඡෙද, වශයෙන් නිශ්චය කොට පිළිවෙළින් මෙනෙහි කිරීම ඉතා ඉක්මන් ව මෙනෙහි නොකිරීම් ආදී දස වැදෑරුම් මෙනෙහි කිරීම් පිළිවෙළින් වර්ණය, සටහනය ගන්ධය, ආශ්‍රය, පිහිටි තැනය, යන මොවුන්ගේ වශයෙන් පස් ආකාරයකින් පිළිකුල සලකමින් භාවනා කරන්නහුගේ කේසාදී ප්‍රඥප්තිය ඉක්මවීම් වශයෙන් පවත්නා භාවනා තෙලවර දෙතිස් පැහැ ඇති පුෂ්පයන්ගේ එක් නූලක අමුණන ලද මල්මාලාවක් බලන්නාවූ පුරුෂයෙක්හට සියලු මල් පෙර පසු නුවූවාක් මෙන් යම්සේ ප්‍රකට වේද්ද, එපරිද්දෙන් ම "අත්ථි ඉමස්මිං කායෙ කෙසා –පෙ– මුත්තන්ති,, මේ කයෙහි කේසයෝ ද ඇත්තාහ, –පෙ– මූත්‍ර ද ඇතැයි යනාදීන් තමන්ගේ කය බලන්නා හට සියලු කොටස් පෙර පසු නොවූවාක් මෙන් ප්‍රකට වෙත්. ඉදින් වනාහි තමන්ගේ කයින් පිටත්හී අනික් සත්ත්වයන්ගේ කය පිළිබදව ද මෙනෙහි කෙරේ ද. ඉක්බිති ඔහට මාගේ මේ ශරීරයෙහි කේසාදී කොටස් යම්සේ පිළිකුල් වේද්ද, එසේම අනුන්ගේ කයෙහි ද සියලු කෙස් ආදී කොටස් පිළිකුල් වෙත්ය යි ප්‍රකට ව වැටහෙයි. එකල්හී ඇවිදිනා මිනිස් තිරිසන් ආදීහු සත්ත්වාකාරය හැර කොටස් රාශි වශයෙන් ම වැටහෙත්. ඔවුන් විසින් සෙවනය කරනු ලබන පැන් බොජුන් ආදිය කොටස් රාශියෙහි බහාලන ලද දෙයක් මෙන්. වැටහෙයි.

ඉක්බිති අනුපිළිවෙළ මිදීම් ආදි වශයෙන් මෙනෙහි කිරීම් පිළිවෙළින් ,,පිළිකුල් වෙත්ය,, යි නැවත නැවත තමාගේ කයෙහි

කේසාදී කොටස් මෙනෙහි කරන්නා හට පිළිවෙළින් උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත ද උපදියි.

එහි කේසාදීන්ගේ වර්‍ණ, සණ්ඨාන, දිසා, අවකාශ, පරිච්ඡේද, වශයෙන් වැටහීම උද්ග්‍රහ නිමිත්ත නම් වේ. සියලු ආකාරයෙන් පිළිකුල් වශයෙන් වැටහීම ප්‍රතිභාග නිමිත්ත නම් වේ. එය සේවනය කරන්නාහට භාවනා කරන්නාහට ප්‍රථමධ්‍යාන වශයෙන් අර්පණා උපදී යි.

යමෙක්හට එක් කොටසක් ප්‍රකට වේ ද, එක් කොටසෙක්හි හෝ අර්පණාවට පැමිණ නැවත අන්‍ය කොටසෙක්හි භාවනායොග නොකරයි ද, ඕහට එකම ධ්‍යානයක් උපදියි. යමෙක්හට නොයෙක් කොටස් ප්‍රකට වෙද්ද, එක් කොටසෙක්හි ධ්‍යානයට පැමිණ නැවත අන්‍ය කොටසෙක්හි භාවනා යොග කෙරෙයි ද, ඕහට මල්ලක සථවිරයන්ට මෙන් කොටස් ගණනින් ප්‍රථමධ්‍යානයෝ උපදිත්, මෙසේ ප්‍රථමධ්‍යාන වශයෙන් සමාධිවත්තාවූ ද. මේ කම්සථානය ස්මෘති බලයෙන් සමාධවත හෙයින් කායගතාසති යයි කියනු ලැබේ.

මෙසේ දෙතිස් කුණප කොට්ඨාසයන් පිළිකුල් වශයෙන් මෙනෙහි කිරීම සමථ භාවනාවෙහි ද, ධාතු වශයෙන් සැලකීම විදර්ශනා භාවනාවෙහි ද, ඇතුළත් වේ. සමථ විදර්ශනා දෙකට ම ඇතුළත් වූ මේ භාවනාව භාවිත කිරීමෙන් සක්කායදිට්ඨි ආදී කෙලෙස් නැසීමෙන් මාර්ග පිළිවෙළින් අමාමහ නිවන් සම්පත් අත්පත් කරගැනීම පිණිස සියලු බෞද්ධ සමූහයා විසින් උත්සාහ වැඩිය යුතු!

''තස්මා හවෙ අප්පමත්තො - අනුයුඤ්ජෙථ පණ්ඩිතො,
එවං අනෙකානිසංසං - ඉමං කායගතා සතිනති.,,

කායගතාසති භාවනාව

නි මි.

**කායගතාසති භාවනාවෙහි වර්‍ණ සණ්ඨානාදිය පහසුවෙන් දැනීම පිණිස වෙන් වෙන් කොට මෙහි දක්වනු ලැබේ.**

—||—

**තච පඤ්චකය**

**කෙසා**= කෙස්;

1. වර්‍ණය * = කළු පැහැය යි.
2. සටහන = දික්වට තරාදි දණ්ඩක් වැනිය.
3. දිශාව = උඩ දිසාවෙහි උපන්නාහුය.
4. අවකාශය = දෙකන් සිදුරු නලළ ගලවටු යෙන් පිරිසුන් හිස සමෙහි පිහිටි. යාහුය.
5. පරිච්ඡේදය = හිස සමෙහි පිහිටි යට මුල් තල යෙන් ද මතු අහසින් ද සරස ඔවුනොවුන්ගෙන් ද පිරිසුන්ය.

**ලොමා**=ලොම්;

1. කළු පිඟුවන්ය.
2. තල් මුල් බඳුය.
3. දෙදිසාවෙහි වූවාහුය.
4. අතුල් පතුල් කෙස් පිහිටි තැන් හැර අවශෙෂ ශරීරයෙහි උපන්නාහුය.
5. සිරුර සම් පිහිටි මුල් තලයෙන් ද උඩ අහසින් ද සරස ඔවුනොවුන්ගෙන් ද පිරිසුන් ය.

**නඛා**= නියපොතු;

1. සුදුය.
2. මස් කොරපොතු බඳුය.
3. දෙදිසාවෙහි වූවාහුය.
4. ඇඟිලි අග මස්පිඩු පිට පිහිටියාහ.
5. නියෙහි දෙපැත්ත සහ මුලය යන තුන් දිසාවෙහි ඇඟිලි කෙළවර මසින්ද පිටතින් හා උඩින් ආකාශයෙන්ද සරස ඔවුනොවුන් ගෙන් ද පිරිසුන්ය.

**දන්තා**= දත්;

1. සුදුය.
2. නොයෙක් සටහන්ය.
3. උඩ දිශාවෙහි වූවාහුය.
4. හනුඇට දෙකෙහි පිහිටියාහු ය.
5. හනු ඇට දෙක්හි යට මුල්තලයෙන් ද උඩ අහසින්ද සරස ඔවුනොවුන්ගෙන් ද පිරිසුන්ය.

**තචො**= සම්;

1. සුදුය.
2. ශරීරයට සිදු සටහන්ය.
3. දෙදිශාවෙහිය.
4. සියළු ශරීරය වසා සිටියේය.
5. යට පිහිටි තලයෙන් හා උඩ අහසින් ද පිරිසුන් ය.

---

* වර්ණාදී පද පඤ්චකය සෙසු කොටස් සමගද යෙදිය යුතු.

## වක්කපඤ්චකය.

**මංසං= මස්;**

1. වර්ණය = රතුපැහැය.
2. සටහන = නොයෙක් සටහන්ය.
3. දිශාව = දෙදිසාවෙහිය.
4. අවකාශය = ඇට ආලේප කොට පිහිටියේය
5. පරිච්ඡේදය = යට ඇට සැකිල්ලෙන් ද මතු සමින් ද සරස ඔවුනොවුන් ගෙන් ද පිරිසුන් ය.

**න්හාරු= නහර;**

1. සුදුය.
2. නොයෙක් සටහන්ය.
3. දෙදිසාවෙහිය.
4. සියලු ශරීරයෙහි ඇට වෑළඳ ගෙන සිටියේය.
5. යට ඇට මතුයෙහි පිහිටි තලයෙන් ද උඩ මස් සම්හි බැඳී සිටි ප්‍රදෙශයෙන් ද සරස ඔවු නොවුන්ගෙන් ද පිරිසුන් ය.

**අට්ඨි= ඇට;**

1. සුදුය.
2. නොයෙක් සටහන්ය.
3. දෙදිසාවෙහි වූවාහුය.
4. සියලු ශරීරයෙහි පිහිටියාහුය.
5. ඇතුළත ඇටමිදුලින් ද, මතු මසින් ද, අග මුල ඔවුනොවුන් ගෙන් ද පිරිසුන් ය.

**අට්ඨිමිඤ්ජා= ඇට මිදුළු;**

1. සුදුය.
2. හුන බට පුරුක්හි බහා ලූ තැම්බූ වේබඩ බදුය.
3. දෙදිසාවෙහි විය.
4. ඇට ඇතුළ පිහිටියේ ය.
5. ඇට ඇතුළ තලයෙන් පිරිසුන් ය.

**වක්කං= වකුගඩුව,**

1. මද රතුය.
2. එක නටුවෙහි වූ අඹගෙඩි දෙකක් වැනිය.
3. මතු දිසාවෙහි විය.
4. ගලවළයෙන් ආ මහනහරින් බැඳී හෘදය මාංශය වටකොට සිටියේය.
5. වකුගඩු කොටසින් පිරිසුන් ය.

## පඤ්චක පඤ්චකය.

**හදයං= හෘදය;**

1. වර්ණය = රත්පියුම් පෙත්තක පිටබඳු පැහැය.
2. සටහන = පිට පෙති ගලවා යටිකුරුව තබනලද පියුම් කැකුළක් බඳුය.
3. දිශාව = මතු දිසාවෙහි ය.
4. අවකාශය = ශරීරය තුළ දෙතන මැද පිහිටියේය.
5. පරිච්ඡේදය = හෘදය කොටසින් පිරිසුන්ය.

**යකනං=* අක්මාව;**

1. පඬුවන් පැහැය.
2. මුල එකක් ව අග දෙකක් ව කොබොලීල පත්‍රයකට බඳුය.
3. මතු දිසාවෙහි පිහිටියේ ය.
4. දෙතන මැද දකුණු පස නිසා වූයේ ය.
5. අක්මා කොටසින් පිරිසුන්ය.

**කිලොමකං= දලබුව;**

1. සුදු පැහැය.
2. පිහිටි තැන බඳුය.
3. පිළිසන් දලබුව උඩ දිසාවෙහිය. නොපිළිසන් දලබුව දෙදිසාවෙහිය.
4. පිළිසන් දලබුව හෘදය වකුගඩු වසාද, නො පිළිසන් දලබුව සියලු සිරුර සමයට මස වසාද සිටියේය.
5. යට මසින්ද මතු සමින් ද සරස දලබු කොට-සින් ද පිරිසුන් ය.

**පිහකං= බඩදිව,**

1. නිල් පැහැය.
2. සතහුල් පමණවූ කළුවස්සෙකුගේ දිවක් බඳුය.
3. මතු දිසාවෙහිය.
4. හෘදය වම්පස උදර පටලයාගේ මතු පාර්ශ්වය නිසා පිහිටියේය.
5. බඩදිව කොටසින් පිරිසුන් ය.

**පප්ඵාසං=† පපුමස;**

1. රතු පැහැය.
2. විසමකොට කැඩූ කතපූකඩක් බඳුය.
3. මතු දිසාවෙහිය.
4. ශරීරය තුළ දෙතන මැද හෘදය හා යකන මාංශය උඩින් වසා එල්බෙමින් සිටියේය.
5. පපුමස් කොටසින් පිරිසුන්ය.

---

* මීට සෑවුතු මාංශය යි ව්‍යවහාර කෙරෙති.

† පපුමස පෙනහැල්ල නමින් ප්‍රකටය.

## මත්ථලුඞ්ග පඤ්චකය

| | |
|---|---|
| **අන්තං=** බඩවැල; | 1. වණ්ණය = සුදුය<br>2. සටහන = ලේ ඔරුවක නමා තුබූ හිස් සුන් සර්පයෙකු බඳුය.<br>3. දිසාව = දෙදිසාවෙහිය.<br>4. අවකාශය = ගලවළු මලමාගී කෙළවර කොට ඇති ශරීරයතුළ පිහිටියේය.<br>5. පරිච්ඡේදය = අතනු කොටසින් පිරිසුන්ය. |
| **අන්තගුණං=** අතුණුබහන්; | 1. සුදු පැහැය.<br>2. හෙල් මැලි මූල් බඳුය.<br>3. දෙදිසාවෙහිය.<br>4. එක්විසි බඩවැල් දරණයන්ගේ අතර බැඳගෙන සිටියේ ය.<br>5. අතුණු බහන් කොටසින් පිරිසුන්ය. |
| **උදරියං=** උදරයෙහි වූ ආහාර; | 1. අනුභව කළ ආහාරයට බඳු පැහැය.<br>2. පෙරහන්කඩක බුරුල්කොට බඳනාලද සහල් වැනීය.<br>3. ඔතු දිශාවෙහිය.<br>4. උදර පටල යෙහි පිහිටි යේය.<br>5. උදර පටල යෙන්ද උදරිය භාගයෙන්ද පිරිසුන්ය. |
| **කරීසං=** මල; | 1. අනුභව කළ ආහාරයට බඳු පැහැය.<br>2. පිහිටි තැන බඳුය.<br>3 යට දිසාවෙහිය.<br>4. පක්වාශයෙහි පිහිටියේය.<br>5. පක්වාශ පටල යෙන් හා මල කොටසින් පිරිසුන්ය. |
| **මත්ථලුඞ්ගං=** හිස්මොල; | 1. සුදු පැහැය.<br>2. පිහිටි තැන බඳුය.<br>3. මතු දිසාවෙහිය.<br>4. හිස් කබලතුළ පිටි පිඩු සතරක් මෙන් පිහිටියේය.<br>5. *හිස් කබල ඇතුළ තලයෙන්ද මොල කොටසින්ද පිරිසුන්ය. |

## පඨවිධාතු

* අන්‍ය එක්තිස් කොටසින් අමිශ්‍රවූ වෙනම කොටසකැයි සැලකීම විභාග පරිච්ඡේදයයි. සියලු තැන මෙම ක්‍රමයෙන් විභාග පරිච්ඡේදය දතයුතුයි.

## මේද ජකකය.

**පිත්තං – පිත**

1. වර්ණය = බද්ධ පිත ඝන මීතෙල් පැහැය යි. අබද්ධ පිත මලානික රණවරා මල් පැහැයයි.
2. සටහන = පිහිටි තැන් බදුය.
3. දිසාව = බද්ධ පිත උඩ දිසාවෙහිය. අබද්ධ පිත දෙදිසාවෙහිය.
4. අවකාශය = අබද්ධ පිත කෙස්, ලොම්, නිය, දත්, තද වියලි සම්හැර ඉතිරි ශරීරයෙහි ද බද්ධපිත පිත් කොෂයෙහි ද සිටියේය.
5. පරිච්ඡේදය = පිත් කොටසින් පිරිසුන් ය.

**සෙම්හං = සෙම;**

1. කැලිය පත් යුෂ බදු වර්ණය.
2. පිහිටි තැන් බදුය.
3. මතු දිසාවෙහිය.
4. උදර පටලයෙහි සිටි යේය.
5. සෙම් කොටසින් පිරිසුන්ය.

**පුබ්බො = සැරව;**

1. පඬුවන් පත්‍රයකට බදු වර්ණය.
2. පිහිටි තැන් බඳුය.
3. දෙදිසාවෙහිය.
4 ලේ පැසවූ තැනසිටි යි.
5. සැරව කොටසින් පිරිසුන්ය.

**ලොහිතං = ලේ;**

1. ලාකඩ වර්ණය.
2 පිහිටි තැන බඳුය.
3. රැස්ව සිටි ලෙය උඩ දිසා වෙහිය ගමන් කරන ලෙය දෙදීසාවෙහිය.
4. ගමන් කරන ලෙය සියලු කම්ජ ශරීරයෙහි ද රැස්ව සිටි ලෙය යකෘත මාංශයටද පිහිටි යේය.
5 ලේ කොටසින් පිරිසුන්ය.

**සෙදො = ඩහදිය;**

1. පැහැදිලි තලතෙල් පැහැය.
2. පිහිටි තැන බඳුය.
3. දෙදිසාවෙහිය.
4. කේශ ලෝමකූපයන් පුරා සිටියි.
5. ඩහදිය කොටසින් පිරිසුන්ය.

**මෙදො = මෙද තෙල්;**

1. කහ පාටය.
2. කහපාට රෙද්දක් බඳුය.
3. දෙදිසාවෙහිය.
4. සථූලතැනැත්තාගේ සියළු සිරුර පැතිර ද කෘශ තැනැත්තාගේ කෙණ්ඩා මස් ආදියෙහිද සිටියේය.
5. යටින් මයින් ද උඩින් සමින් ද සරස මේද කොටසින් ද පිරිසුන් ය.

## මුත්ත ඡක්කය.

**අස්සු= කඳුළු;**

1. වණ්ණය = පැහැදිලි තලතෙල් වණ්ණය.
2. සටහන = පිහිටි තැන බඳුය.
3. දිශාව = මතු දිසාවෙහිය.
4. අවකාශය = අක්ෂි කූපයන්හි පිහිටියේය.
5. පරිච්ඡේදය = කඳුළු කොටසින් පිරිසුන්ය.

**වසා= වුරුණු තෙල්;**

1. පොල් තෙල් පැහැය.
2. නහන කල දියපිට විසිරෙන තෙල් බිඳු බඳු සි
3. දෙදිසාවෙහිය.
4. අල්ල පිටි අල්ල පත්ල පිටි පත්ල නාසා පුට නලළ අංශ කූටයන්හි ද සිටියේය.
5. වසා කොටසින් පිරිසුන්ය.

**ඛෙළො= කෙල;**

1. සුදු පැහැය.
2. පිහිටි තැන බඳුය.
3. මතු දිසාවෙහිය.
4. දෙ කපොලින් බැස දිවෙහි සිටියේය.
5. කෙල කොටසින් පිරිසුන්ය.

**සිඞ්ඝානිකා= සොටු;**

1. තල් ලොඳ බදු වණ්ණය.
2. පිහිටි තැන බඳුය.
3. මතු දිසාවෙහිය.
4. නාස් සිදුරු පුරා සිටියේය.
5. සොටු කොටසින් පිරිසුන්ය.

**ලසිකා= සඳ මිදුළු;**

1. කිණිහිරි ලාටු පැහැය යි.
2. පිහිටි තැන බඳුයි.
3. දෙදිසාවෙහිය.
4. ඇට සන්ධි ඇතුළත සිටියේය.
5. සඳ මිදුලු කොටසින් පිරිසුන්ය.

**මුත්තං= මූත්‍ර;**

1. උඳු අළු දිය බඳු පැහැය.
2. මුතින් නැමූ කලයක ඇතුළත ජලය බඳුවෙයි
3. යට දිසාවෙහිය.
4. වස්ති කොෂය තුළ සිටියේය.
5. වස්ති ඇතුළතින්ද මූත්‍ර කොටසින්ද පිරිසුන්ය

### ආපො ධාතු

ධාතු කම්සථාන යෙහි හිස් මොළ බහා කේසාදී විසි කොටස් පෘථිවි ධාතු වශයෙන් ද පිත සෙම ආදී දොළොස් කොටස් ආපො ධාතු වශයෙන්ද සන්තාප ජිරණ දහ පාචක යන කොටස් සතර තෙජො ධාතු වශයෙන් ද උඩ්ඩගම අධොගම කුච්ඡිසය කොට්ඨා-ශය අඞ්ග මඞ්ගානු සාරි අස්සාස පස්සාස යන කොටස් හය වායො ධාතු වශයෙන් දැයි දෙසාළිස් (42) ආකාරයකින් ධාතු සතර උගෙන ගත යුතු වෙත්.

තෙජො ධාතු කොටස්හි යම් තෙජො ධාතුවක් කිපීමෙන් සත්ත්ව තෙමේ තැවේද, ජ්වර රොගාදී සභාව යෙන් හටගත් උණු සුම් ඇත්තේ වේද, එය සන්තාප තෙජො ධාතු නම්. යම් තෙජො ධාතුවකින් ශරිරය දිරවයිද, ඉන්‍ද්‍රිය විකල බවටද, බල පිරිහීමටද ඇඟ රැළි වැටීම් ආදියට ද, පැමිණෙයි ද, එය ජිරණ තෙජො ධාතු නම්. යම් තෙජො ධාතුවක් කිපීමෙන් ශරීරය දවනු ලැබේද, ඒ පුද්ගල තෙමේ ද "දනුලබම්" "දනුලබම්" හඬමින් ගිතෙල් සඳුන් තල් වැට පවන් ආදිය කැමති වේද, එය දහ තෙජො ධාතුනම්. යම් තෙජො ධාතුවකින් අනුභව කරණ ලද දෑ ආදිය මනාව මුහු කිරීමට යේද, එය පාචක තෙජො ධාතුනම්.

වායො ධාතු කොටස්හි තැලි නැගීම් වමන ආදිය උපදවන උඩට නගින වාතය තෙම උඩ්ඩගම නම්. මළ මූත්‍ර ආදිය බැහැර කරන යට බස්නා වාතය තෙම අධොගමනම්. බඩවැල පිටතවූ වාතය තෙම කුච්ඡිසය නම්. බඩවැල තුළ පවත්නා වාතය තෙම කොඨාසය නම්. නහර වැල් අනුව යාමෙන් සියලු ශරීරයෙහි කුඩා මහත් අවයවයන් අනුව ගියාවූ අත පය හැකිළීම් දිග ඇරීම් ආදිය උපද වන වාතය අඞ්ගමඞ්ගානුසාරි නම්. ශරීරය තුළට ප්‍රවිෂ්ට වන නාසිකා වාතය අස්සාස නම්. පිටත නික්මෙන නාසිකා වාතය පස්සාස නම්. මෙසේ මේ සතර මහාභූත-යන් ඉගෙන එය පරිග්‍රහ කරන්නාහට උපාදා රූපය ප්‍රකට වෙයි. සතර මහා භූත රූපය උපාදා රූපයෙන් පරිසිඳිනු ලද්දේය. උපාදා රූපය මහා භූත රූපයෙන් පිරි සිඳිනු ලද්දේය.

යම්සේ අච්ච සෙවනින් ද සෙවන අච්චෙන් ද පිරි සිඳන ලදද, එපරිද්දෙන් මහා භූත රූපය උපාදා රූපයෙන් ද, උපාදා රූපය මහා භූත රූපයෙන් ද පිරි සිඳින ලදි. මෙසේ සතර මහා භූත රූපයෝද තෙවිසි උපාදානරූපයෝ ද රූපස්කන්ධ යයි. රූපස්කන්ධය පරිග්‍රහකරන්නාහට ආයතනද්වාරවශයෙන් අරූපස්කන්ධයෝ ප්‍රකට වෙත්. නාම රූපපරිග්‍රහය පඤ්චස්කන්ධයෝ වෙත්. පඤ්චස්කන්ධයෝ ද්වාදසායතනයෝ වෙත්. ද්වාදසායතනයෝ අටළොස් ධාතූහු වෙත් ය යි ස්කන්ධායතන ධාතු වශයෙන් තිඹුල් තල් කඳක් පළන්නාක්හු මෙන් දෙකොටසක් කොට නාමරූප ව්‍යවස්ථා කෙරෙයි. හෙතෙම මේ නාමරූපය හේතු රහිතව ප්‍රත්‍යය රහිතව උපන්නේ නොවෙයි. හේතු ප්‍රත්‍යය සහිතව උපන්නේය.

ඊට හේතුප්‍රත්‍යය කවරේදැයි පරීක්ෂා කරන්නේ අවිද්‍යා තෘෂ්ණා කර්ම ආහාරය යි ඊට ප්‍රත්‍යය ව්‍යවස්ථා කොට අතීත යෙහිද, ප්‍රත්‍යයෝද ප්‍රත්‍යය යෙන් උපන් ධර්මයෝද වූහ. අනාගත යෙහි ද, වර්තමාන යෙහි ද ප්‍රත්‍යයෝද, ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝද වෙත්. ඉන් මතුයෙහි සත්ත්වයෙක් හෝ පුද්ගල යෙක් හෝ නැත්තේය. අමිශ්‍ර සංස්කාර රාශියමය යි තුන් කල්හි සැක දුරුකෙරෙ යි. මේ සංස්කාරයන් සැලකීම වූ විදර්ශනා .තොමෝ ඥාත පරිඥා නම්, මෙසේ සංස්කාරයන් සලකා සිටි භික්ෂුව සර්වඥ ශාසනයෙහි බැසගත් මුල් ඇත්තෙක් වෙයි. නියත ගතිකවූ චූල සෝතාපන්න නම් වේයයි අටුවාවෙහි දක්වන ලදී.

—||—

ඉක්බිති දත්, සම්, මස්, නහර, ඇට යන මේ කොටස්වල විශෙෂ සටහන් ද දක්වනු ලැබේ.

දත් අතුරෙන් මැද දත් සතරක් මැටි පිඩෙක්හි පිළිවෙළින් හිඳුවනලද ලබු බිජු වැනි සටහන් ඇත්තාහුය. ඔවුන්ගේ දෙපසෙහි එකි එකී දතක් එක එක මූලක් ඇත්තේ එක එක කෙළවරක් ඇත්තේ ඉද්දමල් කැකුළකට බඳු සටහන් ඇත්තේය. එයට ඉක්බිති එක එක දතක් දෙමූලක් හා දෙකෙළවරක්

ඇත්තේ ගැල් ධූරයෙහි අවුලුවන වහල් දඬුවට බඳු සටහන් ඇත්තේය. එයට ඉක්බිති දත් දෙකක් දෙකක් තුන් තුන් මුල් ඇත්තාහු වෙත්. එයට ඉක්බිති දත් දෙකක් දෙකක් සතර සතර මූලක් ඇත්තාහු සතර සතර කෙළවරක් ඇත්තාහු වෙත් මතු දත් පෙළෙහි ද මෙම ක්‍රමයයි.

සම් අතුරෙන් පය ඇඟිලි සම පටපණු කැදැල්ලකට බඳු සට-හන් ඇත්තේය. පිටිපතුල් සම සපත්තුය සි ව්‍යවහාරවූ නැලි වහ-නකට බඳු සටහන් ඇත්තේය. සිහින් හකුල් සම බත්මුලක් බැඳි තල්පතකට බඳු සටහන් ඇත්තේය. කලවා සම සහල් පිරූ දික් පසුම්බියකට බඳු සටහන් ඇත්තේය. ආනිසදයෙහි හෙවත් හිඳිනා ස්ථානයෙහි සම දිය පිරූ පෙරහන්කඩකට බඳු සටහන් ඇත්තේය. පිටසම පුවරුවක වහාලූ සම් කඩකට බඳු සටහන් ඇත්තේය. බඩසම වීණා දෙනක [illegible] සමකට බඳු සටහන් ඇත්තේය. ළෙහි සම බොහෝසෙයින් සිවුරැස් සටහන් ඇත්-තේය. දෙඅත සම හියවුරෙහි එබූ සමකට බඳු සටහන් ඇත්-තේය. පිටිඅලු සම හැඳි කොපුවකට බඳු සටහන් ඇත්තේය. අත ඇඟිලි සම යතුරු පසුම්බියකට බඳු සටහන් ආත්තේය. කරසම ගෙල සැට්ටයකට බඳු සටහන් ඇත්තේය. මුහුණ සම කුඩා මහත් සිදුරු ඇති පණු කැදැල්ලකට බඳු සටහන් ඇත්තේය. හිස සම පාත්‍රා පසුම්බියකට බඳු සටහන් ඇත්තේය.

මාංශයන් අතුරෙන් සිහින් සකුලෙහි පිඩුමස තල්පතක බැඳි බත් මුලකට බඳු සටහන් ඇත්තේය, කලවා මස අත්ගලකට බඳු සටහන් ඇත්තේය, ආනීසද මාංශයෙහි හෙවත්හිඳිනා ස්ථානයෙහි මස මැටිපිඩින් කළ ලිප් කෙළවරකට බඳු සටහන් ඇත්තේය, පිටිමස පැදුරෙහි වනා වියලාගත් තල්හකුරු පටලයකට බඳු සටහන් ඇත්තේය, දෙපස ඉළඇට අතුරෙහි පිහිටි මස පෙනැලි රූකඩ කුසෙක තුනී කොට ඇල්වූ මැටියකට බඳු සටහන් ඇත් තේය. තන මස කෙළින් සිට බිමහෙළූ කෙත් මැටිපිඩකට බඳු සටහන් ඇත්තේය. දෙඅත් දඬුමස හිස වල්ගා සිඳ සම උගුලා දෙපට කොට තැබූ මහමියෙකුට බඳු සටහන් ඇත්තේය.

නහර අතුරෙන් මහ නහරයෝ කැණහිල්ල මල් කැකුළු බදු සටහන් ඇත්තාහුවෙති. ඒ ඒ ශරීර ප්‍රදේශයෙහි පැතිර සිටි මහ නහරට වඩා සියුම්වූ සෙසු නහරවැල් හුරෝද්දට බදු සටහන් ඇත්තාහ. එයට වඩා සියුම් වූ සෙසු නහරවැල් කිඳි වැලට බදු සටහන් ඇත්තාහ. එයට වඩා සියුම් නහරවල් මහා වීණා තත් බඳු සටහන් ඇත්තාහ එයට වඩා සියුම්වූ සෙසු නහරවැල් දළ නුල් බදු සටහන් ඇත්තාහ. අතුල් පතුල් පිට නහරවැල් පක්ෂීන්ගේ පියවරට බඳු සටහන් ඇත්තාහ. පිට නහරවැල් අව්වෙහි දිගහරිනලද නෙත් දැලකට බදු සටහන්ඇත්තාහ. හිස නහරවැල් ළදරුවන්ගේ හිස්වසන දැලකට බදු සටහන් ඇත්තාහ. සෙසු ඒ ඒ අඞ්ගප්‍රත්‍යඞ්ග අනුව ගිය නහරවැල් ශරීරයෙහි බහාලූ ඉහිදූල් සැට්ටයකට බඳු සටහන් ඇත්තාහුය.

ඇට අතුරෙන් පයැඟිලි අග පුරුක් ඇට ඉඟීනි ඇට බදු සටහන් ඇත්තාහ. ඊට ඉක්බිති මැද පුරුක් ඇට කොස් ඇට බදු සටහන් ඇත්තාහ. මුල පුරුක් ඇට පණා බෙරට බඳු සටහන් ඇත්තාහ. පිටි පතුල් ඇට තැළු කැනහිල්ල අල රැසකට බඳු සටහන් ඇත්තාහ. විලුම් ඇට එක් ඇටක් ඇති තල්ගෙඩි මදට බදු සටහන් ඇත්තාහ. ගොප් ඇට හුයින් එක්කොට බඳනාලද කෙළිනාවට සඟලකට බදු සටහන් ඇත්තාහ. සිහිල් කකුල් ඇටයන් ගේ ගොප් ඇට පිහිටිතැන පතු නොහල ඉඳි බඩකට බදු සටහන් ඇත්තාහ. සිහින් දඟ ඇට කුඩා දරුවන් කෙළනා කුඩා දුනු දණ්ඩකට බදු සටහන් ඇත්තාහ. මහ ඇට වැරීගිය සපුන්ගේ පිට බදු සටහන් ඇත්තාහ. දණ ඇට එක් පාර්ශවයකින් පිරී ගෙවීගිය පෙණ පිඩකට බදු සටහන් ඇත්තාහ. ඒ දණ ඇටයෙහි සිහින් දඟ ඇට වැද සිටි තැන ඉතා හුල්වූ අක් ඇති ගෙරි අඟකට බදු සටහන් ඇත්තාහ. කලවා ඇට නපුරුකොට සස්නා ලද වැ පොරෝ මිටි දඬුවකට බදු සටහන් ඇත්තාහ. ඒ කලවා ඇටයෙහි කටි ඇට පිහිටි සථානය කෙළනා පන්දුවකට බදු සටහන් ඇත්තාහ. ඒ කලවා ඇටින් කටි ඇට පිහිටි තැන මුහුණත කැපූ මහ දෙඹ පලයකට බඳු සටහන් ඇත්තාහ. එක්ව බැඳීව පිහිටි කටියෙහි ඇටයෝ දෙදෙන කුඹල් උදුනකට බදු සටහන්

ඇත්තාහ. ඒ ඇටයෝ වෙන වෙනම කඹුරන්ගේ යකුලෙහි බැඳී වළලු බඳු සටහන් ඇත්තාහ. දඟ ඇටයන් ගේ ගොප් ඇට කොළවර පිහිටි නිතම්බ ප්‍රදෙශයෙහි ඇට යටිකුරු කොට ගන්නා ලද සැළි පෙණයකට බඳු සටහන් ඇත්තාහ. සත්තැනෙක කුඩා මහත් සිදුරු ඇත්තේය. පිටකටු ඇට ඇතුළතින් මතු මත්තෙහි හකුළුවා තැබූ ඊයම් පටකට බඳු සටහන් ඇත්තාහ. පිටතින් හිඳිපත් වැලකට බඳු සටහන් ඇත්තාහ. ඒ පිටකටු ඇටයන් ගේ අතරතුර කියත් දැති බඳු වූ දෙතුන් කටු කොනෙක් ඇත්තාහු වෙති. සුවිසි ඉළ පරළ ඇට අතුරෙන් නොපිරිපුන් ඇට නොපිරිපුන් දූ කැති බඳු සටහන් ඇත්තාහ පිරිපුන් ඇට පිරිපුන් දෑකැති බඳු සටහන් ඇත්තාහ. ඒ සියලු ඇට ඇළී කුකුළෙකුගේ විදහාගත් පියාපතුන්ට බඳු සටහන් ඇත්තාහ. ළෙහි ඇට තුදුස දිරා ගිය රිය පඳුරකට බඳු සටහන් ඇත්තේය. හෘදය ඇට හැඳි උතුවලකට බඳු සටහන් ඇත්තේය. අකැ ඇටයෝ කුඩා ලෝවැ මිටි දඹුවට බඳු සටහන් ඇත්තාහ. පතු ඇට හෙවත් කොෂ්ටයෙහි ඇට එක් පසෙකින් ගෙවුනා වූ හෙළදිව හුදැල්ලකට බඳු සටහන් ඇත්තාහ. බාහුවෙහි ඇට කැටපත් මිටකට බඳු සටහන් ඇත්තාහ. අග්‍ර බාහුවෙහි ඇට යුග්මතාල ස්කන්ධයකට බඳු සටහන් ඇත්තාහ. අත්කර ඇට එක්කොට අලවා තුබූ හැකුලුණු ඊයම් පටකට බඳු සටහන් ඇත්තාහ. පිටි අත්හි ඇට තැළු කැණිහිල්ල අල රැසකට බඳු සටහන් ඇත්තාහ. අතැ'ගිළි මුල පුරුක් ඇට පණා බෙරයකට බඳු සටහන් ඇත්තාහ. මැදි පුරුක් ඇට නොපිරිපුන් කොස් ඇට බඳු සටහන් ඇත්තාහ. අක්පුරුක් ඇට ඉඟිනි ඇට බඳු සටහන් ඇත්තාහ. උගුරු ඇට සත දඹුයෙක පිළිවෙළින් අවුනා තිබූ වටකොට කැපූ හුණ කිළිල් මදයකට බඳු සටහන් ඇත්තාහ. යට හනු ඇටය කඹුරන්ගේ යකුලක බැඳී වළල්ලකට බඳු සටහන් ඇත්තේය. මතු හනු ඇටය උක්දඬු සස්නා සැතකට බඳු සටහන් ඇත්තේය. ඇස්වළ නැහැවළ ඇට ලොඳ හල ලා තල්ගෙඩියකට බඳු සටහන් ඇත්තේය. නළල් ඇට යටබලා තැබූ සක්තලු කබලකට බඳු සටහන් ඇත්තාහ. කන්සිල ඇට කරනැවැමියන්ගේ කරකොපුවකට බඳු සටහන්

ඇත්තාහ. නලල් ඇටෙන් හා කන්සිල් ඇටෙන් මත්තෙහි නලල් පට බඳනා අවකාසයෙහි ඇට තෙලැති පූසාඬකට බඳු හටහන් ඇත්තේය. මූදුන් ඇටය මූහුණත සැපූ ඇද පොල් ගෙඩියකට බදු සටහන් ඇත්තේය. හිස් ඇට මසා තුබු දූදිරි ලබුකබලකට බදු සටහන් ඇත්තාහ යි දතයුතු.

**විශෙෂ සටහන් නිමවන ලදි.**

—||—

මෙසේ විශෙෂ සටහන්ද තේරුම් ගැනීමෙන් උද්ග්‍රහ කෞශල්‍ය සම්පාදනය කරන්නහු විසින් කායගතාසති කම්මට්ඨානය පටික්කූල මනසිකාර වශයෙන් හෝ ධාතු මනසිකාර වශයෙන් හෝ වැඩිය යුතු. මුල සඳහන් වූ ලෙස මෙය වැඩීමෙන් සක්කාය දිට්ඨි ආදී කෙලෙස් ගිනි නිවා ගැනීමෙන් අජරාමර සඞ්ඛ්‍යාත නිර්‍වාණ සම්පත්ති ප්‍රතිලාභය පිණිස සියලු සැදූහැවත්හු උත්සාහ වඩත්වා!

**පමුණුවේ බුඩදත්ත සාමීන් විසින්**

ලියන ලද

**සංවර සීල දීපනී පරිශිෂ්ට සංග්‍රහය**

නිමවන ලදී.

---

**නිබ්බානස්ස පච්චයො හොතු !!!**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු